# සමාජ විද්‍යාව

## මූලික පිරිවෙණ

## ගුරු මාර්ගෝපදේශය

## 4 ශ්‍රේණිය

**(2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)**

**පිරිවෙන් අධ්‍යාපන ශාඛාව**
**අධ්‍යාපන අමාත්‍යාංශය**
**ශ්‍රී ලංකාව**

**පිරිවෙන් අධ්‍යාපන ඒකකය**
**සිංහල භාෂා දෙපාර්තමේන්තුව**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් ලිපිනය : info@nie.lk

වෙබ් අඩවිය : www.pirivena.sch.lk
විද්‍යුත් ලිපිනය : Pirivena@moe.gov.lk

මුද්‍රණය හා බෙදාහැරීම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

සමාජ විද්‍යාව

මූලික පිරිවෙණ

ගුරු මාර්ගෝපදේශය

4 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය : 2020

© ජාතික අධ්‍යාපන ආයතනය

© පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය

ISBN 978 - 955 - 25 - 0570 - 6

පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.pirivena.sch.lk

විද්‍යුත් ලිපිනය : pirivena@moe.gov.lk

පිරිවෙන් අධ්‍යාපන ඒකකය

සිංහල භාෂා දෙපාර්තමේන්තුව

භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk

**විද්‍යුත් ලිපිනය** : info@nie.lk

මුද්‍රණය:

සිසාරා ප්‍රින්ට්වේ ප්‍රයිවට් ලිමිටඩ්
නො. 110, පාගොඩ පාර,
පිටකෝට්ටේ.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ශ්‍රී ලාංකීය බෞද්ධ ජාතික අනන්‍යතාවයේ සංකේතය භික්ෂූන් වන්සේය. භික්ෂූන් වහන්සේගේ අධ්‍යාපනය කේන්ද්‍ර කර ගනිමින් සමස්ත ජාතියටම අධ්‍යාපනික මංපෙත විවර කර දුන් ජාතික පිරිවෙන් අධ්‍යාපනයට දුරාතීතයක් ඇත. අනුරාධපුර යුගයේ සිටම භික්ෂූන් වහන්සේගේ නායකත්වය යටතේ පිරිවෙන් අධ්‍යාපනය කෙතරම් සුභුඹුල්ව වැඩී ගියාද කිවහොත් විදේශිකයන් පවා මෙරටට පැමිණ අධ්‍යාපනය හදාළ බව පුරාවෘත්තවලින් පැහැදිලි වේ.

වර්තමානය වනවිට පාසැල් අධ්‍යාපනය හා සමාන පහසුකම් ලබමින් විහාරස්ථාන කේන්ද්‍ර කොටගත් පිරිවෙන් ආයතන අධ්‍යාපන අමාත්‍යාංශයේ නියාමනය යටතේ සිය අතීත උරුමයන් එලෙසින් ම ආරක්ෂා කරගනිමින් පවත්වා ගැනීමට ලැබීම අපගේ සතුටට කරුණකි.

පිරිවෙන් අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් ලබා දෙමින් කාලීන අවශ්‍යතා සපුරා ගැනීමට සුදුසු වියත් යතිවර පරපුරක් හා උගත් විනයවත් ගිහි සමාජයක් බිහිකරලීම අපගේ පරම අභිලාෂය විය යුතුය. එයට ශක්තියක් වෙමින් 2018 නව විෂයමාලා සංස්කරණය යටතේ ඔබ අතට පත් කෙරෙන මෙම ගුරුමාර්ගෝපදේශය නව ඉගෙනුම් ක්‍රම ඔස්සේ ශිෂ්‍යයාට අවශ්‍ය දැනුම ලබාදීම සඳහා පාරිවේණාචාර්යවරයාට ආධාරකයක් වනු ඇතැයි අපගේ විශ්වාසයයි. මෙය මැනවින් පරිශීලනය කර නිවැරදි අවබෝධයක් ශිෂ්‍ය ප්‍රජාවට ලබාදීම පරිවේණාචාර්යවරුන් වන ඔබගේ වගකීමක් සේ දකිමි.

මෙම භාරදූර කාර්ය සම්පූර්ණ කිරීම සඳහා ඇපකැපවූ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවට, ජාතික අධ්‍යාපන ආයතනයට හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට මාගේ හෘදයාංගම ස්තුතිය පළකරමි.

**එන්.එච්.එම්. චිත්‍රානන්ද**
අධ්‍යාපන ලේකම්

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ශාඛාව මගින් සම්පාදනය කර තිබූ විෂය නිර්දේශයේ අන්තර්ගතය සංශෝධනය කිරීමෙන් පසු අදාළ නිපුණතා සාක්ෂාත් වන පරිදි පාඩම් සැලසුම් කිරීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ අභිනවයෙන් පිහිටුවන ලද පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කර ඇත.

පාසල් පද්ධතියේ ක්‍රියාත්මක වන පරිදි ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරුවරුන්ට ද ලබා දී ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය උසස් මට්ටමකට ගෙන ඒම සඳහා සැලසුම් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය ගත් යහපත් තීරණයකි. ඒ වෙනුවෙන් අපගේ ස්තුතිය හිමි වන අතර ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරීමෙන් එම තීරණය යථාර්ථයක් බවට පත් විය.

සාම්ප්‍රදායික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පමණක් සීමා නො වී නව ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවේශ පිළිබඳ ව යොමු වීමට මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත උපදෙස් පිරිවෙන් ගුරුවරුන්ට උපකාර වනු ඇත. ඒ අනුව නව ප්‍රවේශ හා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ ව ගවේෂණය කර තම පාඩම් සැලසුම් කර ගැනීමෙන් ඉහළ ගුණාත්මක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට හැකියාව ලැබේ.

මෙහි අන්තර්ගතය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම් විෂය නිර්දේශය සහ එහි නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට උපකාර වන ක්‍රියාකාරකම් සංග්‍රහය යි. එක් එක් නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් ආවරණය වන ආකාරයට ඉගෙනුම් පල සාක්ෂාත් වන පරිදි ඒ සඳහා වෙන් කර ඇති කාලය ද සැලකිල්ලට ගෙන ක්‍රියාකාරකම් සමූහය නිර්මාණය කර ඇත. ක්‍රියාකාරකම් පදනම් කර ගෙන නව ක්‍රියාකාරකම් නිර්මාණය කර ගැනීමට ද මෙමගින් අවකාශය ලැබෙනු ඇත.

ඉතා කෙටි කාලයකින් මූලික පිරිවෙන් විෂයමාලවෙහි සියලු විෂයයන් සඳහා ගුරු මාර්ගෝපදේශ සකස් කිරීමට ශාස්ත්‍රීය නායකත්වය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ පිරිවෙන් අධ්‍යාපන ඒකකයටත් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය විශේෂඥයන්ට මෙන් ම බාහිර සම්පත් දායකයන්ටත් මාගේ ස්තුතිය පිරිනැමේ.

**ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරවදන

පිරිවෙන් ශ්‍රී ලාංකීය අධ්‍යාපනයේ කේන්ද්‍රස්ථානයකි. මිහිඳු මහ රහතන් වහන්සේ ශ්‍රී ලංකා ධරණිතලය තුළ ස්ථාපිත කළ උතුම් සම්බුද්ධ ශාසනය යුග යුග පසුකර නොයෙක් බාධා හමුවේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙත අවිච්ඡින්නව දායාද කරමින් ධර්මඥානයෙන් පිරිපුන් යතිවර පරපුරක් හා දෑ හිතකාමී ජන සමාජයක් පිරිවෙන මගින් නිර්මාණය කිරීමට භික්ෂූන් වහන්සේලා සමත් වූහ.

අතීතයේ පටන් ම කාලීන අවශ්‍යතා සපුරාලමින් හා සාම්ප්‍රදායික අනන්‍යතාව ආරක්ෂාකර ගනිමින් ගිහි පැවිදි සමාජයේ අභිවෘද්ධිය වෙනුවෙන් පිරිවෙන මගින් සිදු වූ මෙහෙය අනුපමේය ය. සම්භාව්‍ය අධ්‍යාපනය ආරක්ෂාකර ගනිමින් පාරම්පරික ශාසනික ක්‍රමවේද හා නූතන අධ්‍යාපන රටා මනාව සම්මිශ්‍රණය කර වර්තමානයේ පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි සිසුන්ගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන අද වන විට නිපුණතා පාදකව නව විෂයමාලාවක් ඔස්සේ අවශ්‍ය දැනුම ලබාදීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව දරන ප්‍රයත්නය අතිශයින් අගය කරමු. එයට ශක්තියක් වෙමින් සියලු ම විෂය සඳහා නව විෂය නිර්දේශ මුද්‍රණය කරවීම හා මූලික පිරිවෙන සඳහා පෙළපොත් 54ක් වාර්ෂික ව මුද්‍රණය කර ලබා දීම මගින් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය පහසුකම් සලසා ඇත.

නිපුණතා පාදකව නව විෂය මාලාව සඳහා ගුරු මාර්ගෝපදේශ සැකසීම පිරිවෙන් අධ්‍යාපනය වෙනුවෙන් පළමු වරට සිදුවන උසස් ක්‍රියාදාමයකි. ජාතික අධ්‍යාපන ආයතනය හා පිරිවෙන් අධ්‍යාපන ශාඛාව එක්ව සම්පාදනය කළ මෙම ගුරු මාර්ගෝපදේශ, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට ලැබීම සතුටට කරුණකි. මෙම කාර්යය සඳහා දායකත්වය සැපයූ උපදේශක, සංස්කාරක, ලේඛක මණ්ඩල සාමාජික සියලු දෙනාට ද අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට ද මගේ ස්තුතිය පිරිනමි. පිරිවෙන් අධ්‍යාපනයේ ඉදිරි දියුණුව ද පතමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල
2020.06.26

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

නූතන ලාංකීය පිරිවෙන් ක්ෂේත්‍රයෙහි මෙම ගුරු මාර්ගෝපදේශ බිහිවීම ඓතිහාසික අවස්ථාවක් බව මම පළමු ව සඳහන් කරමි. ජාතික අධ්‍යාපන ආයතනයත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අංශයත් සුසංයෝග වී මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනය වීම ඊට හේතුව යි.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පාසල් අධ්‍යාපනය සඳහා විෂය නිර්දේශ, ගුරු මාර්ගෝපදේශ, ගුරු පුහුණු, අධ්‍යාපන කළමනාකරුවන් පුහුණු කිරීම සහ අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීමේ ව්‍යවස්ථාපිත බලය ඇති එක ම ආයතනය 1985 අංක 28 දරන පනතින් ස්ථාපිත වූ ජාතික අධ්‍යාපන ආයතනය යි. එහෙත් මේ වන විට වසර 2325ක ඉතිහාසයක් ඇති මහා විහාරයීය අධ්‍යාපන සම්ප්‍රදායේ කේන්ද්‍රස්ථානය වූ 'පිරිවෙණ'ට ව්‍යවහාර වර්ෂ 2017 තෙක් ජාතික අධ්‍යාපන ආයතනයේ ඍජු දායකත්වයක් නො තිබිණ.

පිරිවෙන් අංශයක්/දෙපාර්තමේන්තුවක් නොමැති ජාතික අධ්‍යාපන ආයතනයක් තිබිය හැකි දැයි නිතර අපව පෙළන ලද කරුණකි. මෙයට විසඳුමක් ලබා ගැනීම සඳහා අපට දායක වීමට හැකි වූයේ වර්තමාන අතිගරු ජනාධිපතිතුමන්, ගරු අධ්‍යාපන ඇමතිතුමන්, 2018 වර්ෂයේ කටයුතු කළ අධ්‍යාපන ලේකම්තුම න් එවකට පිරිවෙන් අධ්‍යක්ෂ ස්වාමීන්ද්‍රයාණන්, ජාතික අධ්‍යාපන ආයතනයේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්තුමිය සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ පූර්ණ අනුග්‍රහය හා ආශිර්වාදය ලැබීමෙනි.

ඒ අනුව අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ජනවාරි මස 31 දින රැස් වූ ජාතික බෞද්ධ බුද්ධි බල මණ්ඩලයේ තීරණය පරිදි සහ ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාවේ 2017.03.16 දිනැති 412.5.12 IM No.5157 තීරණය පරිදි ජාතික අධ්‍යාපන ආයතනයේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවට අයත් ව පිරිවෙන් ඒකකය ස්ථාපිත විය.

එහි ප්‍රතිඵලයක් ලෙස පිරිවෙන් ගුරු මාර්ගෝපදේශ, පිරිවෙන් ගුරු පුහුණුව සිදු කිරීමේ කාර්යයන්ට දායක වීමට ජාතික අධ්‍යාපන ආයතනයට ඍජුව හැකි විය. ජාතික අධ්‍යාපන ආයතනය සතු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද පිළිබඳ පළපුරුදු බව, පර්යේෂණ, අත්දැකීම්, තාක්ෂණික ප්‍රාගුණ්‍යය සුසංයෝග කර ගනිමින් පිරිවෙන් පන්ති කාමරයෙහි අවදිමත් බවක් ඇති කිරීමට ලද මෙම අවස්ථාව මහාර්ඝ භාග්‍යයකි. අප්‍රමාණ සතුටකි.

පිරිවෙන්හි ගුරු භවතුන් මෙම ගුරු මාර්ගෝපදේශ පරිශීලනයෙන් පිරිවෙන් පන්ති කාමරය ශිෂ්‍ය මිත්‍රභාවයෙන් ප්‍රබෝධාත්මකව ඉහළ සාධනයකට පිරිවෙන් අධ්‍යාපනය නංවාලීමට කටයුතු කරන ලෙස ගෞරවයෙන් ආයාචනා කරමි. මෙම ගුරු මාර්ගෝපදේශ සම්පාදනයට දායක වූ ජාතික අධ්‍යාපන ආයතනයේ සිංහල භාෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, පිරිවෙන් ඒකක ප්‍රධාන සහ සියලු විද්වතුනට ගෞරවය පිරිනමමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

## පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය

පෙරදිග ලෝකයේ පැවති ඉතා ප්‍රශස්ත අධ්‍යාපන ආයතන අතර පිරිවෙණට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. මෙම අධ්‍යාපන ආයතන ක්‍රමයෙන් වැඩී ගොස් ජාත්‍යන්තර විශ්වවිද්‍යාල මට්ටමට සංවර්ධනය වූ බව නොරහසකි. ශ්‍රී ලාංකීය භික්ෂු අනන්‍යතාව හා දේශීය ජන විඥානය පුබුදුවාලීමට එදා සිට අද දක්වාම පිරිවෙන් අධ්‍යාපනය සමත් වී ඇත. අෂ්ට මූලායතන කේන්ද්‍ර කරගත් අතීත පිරිවෙන් අධ්‍යාපනය ආධ්‍යාත්මික ගුණයෙන් මෙන්ම ධර්මඥානයෙන්ද හෙබි පරපුරක් මෙරටට දායාද කළේ ය.

නූතන පිරිවෙන් අධ්‍යාපනය ජාතික අධ්‍යාපන ප්‍රවාහයේ තවත් එක් සුවිශේෂී පැතිකඩකි. පර්යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධශාසනෝන්නතිය උදෙසා අවශ්‍ය භික්ෂූන් වහන්සේ ජාතියට දායාද කිරීම හා උගත් වියත් බුද්ධිමත් පිරිසක් බිහිකිරීම පිරිවෙන් අධ්‍යාපනයේ ප්‍රමුඛ අභිලාෂය යි.

සෞභාග්‍යමත් දේශයක් කරා යන මේ ගමනේදී ආකල්ප සම්පත්තියෙන් යුතු ප්‍රජාවක් නිර්මාණය කිරීමට මග පෙන්වීම භික්ෂූන් වහන්සේගේ ප්‍රබල වගකීමකි. ඒ සඳහා උන්වහන්සේලා අවශ්‍ය දැනුම් සම්භාරයක් පෝෂිත කරවීමට පිරිවෙණ පෙරටත් වඩා ශක්තිමත්ව ක්‍රියාත්මක විය යුතුය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය යාවත්කාලීන කරමින් නව විෂය නිර්දේශයන් යටතේ ඉදිරි පියවර රාශියක් තැබීමට අපට හැකිවීම සතුටට හේතුවකි. විවිධ උපාය මාර්ගයන් ඔස්සේ ඉදිරි අනාගත පිරිවෙන් අධ්‍යාපනය ශක්තිමත් කිරීමට අප ගන්නා උත්සාහයේදී ඔබ අතට පත් කෙරෙන නව ගුරු මාර්ගෝපදේශය ශිෂ්‍ය සාධනය ඉහළ මට්ටමකට ඔසවා තැබීමට ප්‍රබල ගුණාත්මක යෙදවුමක් වනු ඇතැයි මාගේ විශ්වාසයයි. සාම්ප්‍රදායික ඉගෙනුම් ක්‍රම මෙන් ම නූතන ඉගෙනුම් ක්‍රමවේද පිළිබඳව ද පරිවේණාචාර්යවරුන්ගේ දැනුම යාවත්කාලීන කරගනිමින් ක්‍රියාකිරීම ඔබ සතු වගකීමක් බව ද අවධාරණය කරමි. ගුරු මාර්ගෝපදේශය මැනවින් අධ්‍යයනය කර ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට මෙය මැනවින් භාවිත කර ගන්නා ලෙසද සිහිපත් කරමි.

මෙවන් ගුරුමාර්ගෝපදේශයක් සකස්කර ඔබ අතට පත්කිරීම ඉතා භාරධූර ක්‍රියාවලියකි. මේ සඳහා මූලිකව ක්‍රියාකළ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ විෂය සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ටත්, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියටත්, නියෝජ්‍ය අධ්‍යක්ෂ හිමියන්ටත්, පිරිවෙන් ශාඛා ප්‍රධානී හිමියන් හා අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්තුමන් ප්‍රධාන කාර්ය මණ්ඩලයට ද පිරිවෙන් අධ්‍යාපන ශාඛාව වෙනුවෙන් ගෞරවනීය ප්‍රසංසාව පිරිනමමින් ආශිර්වාදය මෙසේ පළකරමි.

**පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි**
පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

# ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය

| | | |
|---|---|---|
| **උපදේශකත්වය හා අනුමැතිය** | : | ජාතික අධ්‍යාපන ආයතනය සහ පිරිවෙන් අධ්‍යාපන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය |
| **මෙහෙයවීම** | : | පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි<br>අධ්‍යක්ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| | | ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **අධීක්ෂණය** | : | ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම<br>අධ්‍යක්ෂ<br>සිංහල භාෂා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සම්බන්ධීකරණය** | : | පූජ්‍ය කුකුරම්පොල ඤාණවිමල හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ඒකක ප්‍රධාන<br>පිරිවෙන් අධ්‍යාපන ඒකකය<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| | | පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විෂය නියාමනය** | : | ගමගේ විකුම් සම්පත්<br>සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වෛකල්පික විෂය)<br>පිරිවෙන් අධ්‍යාපන ශාඛාව<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| **විෂය විශේෂඥ උපදේශනය** | : | ඒ. කේ. ජී. ජයසිංහ<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (විශ්‍රාමික)<br>රුහුණු විශ්වවිද්‍යාලය |
| | | පූජ්‍ය උඩුගම්පොළ ගුණානන්ද හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය |
| **ලේඛක මණ්ඩලය** | : | ඩබ්. ඒ. කේ. සුදර්ශනී<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව<br>ජාතික අධ්‍යාපන ආයතනය |

ගමගේ විකුම් සම්පත්
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

පූජ්‍ය ඇලදුවේ පඤ්ඤාතිලක හිමි
නියෝජ්‍ය පරිවෙණාධිපති
කො/සුනේත්‍රාදේවී පිරිවෙණ, පැපිලියාන

පූජ්‍ය ගල්ගමුවේ ගුණරතන හිමි
පරිවේණාචාර්ය
ශ්‍රී රතනපාල පිරිවෙණ,
මීගහගොඩ, පැල්මඩුල්ල

පී. ජී. ජයන්ත ආනන්ද
පරිවේණාචාර්ය
කෑ/ශ්‍රී විද්‍යාමංගල මහ පිරිවෙණ
මංගලගම, මොළගොඩ

එම්. ඩී. අකිල රත්නකුමාර
පරිවේණාචාර්ය
කු/ප්‍රඥානන්ද මූලික පිරිවෙණ
මාහරගම, ගිරිඋල්ල

පූජ්‍ය උඩුගම්පොල ගුණානන්ද හිමි
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය

පූජ්‍ය කෙහෙල්වල විපස්සි හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**භාෂා සංස්කරණය** : පූජ්‍ය රත්මලවිට චන්දානන්ද හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ත්‍රිපිටක ධර්මය)
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව
අධ්‍යාපන අමාත්‍යාංශය

**සෝදුපත් කියවීම** : ආචාර්ය කුඹල්ගොඩ ධම්මාලෝක හිමි
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්)
පිරිවෙන් අධ්‍යාපන ඒකකය
ජාතික අධ්‍යාපන ආයතනය

**පරිගණක වදන්** : එල්. ඒ. සඳුනි නිලංකා පත්මසිරි
පරිගණක අංශය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**පිටකවර නිර්මාණය** : තරිඳු හසංග
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (පරිගණක විද්‍යාව),
පිරිවෙන් අධ්‍යාපන ශාඛාව

# හැඳින්වීම

දර්ශනය, නීතිය, ආගම, ආර්ථිකවිද්‍යාව, මනෝවිද්‍යාව, දේශපාලනවිද්‍යාව ආදී වශයෙන් වන අනෙකුත් සියලු සමාජීය විද්‍යා ගණයට අයත් විෂයයන් බිහි වී භාවිතයට ගැනෙමින් පැවති ශාස්ත්‍රීය ලෝකයට, තව දුරටත් පුරවා ගත යුතු ඉතා වැදගත් හිදැසක් ඇති බව කාර්මීකරණයත් සමග ම ගොඩ නැගෙන නව සමාජ පරිසරයෙහි උද්ගත වන්නට විය. 19 වැනි සියවසේ මැද භාගය වන විට එකී අවශ්‍යතාව ඉතාමත් දැඩිව දැනෙන්නට විය. ඒ මත ගොඩ නැගුණු දිගු කාලීන සංවාදයේ ප්‍රතිඵලයක් ලෙස මෙකී අඩුව පුරවාලීම සඳහා යෝග්‍ය විෂයයන් ලෙස යෝජනා රැසක් ඉදිරිපත් වූයේ ය. එහෙත් අවසානයේ ඒ අතරින් ශාස්ත්‍රීය ලෝකය තුළ පිළිගැනීමට ලක් වූයේ ප්‍රංශ ජාතික දාර්ශනිකයෙකු වූ ඔගස්ට් කොම්ට් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව යි. ඒ වන විට යුරෝපාකරයේ අළුතින් බිහි වූ කාර්මික හා නාගරික සමාජ ඇසුරෙහි උද්ගත වෙමින් පැවති විවිධාකාර ආගන්තුක අභියෝග තේරුම් ගැනීමට වඩාත් යෝග්‍ය නව විෂය ලෙස ඔගස්ට් කොම්ට් විසින් යෝජනා කරන ලද්දේ "සමාජවිද්‍යාව" (Sociology) යන්න යි. මනුෂ්‍ය ශරීරය අධ්‍යයනය කිරීම සඳහා ජීවවිද්‍යාව (Biology) යම් සේ වැදගත් වන්නේ ද ඒ තරමට ම සමාජය නමැති සිරුර අධ්‍යයනය කිරීම සඳහා සමාජ විද්‍යාව වැදගත් වන බව එහි දී කොම්ට් විසින් පෙන්වා දෙන ලදි.

මිනිසාගේ සමස්ත සමාජ චර්යාව විද්‍යාත්මකව අධ්‍යයනය කරන විෂය සමාජ විද්‍යාව යි. ඒ අනුව කවර හෝ සමාජයක් පිළිබඳ පරිපූර්ණ අධ්‍යයනයක යෙදෙන්නට හැකි එක ම විෂය වන්නේ සමාජ විද්‍යාව බව කොම්ට්ගේ තර්කය වන්නේ ය. සමාජ විද්‍යාව නමැති විෂයයේ සැබෑ කාය‍ර්භාරය දෙස බලන විට කොම්ට් විසින් ඉදිරිපත් කරන ලද මෙම තර්කය බැහැර කළ නොහැකි වේ.

සමාජීය සත්ත්වයෙකු ලෙස සෑම මනුෂ්‍යයෙකුට ම තමා සාමාජිකත්වය දරන සමාජය පිළිබඳ මෙන් ම එයින් බැහැර ලෝක සමාජය පිළිබඳව ද මනා අවබෝධයක් තිබිය යුතු වේ. එසේ නොවන තැන සමාජයේ පාර්ශ්වයෙන් සාමාජිකයාට ලබා දිය යුතු සෙවන හා රැකවරණය නොලැබෙන්නට හෝ අඩුපාඩු සහගත වන්නට පුළුවන. අනෙක් අතට සාමාජිකයාගේ පාර්ශ්වයෙන් සමාජය උදෙසා ඉටු විය යුතු අනුපමේය මෙහෙවර මගහැරී යනු නොඅනුමාන ය. මේ අනුව පැහැදිලි වන්නේ සාමාජිකයා සමාජය මත මෙන් ම අනෙක් අතට සමාජය සාමාජිකයා මත රඳා පවතින බව යි. සමාජයක් යනු මෙම අන්‍යොන්‍ය ගනුදෙනුවේ අවසන් ප්‍රතිඵලය යි. මෙය සර්ව විශ්වීය හා සර්ව කාලීන වශයෙන් එක හා සමානව වලංගු යතාර්ථයකි. කවර හෝ සමාජයක ජීවත් වන සෑම සාමාජිකයෙකු ම මෙම යතාර්ථය පිළිබඳ මනා අවබෝධයකින් යුක්ත විය යුතු ය. සමාජයේ මෙන් ම සාමාජිකයාගේ ප්‍රගමනය යතාර්ථයක් බවට පත් වන්නේ එවැනි අවබෝධයකින් යුක්ත වන්නේ නම් පමණි. මේ අනුව පිරිවෙන් අධ්‍යාපනය සඳහා යොමු වන සිසුනට ලබා දෙනු ලබන සමාජවිද්‍යා විෂය දැනුම පැවිදි හෝ ගිහි ප්‍රභේදයකින් තොරව කෙතරම් වැදගත් වන්නේ ද යන්න මනාව තහවුරු වේ.

ඉහත දක්වන ලද කෙටි හැඳින්වීම දෙස අවධානයෙන් බලන විට, සමාජවිද්‍යා විෂය ක්ෂේත්‍රය කෙතරම් සංකීර්ණ එකක් වන්නේ ද යන්න තේරුම් ගැනීමට අපහසු නොවනු ඇත. මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමෙන් අපේක්ෂා කරනු ලබන්නේ, දෙවන වසර (හතර ශ්‍රේණිය) සිසුනට ඉගැන්විය යුතු විෂය කරුණු නිර්දේශ කිරීම හා එහි දී ගුරුවරයා කවර මට්ටමකට සීමා විය යුතු ද යන්න නිශ්චය කර දීම ය. පාඩම් 7ක් යටතේ සැලසුම් කරන ලද මෙම මාර්ගෝපදේශය මගින් ඉගැන්විය යුතු විෂය කරුණු නිර්දේශ කරන අතර ම ශිෂ්‍යයා මෙන් ම ගුරුවරයා ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සක්‍රීය සාමාජිකයෙකු බවට පත් කිරීමට පොලඹවනු ලැබේ. ඒ ශිෂ්‍යයාට වුවමනා දැනුම සම්පාදනය කර දීම සඳහා ගුරුවරයාට ද නිරතුරුව සිය විෂය දැනුම යාවත්කාලීන කර ගැනීමට සිදුවන හෙයිණි. එමෙන් ම නිර්දේශිත ආකෘතියට අනුව ඉගැන්වීමෙහි නියැලෙන ගුරුවරයා ද රාජකාරිමය ආතතියෙන් තොර, විවිධත්වයෙන් හෙබි අතිශය තෘප්තිමත් සමාජ මෙහෙවරක යෙදෙන්නෙකු බවට පත් වනු ඇත. එහි අවසන් ප්‍රතිඵලය ලෙස වර්තමානයට වඩා සශ්‍රීක ගුරු පරපුරක් අනාගතයේ දී අපේක්ෂා කළ හැකි බවට පුරෝකථනය කිරීමට ද අවකාශයක් ඇත. එසේ වන්නේ විෂයයෙහි සක්‍රීය භූමිකාවක් රඟ දක්වන ගුරුවරයා පර්යේෂණාත්මක ලිපි ලේඛන මෙන් ම පොත් පත් ද සම්පාදනය කිරීමට පෙලඹෙනු ඇති හෙයිණි.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

පිරිවෙන් අධ්‍යාපනය යටතේ සමාජ විද්‍යාව විෂය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හඳුන්වා දීම පිරිවෙන් අධ්‍යාපන කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමේ ඉදිරි පියවරක් ලෙස දකිමි. මෙහි දී නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රියාවලියකට අවතීර්ණ වීම ද තවත් විශේෂ පියවරකි.

විෂය අන්තර්ගතයට අදාළව නිපුණතා සැලසුම් කර ඇත. එහි දී ප්‍රධාන නිපුණතාවයක් කරා ළඟා වීමට හැකි වන පරිදි නිපුණතා මට්ටම්වලට පෙළගස්වනු ලැබ ඇත. එමෙන් ම ඒ සඳහා පාදක වන සිදුවීම් හා සම්බන්ධ ක්‍රියාකාරකම් ද හඳුන්වා දී ඇත. එමගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයාට නිවැරදි මග පෙන්වීම කිරීමට ද ශිෂ්‍යයට තම සාධනීය මට්ටම කරා ළඟාවීමට ද වඩාත් පහසු වනු ඇත.

වඩා කාර්යක්ෂම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක අග්‍රඵලය වන්නේ දැනුම, කුසලතා, ආකල්ප හා ජීවන පුරුදුවලින් පිරි පුරවැසියෙකු බිහි වීම ය. එනම් නිපුණතාවක් ලෙස අප අපේක්ෂා කරනුයේ දැනුම, කුසලතා, ආකල්ප තුළින් හටගත් ජීවන හුරුපුරුදු ය. ඒ අනුව නිපුණතා මට්ටමට එළඹීම සඳහා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන සංකල්පය පෙරටු කර ගනිමින් පාඩම් සැලසුම් කිරීමට ද අවධානය යොමු කර ඇත. මෙහි දී සාකච්ඡා, කණ්ඩායම් ක්‍රියාකාරකම්, ගවේෂණය, විවාද, කථන අවස්ථා ආදි ඉගෙනුම් ක්‍රම භාවිතයෙන් පාඩම් අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය පරිදි මග පෙන්වා ඇත.

ඇගයීම හා තක්සේරුකරණය යටතේ අපේක්ෂිත මට්ටම කරා ශිෂ්‍යයාට ළඟා වීමට මෙන්ම ගුරුවරයාට පරීක්ෂා කර බැලීමට ද ඉඩ සලසා දී ඇත.

මේ අනුව මෙම ගුරු මාර්ගෝපදේශය නිපුණතා පාදකව, ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමවේද ඇසුරින්, වඩාත් ඵලදායී මෙන් ම කාර්යක්ෂම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සඳහා මග පෙන්වා ඇත.

මෙම විෂය නිර්දේශය යාවත්කාලීන කරනු ලැබ ඇති හෙයින් ඇතැම් පාඩම් සඳහා අවශ්‍ය විෂය කරුණු පෙළපොතෙහි ඇතුළත්ව නැත. එහෙයින් එම විෂය කරුණු ඇමුණුම් ලෙස මෙහි ඇතුළත් කර ඇත. මෙතැන් සිට පවත්වනු ලබන පරීක්ෂණවලදී එකී විෂය කරුණු ද සැළකිල්ලට ගෙන ප්‍රශ්න පත්‍ර සකසනු ලැබේ. එහෙයින් පන්ති කාමරයේ දී එකී විෂය කරුණු ද ඉගැන්වීමට ගුරුවරයා සැළකිලිමත් විය යුතු ය.

- විෂයමාලා කමිටුව -

# පටුන


- අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය III
- අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය IV
- පෙරවදන V
- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය VI
- පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පණිවිඩය VII
- ගුරු මාර්ගෝපදේශ සම්පාදක මණ්ඩලය VIII - IX
- හැඳින්වීම X
- ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් XI
- සමාජ විද්‍යාව 4 ශ්‍රේණිය - වාර නියමය XIII
- විෂය නිර්දේශය - 4 ශ්‍රේණිය XIV
- පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු XV
- ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ජාතික පොදු අරමුණු XVI
- මූලික නිපුණතා XVII - XVIII
- සමාජ විද්‍යාව විෂයයේ අරමුණු XIX
- විෂය නිර්දේශය - 4 වන ශ්‍රේණිය XX - XXXIII
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් XXXIV

1. සමාජ විද්‍යාව හැඳින්වීම 01 - 30
2. සමාජ පරිණාමය 31 - 49
3. සංස්කෘතිය 50 - 66
4. පුද්ගලයා හා සමාජය 67 - 81
5. සමාජ පාලනය 82 - 93
6. සමාජ ගැටලු 94 - 107
7. සමාජ අධ්‍යයනය පිළිබඳ සමාජ විද්‍යාත්මක ප්‍රවේශය හඳුනා ගැනීම 108 - 123

## සමාජ විද්‍යාව 4 ශ්‍රේණිය - වාර නියමය

| වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද |
|---|---|---|
| I | 1.1, 1.2, 1.3, 1.4<br>2.1, 2.2, 2.3, 2.4 | 24 |
| II | 3.1, 3.2, 3.3. 3.4<br>4.1, 4.2, 4.3, 4.4<br>5.1, 5.2, 5.3 | 27 |
| III | 6.1, 6.2, 6.3, 6.4<br>7.1, 7.2, 7.3 | 20 |

# සමාජ විද්‍යාව

## විෂය නිර්දේශය

## 4 ශ්‍රේණිය

**(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

## පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ හා අරමුණු

2. (අ) භික්ෂූන් වහන්සේලාට, සහ

(ආ) පිරිවෙනක පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීමට කැමැත්තෙන් සිටින්නා වූ ද බෞද්ධ පරිසරයක ස්වකීය අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන්නා වූ ද වයස අවුරුදු දහහතර ඉක්ම වූ ගිහි පිරිමි ශිෂ්‍යයන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණු වන්නේ ය.

3. (අ) පරියත්ති, පටිපත්ති, පටිවේධ යන ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය කෙරෙහි භික්ෂූන් වහන්සේලා අතර උනන්දුවක් ඇති කිරීම.

(ආ) සැරියුත් මහ මුගලන් තෙර පරපුරෙන් පැවත එන සඟ පරපුර අවිච්ඡින්න ව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය විනය, ත්‍රිපිටක ඥානය, ධර්ම ගරුක බව භික්ෂූන් වහන්සේලා අතර ඇති කිරීම.

(ඇ) දේශීය සහ විදේශීය ධර්මදූත මෙහෙයෙහි මෙන් ම භික්ෂූන් වහන්සේලාට යෝග්‍ය වෙනත් සේවාවන්හි නිරත වීම සඳහා අවශ්‍ය ප්‍රයෝගික දැනුම සඳහා ශික්ෂණයක් දීම, සහ

(ඈ) බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය, බෞද්ධ ඉතිහාසය, සිංහල, පාලි, සංස්කෘත ඇතුළු භාෂාන්තර හා විෂයාන්තර පිළිබඳ ගැඹුරු දැනීමක් ලබා ගැනීම සඳහා භික්ෂූන් වහන්සේලාට පහසුකම් සලසා දීම, පිරිවෙන් අධ්‍යාපනයේ පරමාර්ථ වන්නේ ය.

**(1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනත)**

## ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ජාතික පොදු අරමුණු

(I) සෑම (ළමයෙකුටම) දෙනාටම පාසල් අධ්‍යාපනයට ඇති සර්ව සහ සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම.

(II) සංස්කෘතික විවිධත්වය හඳුනා ගනිමින් ජාතික සහජීවනය පෝෂණය කිරීම, ජාතික අඛණ්ඩතාව සහ ජාතික සමගිය වර්ධනය කිරීම තුළින් මව්බිමට ආදරය, ගෞරවය හා කැපවීමෙන් යුතු ශ්‍රී ලාංකික පුරවැසියෙකු නිර්මාණය කිරීම.

(III) දේශීය හා ගෝලීය අභියෝගයන්ට ප්‍රතිචාර දක්වමින් ජාතියේ සංස්කෘතික හා පාරිසරික උරුමයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම.

(IV) නිර්මාණශීලිත්වය, නවෝත්පාදනය සහ විචක්ෂණශීලී චින්තනය සහිත ඵලදායී පුද්ගලයින් නිර්මාණය කිරීම.

(V) තෘප්තිමත් ජීවන රටාවකට අවශ්‍ය ශාරීරික, මානසික සහ ආධ්‍යාත්මික යහපැවැත්ම පුද්ගලයන් තුළ ප්‍රචලිත කිරීම.

(VI) ගෝලීය ප්‍රවණතාවන්ට සරිලන පරිදි සමාජ, ආර්ථික හා සංස්කෘතික උන්නතිය සඳහා දැනුම, කුසලතා, ආකල්ප සහ මානව ගුණාංග සංවර්ධනය කිරීම.

(VII) මානව හිමිකම්, රටේ නීතිය හා යුතුකම් සහ වගකීම්වලට ගරු කරන, සමාජ සාධාරණත්වය හා ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවකට අවශ්‍ය සාධක නිර්මාණය කිරීම හා ඒ සඳහා අනුබල දීම.

(VIII) සංකීර්ණ හා අනපේක්ෂිත තත්වයන්ට මුහුණ දීම සඳහා වෙනස්වීම් කළමනාකරණය සහ ඉගෙනුමට ඉගෙනීමේ පුද්ගල හැකියාවන් සංවර්ධනය කිරීම.

**(ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව - 2019)**

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු කර ගැනීමට දායක වනු ඇත.

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධානව ඇහුම්කන් දීම, පැහැදිලිව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදිව සහ නිරවුල්ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ අවකාශය හා කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගලපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළදී ද පෞද්ගලික ජීවිතයේදී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

(II) පෞරුෂ වර්ධනයට අදාළ නිපුණතා

» නිර්මාණශීලීබව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය,
» කණ්ඩායම් හැගීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතාඃ
» ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
» චිත්තවේගී බුද්ධිය.

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරයට : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැගීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය ශාක, සත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදීබව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට එවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිකලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාවන් ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සදහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගුවේ.

(IV) වැඩ ලෝකයට සුදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝගතා හඳුනා ගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම, සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍ය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකිරණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදීව හා සාර්ථකව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීනව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම. ( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තතාව)

## සමාජ විද්‍යාව විෂයයේ අරමුණු

මූලික පිරිවෙන් විෂය මාලාවේ වෛකල්පික විෂයයක් ලෙස සමාජ විද්‍යාව තුන්වන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා උගන්වනු ලැබේ. මේ විෂය අධ්‍යයනය කිරීමෙන් පහත සඳහන් අරමුණු සිසුන් සාධනය කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

01. යහපත් සමාජ සම්බන්ධතා ගොඩනගා ගැනීමට අවස්ථාව උදා වීම.

02. පවුලේ/ පන්සලේ/ පිරිවෙනේ සාමාජිකයෙකු වශයෙන් තමාගෙන් සමාජයටත්, සමාජයෙන් තමාටත් ඉටු විය යුතු යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳ දැන ගැනීම.

03. නිවැරදි ජීවන අරමුණු පෙරදැරිව යමින් ජීවිතය ජය ගැනීම.

04. සමාජ වෙනස්වීම හඳුනා ගෙන ඒ සඳහා බලපාන සාධක අධ්‍යයනය කිරීමට පෙලඹීම.

05. තම අනන්‍යතාව රැක ගනිමින් සමාජයට පිවිසීමේ අවශ්‍යතාව අවබෝධ කර ගැනීම.

06. ශ්‍රී ලාංකික සමාජයේ පවතින සුවිශේෂ වූ සංස්කෘතික ලක්ෂණ හඳුනා ගෙන ක්‍රියා කිරීමට අවස්ථාව උදාකර ගැනීම.

07. බුදු දහම ඇසුරේ ශ්‍රී ලාංකික සමාජය  පරිවර්තනය වූ ආකාරය අධ්‍යයනය කිරීමට හැකියාව ලැබීම.

08. සමාජ පාලනයට හේතුවන සාධක හඳුනා ගෙන ඒ ඒ සාධකවල වටිනාකම ඇගයීම.

09. සමාජ ප්‍රශ්න/ ගැටලු හඳුනා ගෙන ඊට සාධාරණ විසඳුම් සෙවීමේ අවස්ථාව උදාකර ගැනීම.

10. සමාජය අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ක්‍රම වේදයක් පවතින බව දැන ගැනීම.

## විස්තරාත්මක විෂය නිර්දේශය - 04 ශ්‍රේණිය - සමාජ විද්‍යාව

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1.0 සමාජ විද්‍යාත්මක දැනුම අනුසාරයෙන් සමාජය තේරුම් ගනියි. | 1.1 සමාජ විද්‍යාව නිර්වචන ඇසුරින් අර්ථ දක්වයි. | • සමාජ විද්‍යාව අර්ථ දැක්වීම | • සමාජ විද්‍යාව පිළිබඳ ඉදිරිපත් කර ඇති නිර්වචන විස්තර කරයි.<br>• විවිධ අර්ථ නිරූපනවලට සාපේක්ෂව සමාජය දෙස බැලීමට ඇති හැකියාව තහවුරු කරයි.<br>• සමාජ විද්‍යාව මිනිසාගේ සමාජ ජීවිතයේ සෑම අංශයක්ම අධ්‍යයනය කරන බව හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• සමාජ විරෝධි චර්යා කෙරෙහි පදනම් වන සමාජීය සාධක අධ්‍යයනය මගින් සමාජ ගැටලු අවබෝධ කරගත හැකි බව පෙන්වා දෙයි. | 02 |
| | 1.2 සමාජ විද්‍යාව බිහි වූ බටහිර සමාජ පසුබිම අධ්‍යයනය කොට අවබෝධය ලබා ගනියි. | • සමාජ විද්‍යා විෂය බිහිකළ තත්කාලීන බටහිර සමාජය | • සමාජ විද්‍යාව බිහි වූ බටහිර සමාජය අධ්‍යයනය කරයි.<br>• 19වන ශතවර්ෂය වන විට යුරෝපා සමාජයෙන් ප්‍රකට වන විශේෂතා හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• 19වන සියවසේ බටහිර සමාජ විපර්යාසයන්ට බලපෑ විවිධ හේතූන් පැහැදිලි කරයි.<br>• කාර්මීකරණය නිසා බටහිර සමාජ ව්‍යුහය විපර්යාසයට ලක් වූ ආකාරය අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 1.3 සමාජ විද්‍යාවේ සුවිශේෂ බව වටහා ගනියි. | • ස්වභාවික විද්‍යා හා සමාජීය විද්‍යා අතර සමාජ විද්‍යාවේ සුවිශේෂතාව | • සමාජ විද්‍යාව හා සමාජීය විද්‍යා අතර වෙනස තේරුම් ගෙන පැහැදිලි කරයි.<br>• එක් එක් විද්‍යාවන්ගෙන් සමාජ විද්‍යාව වෙනස් වන ආකාරය කරුණු දක්වමින් පැහැදිලි කරයි.<br>• සමාජ විද්‍යාවට ආවේණික ගති ලක්ෂණ පෙළගස්වමින් ඉදිරිපත් කරයි.<br>• ස්වභාවික විද්‍යා යන්න අර්ථ කථනය කරයි. | 02 |
| | 1.4 බෞද්ධ සමාජ විද්‍යාත්මක චින්තනය විමර්ශනය කරයි. | • බෞද්ධ සමාජ චින්තනය පිළිබඳ අවබෝධය | • බුදු දහම සහ සමාජ විද්‍යා මූලධර්ම අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරයි.<br>• යහපත් අන්තර් සම්බන්ධතා ගොඩ නගා ගැනීමට උපකාරී වන කරුණු සූත්‍ර ඇසුරින් විස්තර කරයි.<br>• සමාජ යහපත උදෙසා සාරධර්මවල වැදගත්කම අගය කරයි.<br>• සමාජ විද්‍යා දැනුම මගින් විද්‍යාත්මක චින්තනය දියුණු කළ හැකි බව පෙන්වා දෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 1.5 සමාජ සමූහ විමර්ශනය කරයි | • සමාජ විද්‍යාවේ මූලික සංකල්ප<br>• සමාජ සමූහ<br>• ප්‍රාථමික සමූහ<br>• ද්විතියික සමූහ | • සමාජ සමූහ අර්ථ දක්වයි.<br>• සමාජ සමූහ වර්ගීකරණය කරයි.<br>• ප්‍රාථමික හා ද්විතියික සමාජ සමූහ අතර වෙනස පෙන්වා දෙයි.<br>• සමාජ පැවැත්ම සඳහා සමාජ සමූහ වලින් කෙරෙන කාර්යය භාරය අගයයි. | 02 |
| | 1.6 මූලික සමාජ සංස්ථා විවරණය කරයි. | • මූලික සමාජ සංස්ථා<br>• පවුල<br>• විවාහය<br>• ඥාතිත්වය<br>• ආගම | • සමාජ සංස්ථාවල මූලික ලක්ෂණ හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• පවුලේ සාමාජිකයන් සඳහා භාවිතා වන ඥාති පද හඳුන්වයි.<br>• මූලික සමාජ සංස්ථාවල අන්තර් රැදියාව පැහැදිලි කරයි.<br>• සමාජයේ පැවැත්ම සඳහා සමාජ සංස්ථාවල අවශ්‍යතාව පැහැදිලි කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2.0 සමාජ පරිණාමය පිළිබඳව විමර්ශනය කරයි. | 2.1 න්‍යායාත්මක ආකෘති ඇසුරින් සමාජ පරිණාමය විශ්ලේශණය කරයි. | • සමාජ පරිණාමය පිළිබඳ න්‍යායාත්මක ආකෘති | • සමාජ පරිණාමය යන්න අර්ථ දක්වයි.<br>• සමාජ පරිණාමය පිළිබඳ න්‍යායාත්මක ආකෘති ඉදිරිපත් කළ සම්භාවය සමාජ විද්‍යාඥයින් නම් කරයි.<br>• සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් සමාජ පරිණාමය පිළිබඳ දැක් වූ මතවාද ඇසුරින් ප්‍රාථමික සමාජයක හා නූතන සමාජයක ලක්ෂණ වගුගත කරයි.<br>• සමාජ පරිණාමය අඛණ්ඩ ක්‍රියාවලියක් බව පැහැදිලි කරයි. | 04 |
| | 2.2 ප්‍රාථමික සමාජ පිළිබඳ න්‍යායාත්මක ඉගැන්වීම් හදාරයි. | • ප්‍රාථමික සමාජ පිළිබඳ න්‍යායාත්මක ආකාති | • ප්‍රාථමික සමාජය යන්න පැහැදිලි කරයි.<br>• ප්‍රාථමික සමාජ අවධීන් පිළිබඳ සමාජ විද්‍යාඥායින් විසින් ඉදිරිපත් කරන ලද න්‍යායාත්මක අදහස් හඳුන්වා දෙයි.<br>• ප්‍රාථමික සමාජ අවධීන් පිළිබඳ න්‍යායාත්මක අදහස් තුලනාත්මකව විස්තර කරයි.<br>• නූතන හා ප්‍රාථමික සමාජ අතර පවතින වෙනස්කම් අවබෝධයෙන් පෙන්වා දෙයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
| --- | --- | --- | --- | --- |
| | 2.3 නූතන සමාජ පිළිබඳ න්‍යායාත්මක ඉගැන්වීම් හදාරයි. | • නූතන සමාජ පිළිබඳ න්‍යායාත්මක ආකෘති | • "නූතන සමාජය" හඳුන්වයි.<br>• නූතන සමාජය පිළිබඳ න්‍යායාත්මක අදහස් ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයින් හඳුන්වයි.<br>• නූතන සමාජය පිළිබඳ සමාජ විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කළ න්‍යායාත්මක මත විග්‍රහ කරයි.<br>• සමාජ විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කර ඇති නූතන සමාජ ලක්ෂණ ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි. | 04 |
| | 2.4 සමාජ පරිණාමය පිළිබඳ බෞද්ධ විග්‍රහයට අනුව ශ්‍රී ලාංකික සමාජ ජීවිතය අධ්‍යයනය කරයි. | • සමාජ පරිණාමය පිළිබඳ බෞද්ධ විග්‍රහය | • ශ්‍රී ලාංකික සමාජය හඳුන්වයි.<br>• ශ්‍රී ලාංකිය සමාජය බුදු දහමින් පෝෂණය වූ අයුරු විස්තර කර දක්වයි.<br>• මිනිසාගේ හැසිරීම් අනුව සමාජ පරිණාමය මන්දගාමී හෝ වේගවත් ක්‍රියාවලියක් බව පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලාංකීක සමාජය විහාරස්ථානය හා පිරිවෙණ ඇසුරින් වෙනස් වී පරිණාමය වූ ආකාරය පෙන්වා දෙයි. | 04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 3.0 සංස්කෘතිය යන්න විමර්ශනය කරයි | 3.1 නිර්වචන ඇසුරින් සංස්කෘතිය යන්න පැහැදිලි කරයි. | • සංස්කෘතිය පිළිබඳ නිර්වචන<br>• ඊ. බී ටයිලර්<br>• රැලිෆ් ලින්ටන්<br>• ආර්. බ්‍රවුන් | • සංස්කෘතිය යන්න අර්ථකථනය කිරීම සඳහා ඇති නිර්වචන අධ්‍යයනය කරයි.<br>• සංස්කෘතිය යනු මිනිසාගේ සමස්ත ජීවිතයම බව උදාහරණ මගින් ප්‍රකාශ කරයි.<br>• සංස්කෘතිය යන්න නිර්වචන ඇසුරින් හඳුනාගෙන පැහැදිලි කරයි.<br>• සංස්කෘතිය යන්නට නිර්වචනයක් නිර්මාණය කරයි. | 02 |
| | 3.2 සංස්කෘතියට අදාළ විවිධ ගති ලක්ෂණ හඳුනා ගනියි. | • සංස්කෘතියේ අන්තර්ගතය | • සංස්කෘතියේ අන්තර්ගත ලක්ෂණ හඳුන්වයි.<br>• මහා සංස්කෘතියට හා උප සංස්කෘතියට අවේණික ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• එකම රටක් තුළ මහා සංස්කෘතින් එකක් හෝ වැඩි ගණනක් තිබිය හැකි බව නිදසුන් දෙමින් පෙන්වා දෙයි.<br>• ශ්‍රී ලංකික සමාජයේ ඇති මහා සංස්කෘතීන් පිළිබඳ අධ්‍යයනයක යෙදෙමින් ඒවායේ විෂමතා හා සමානතා හඳුනා ගෙන සහජීවනය ඇතිකර ගැනීම සඳහා යොමු වෙයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 3.3 සමාජය පවත්වා ගැනී මෙහිලා සංස්කෘතියේ බලපෑම් පැහැදිලි කරයි | • සමාජය පවත්වා ගැනීමෙහිලා භෞතික හා අභෞතික සංස්කෘතියේ බලපෑම | • භෞතික සංස්කෘතිය හා අභෞතික සංස්කෘතිය හඳුනාගෙන පැහැදිලි කරයි.<br>• සමාජය පවත්වා ගැනීමෙහිලා භෞතික සංස්කෘතියෙන් හා අභෞතික සංස්කෘතියෙන් සිදුවන මෙහෙය නිදසුන් සහිතව පෙන්වා දෙයි.<br>• සංස්කෘතියේ වෙනස් වීම සමාජ පරිණාමය සඳහා හේතුවන බව අවබෝධ කරගෙන ප්‍රකාශ කරයි.<br>• සිංහල සංස්කෘතියේ භෞතික ලක්ෂණ හා අභෞතික ලක්ෂණ හඳුනාගෙන ඉදිරිපත් කරයි. | 02 |
| | 3.4 ශ්‍රී ලාංකික සංස්කෘතියට එල්ල වූ විදේශීය බලපෑම් හඳුනා ගනියි | • සංස්කෘතික සම්පර්කය<br>• ඉන්දීය හා යටත් විජිත | • ශ්‍රී ලංකාවට එල්ල වූ විදේශිය බලපෑම් නම් කරයි.<br>• ශ්‍රී ලාංකික සංස්කෘතිය කෙරෙහි එල්ල වූ විදේශිය බලපෑම් විවරණය කරයි.<br>• එම බලපෑම් නිසා සිංහල සංස්කෘතියෙහි සිදු වූ වෙනස්කම් අවබෝධ කරගෙන විස්තර කරයි.<br>• සංස්කෘතික "සම්පර්කය" යනු කුමක් දැයි හඳුනාගෙන උදාහරණ මගින් පැහැදිලි කරයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 4.0 සාමාජිකයා හැඩ ගැස්වී මෙහිලා සමාජය ඉවහල් වන ආකාරය අධ්‍යයනය කරයි | 4.1 සාමාජිකයාගේ ජීවිතය කෙරෙහි බලපාන සමාජ පසුබිම අධ්‍යයනය කරයි | • සාමාජිකයාගේ ජීවිතය හා සමාජ පසුබිම | • සාමාජිකයා හා සමාජය අතර සම්බන්ධතාවය හඳුනා ගනියි | 02 |
| | | | • සාමාජිකයාගේ පෞරුෂ වර්ධනය සඳහා සමාජ පසුබිම සාධකයක් වන අයුරු පෙන්වා දෙයි.<br>• සමාජයේ සාමාජිකයෙකු වශයෙන් කෙනෙකු විසින් ඉටුකළ යුතු කාර්යයන්හි වැදගත්කම අගය කරයි. | 02 |
| | 4.2 සරල හා සංකීර්ණ සමාජවල ස්වභාවය වෙන් කර හඳුනා ගනියි | • සරල හා සංකීර්ණ සමාජ ග්‍රාමීය හා නාගරික සමාජ | • සරල හා සංකීර්ණ සමාජ අර්ථ දක්වයි.<br>• සරල හා සංකීර්ණ සමාජවල වෙනස්කම් පැහැදිලි කරයි<br>• සරල හා සංකීර්ණ සමාජවල හිතකර ලක්ෂණ විමර්ශනය කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 5.0 සමාජ පාලනය යන්න අවබෝධ කර ගනියි. | 5.1 සමාජ පාලනයෙහි අවශ්‍යතාවය ග්‍රාමීය හා නාගරික සමාජ ඇසුරින් අධ්‍යයනය කරයි. | ● සමාජ පාලනයේ අවශ්‍යතාව ග්‍රාමීය හා නාගරික සමාජ ඇසුරින් | ● "ගම" යන්න හඳුන්වා දෙමින් ශ්‍රී ලාංකික ග්‍රාමීය සමාජය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>● ග්‍රාමීය සමාජයේ සමාජ පාලනය සිදු වන ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරයි.<br>● "නගර" යන්න හඳුන්වා දෙමින් නාගරික සමාජයේ ලක්ෂණ පෙන්වා දෙයි.<br>● නාගරිකරණය කෙරෙහි බලපාන සාධක අධ්‍යයනය කරයි. | 02 |
| | 5.2 සමාජ පාලනයට ආගම මගින් කරන බලපෑම ලාංකීය සමාජය ඇසුරින් විමර්ශනය කරයි | ● ආගමික සංස්ථාව සමාජ පාලනයට ඇති කරන බලපෑම<br>● ලාංකීය සමාජයට ඇති කරන බලපෑම | ● ශ්‍රී ලාංකීය සමාජයේ වෙසෙන විවිධ ජන වර්ග හා ඔවුන්ගේ ආගම් පිළිබඳ දැනුවත් බව ප්‍රදර්ශනය කරයි.<br>● මෙම විවිධ ආගම් සමාජ පාලනයට ඇති කරන බලපෑම ලාංකීය සමාජය ඇසුරින් පෙන්වා දෙයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 5.3 අධ්‍යාපනයේ බලපෑම ඇසුරින් සිදුවන සමාජ පාලනය පැහැදිලි කරයි | • සමාජ පාලනයෙහිලා අධ්‍යාපනයේ වැදගත්කම | • අධ්‍යාපනය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කරයි.<br>• අධ්‍යාපනය ලබා ගන්නා විධිමත් හා අවිධිමත් ආයතන නම් කරයි.<br>• අධ්‍යාපනය ලබා ගැනීම මගින් පුද්ගල පෞරුෂ වර්ධනය සිදුවන ආකාරය පැහැදිලි කරයි.<br>• අධ්‍යාපනය මගින් බිහිකරන යහපත් පුද්ගලයෙකු මගින් සිදුවන සමාජ සංවර්ධනය පිළිබඳ අදහස් දක්වයි. | 02 |
| | 5.4 සමාජ පාලනය කෙරෙහි බුදු දහමේ ආභාෂයත් භික්ෂු දායකත්වයත් ඉවහල් වී ඇති ආකාරය පැහැදිලි කරයි | • බුදු දහම හා භික්ෂු දායකත්වය සමාජ පාලන යෙහි ලා ඇති කරන බලපෑම | • භික්ෂූන් වහන්සේගෙන් ඉටුවන ආගමික මෙහෙවර පැහැදිලි කරයි.<br>• අතීතයේ භික්ෂූන් වහන්සේගෙන් ඉටු වූ අධ්‍යාපනික හා සාමාජීය මෙහෙවර අගයමින් අදහස් දක්වයි.<br>• වර්තමාන භික්ෂූන් වහන්සේගේ ආගමික, සමාජීය හා අධ්‍යාපනික මෙහෙවර අගයමින් අදහස් දක්වයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 6.0 සමාජය හා සමාජ ගැටලු අතර සම්බන්ධතාව හඳුනා ගැනීම | 6.1 සමාජ ගැටලුවල මූලික ලක්ෂණ පැහැදිලි කරයි | • සමාජ ගැටලුවල මූලික ලක්ෂණ<br>• සමාජ ගැටලුවක් සමාජීය වශයෙන් නිර්මාණය වන බව<br>• එහි බලපෑම සමාජයට හානිකර වන බව<br>• සමාජයේ මැදිහත් වීමෙන් එය විසඳා ගත හැකි බව | • සමාජ ගැටලුවල මූලික ලක්ෂණ හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• සමාජ ගැටලු නිර්මාණය වීමෙහිලා සමාජීය වශයෙන් සිදුවන බලපෑම පැහැදිලි කරයි.<br>• සමාජ ගැටලු විසඳා ගැනීමට දායකත්වය සපයයි. | 02 |
| | 6.2 සමාජ ගැටලු වර්ගීක රණය කරයි | • තෝරාගත් සමාජ ගැටලු විවරණය කිරීම<br>• මදිරාබාධය<br>• ළමා අපයෝජනය<br>• දුප්පත්කම<br>• වකුගඩු රෝගය<br>• කැලි කසල ගැටලුව | • සමාජ ගැටලු වර්ග කර දක්වයි.<br>• සමාජ ගැටලුවක් එහි මූලික ලක්ෂණ වලට අනුව පැහැදිලි කරයි.<br>• සමාජ ගැටලු බහුල වීම සමාජ පරිහානියට හේතු වන ආකාරය පෙන්වා දෙයි. | 03 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 6.3 බෞද්ධ ඉගැන්වීමට අනුව සමාජ විවිධත්වය විවරණය කරයි | • සමාජ ගැටලු නිවාරණයේ දී බෞද්ධ මාර්ගෝපදේශයේ වැදගත්කම | • සමාජ ගැටලු නිරාකරණයට අදාළ බෞද්ධ ඉගැන්වීම් නම් කරයි.<br>• සමාජ ගැටලු නිවාරණයෙන් ලද බෞද්ධ ඉගැන්වීම්වල ඇති අදලත්වය පැහැදිල කරයි.<br>• බෞද්ධ මාර්ගෝපදේශ ඇසුරින් සමාජ ගැටලු විසඳීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග යෝජනා කරයි. | 03 |
| 7.0 සමාජය අධ්‍යයනය කිරීම සඳහා යොදා ගනු ලබන විද්‍යාත්මක ප්‍රවේශය හඳුනා ගනියි. | 7.1 සමාජ විද්‍යාත්මක පර්යේෂණවල අවශ්‍යතාව පැහැදිලි කරයි. | • සමාජ විද්‍යාත්මක පර්යේෂණවල අවශ්‍යතාව | • පර්යේෂණයක් යනු කුමක් ද යන්න නිර්වචන අනුසාරයෙන් හඳුන්වයි.<br>• පර්යේෂණයක් විද්‍යාත්මක පර්යේෂණයක් වන අයුරු පැහැදිලි කරයි.<br>• පර්යේෂණයක් කරන්නේ මන්ද පිළිබඳ විවරණාත්මකව අදහස් දක්වයි.<br>• පර්යේෂණවල අවශ්‍යතාව පැහැදිලි කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 7.2 සමාජ විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේදය අධ්‍යයනය කරයි | • සමාජ විද්‍යාත්මක පර්යේෂණ වල අවශ්‍යතාව | • පර්යේෂණයක් සහ විද්‍යාත්මක පර්යේෂණයක් අතර වෙනස පහදයි<br>• සමාජීය විද්‍යාත්මක ක්‍රමවේදය පැහැදිලි කරයි.<br>• උපන්‍යාසයක් ගොඩ නගා ගන්නා අයුරු පැහැදිලි කරයි.<br>• ප්‍රශ්නාවලියක ආකෘතියක් පැහැදිලි කරයි. | |
| | 7.3 තොරතුරු රැස් කිරීමේ විධි ක්‍රමයක් ලෙස නිරීක්ෂණය භාවිත කරයි. | • නිරීක්ෂණය තොරතුරු රැස් කිරීමේ ක්‍රමවේදයක් ලෙස | • පර්යේෂණයක දී නිරීක්ෂණ ක්‍රියාවලියෙහි ඇති වැදගත්කම පෙන්වා දෙයි.<br>• නිරීක්ෂණය නිර්වචන අනුසාරයෙන් පැහැදිලි කරයි.<br>• නිරීක්ෂණ ක්‍රියාවලියේ පියවර පිළිවෙළින් පැහැදිලි කරයි.<br>• නිරීක්ෂණය කරනු ලබන ක්ෂේත්‍රය පිළිබඳව අවධානය යොමු කිරීමේ ඇති වැදගත්කම පැහැදිලි කරයි.<br>• නිරීක්ෂණ ක්‍රියාවලියේ දී අත්වන වාසි සහ අවාසී තත්වයන් ප්‍රකාශ කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලපරිච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | 7.4 සම්මුඛ සාකච්ඡාව තොරතුරු රැස් කිරීමේ ක්‍රමවේදයක් ලෙස යොදා ගනියි | • සම්මුඛ සාකච්ඡාව තොරතුරු රැස් කිරීමේ ක්‍රමවේදයක් ලෙස | • තොරතුරු ලබා ගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමයේ ඇති වැදගත්කම ප්‍රකාශ කරයි<br>• සම්මුඛ සාකච්ඡා ක්‍රමයේ පියවර උදාහරණ සහිතව පෙන්වා දෙයි<br>• සම්මුඛ සාකච්ඡා ක්‍රමයේ වාසි සහ අවාසි උදාහරණ සහිතව ප්‍රකාශ කරයි.<br>• පර්යේෂණ අවස්ථාවක දී නිවැරදි ක්‍රමය අනුගමනය කරමින් සම්මුඛ සාකච්ඡාවක යෙදේ | |

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## සමාජ විද්‍යාව හැඳින්වීම

**නිපුණතාව** - සමාජ විද්‍යාව යන්න විවරණාත්මකව පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම-**

I නිර්වචන ඇසුරින් සමාජ විද්‍යාව යනු කුමක්දැයි අර්ථ දක්වයි.

II සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් අනුසාරයෙන් සමාජ විද්‍යාව විෂයක් ලෙස සංවර්ධනය වූ ආකාරය පැහැදිලි කරයි.

III සමාජ විද්‍යාවේ මූලික සංකල්ප හඳුන්වයි.

IV බුදු දහමේ සමාජ විද්‍යාත්මක පදනම විමර්ශනය කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව - 10

**හැඳින්වීම -**

19 වන සියවසේ මැද භාගයේ දී (1838) ප්‍රංශ ජාතික ඔගස්ට් කොම්ට් විසින් සාමාජ විද්‍යාව යන විෂය ලොවට හඳුන්වා දෙන ලදී. එතැන් සිට සියවස් දෙකකට ආසන්න කෙටි කාලය තුළ මෙම විෂය සුවිශාල සංවර්ධනයකට පාත්‍ර වූයේ ය. ප්‍රායෝගික සමාජයේ එදිනෙදා ජීවිතයේ දී මිනිසා මුහුණ දෙන වේදනාකාරී ගැටලු විශ්ලේෂණය කර දීම මෙම විෂයේ මූලික කාර්යභාරය වීම ඊට හේතු වූයේ ය. ආරම්භයේ දී මුහුණ පෑමට සිදු වූ අභියෝගයක් වූයේ සමාජ විද්‍යාව විද්‍යාත්මක විෂයයක් නොවන්නේ ය යන තර්කයක් ඉදිරිපත් වීමයි. එහෙත් එමිල් ඩුර්ක යිම්, මැක්ස් වේබර් හර්බට් ස්පෙන්සර් වැනි ආරම්භක අවදියේ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයන් මෙම අභියෝගයට සාර්ථක ලෙස පිළිතුරු සැපයීමට සමත් විය. ඔව්හු සිය පර්යේෂණ මගින් මිනිසාගේ සමාජ චර්යාවට ද පොදු හැඩයක්, රිද්මයක් ඇති බවත් එනිසාම එය විද්‍යාත්මක ගුණයෙන් යුක්ත වන බවත් තහවුරු කර දැක්වූහ. සියදිවි නසා ගැනීම නම් පර්යේෂණයේ දී සාර්ථක ලෙස සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම ඩුර්කයිම් විසින් භාවිත කිරීමෙන් තහවුරු කර දක්වන ලද්දේ සමාජ විද්‍යාවේ විද්‍යාත්මක ගුණයයි. ප්‍රොතෙස්තන්ත ආචාර ධර්ම හා ධනවාදයේ සාරය නම් පර්යේෂණයේ දී මිනිසාගේ සමාජ චර්යාව අවිධිමත් අහඹු එකක් නොව විද්‍යාත්මක පදනමක් මත රඳා පවතින්නක් බව තහවුරු කර දැක්වීමට මැක්ස් වේබර් නම් සම්භාව්‍ය සමාජ විද්‍යාඥයා සමත් විය.

ඔගස්ට් කොම්ට්ගේ සිට මෙම විෂය සංවර්ධනය කිරීමට දායක වූ සමාජ විද්‍යාඥයන් බහුතරයක් දෙනා විසින් මෙම විෂයයේ විද්‍යාත්මක ගුණය තහවුරු කර දක්වන ලදී. එමෙන් ම නිර්වචන රැසක් ද ඉදිරිපත් කරනු ලැබීය.

**නිපුණතාව** - සමාජ විද්‍යාව යන්න විවරණාත්මකව පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම-** 1.1 නිර්වචන ඇසුරින් සමාජ විද්‍යාව යනු කුමක්දැයි අර්ථ දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. සමාජ විද්‍යාව පිළිබඳ නිර්වචනවලින් හැඟවෙන දේ ප්‍රකාශ කරයි.
2. සමාජ විද්‍යාව පුළුල් පරාසයක පැතර ගිය විෂය ක්ෂේත්‍රයක් වීම නිසා විෂය නිර්වචනය කිරීමේ ගැටලුකාරී බව හඳුනාගනිමින් අදහස් දක්වයි.
3. එකිනෙක නිර්වචනයන්ට අනුව විවිධ දෘෂ්ටිකෝණවලින් සමාජ විද්‍යාව දෙස බැලිය හැකි බව පැහැදිලි කරයි.
4. සමාජ විද්‍යාඥයා සමාජයේ පවත්නා ගැටලු අධ්‍යයනය කර ඒ ඇසුරින් නිර්වචන ඉදිරිපත් කර ඇති බව පිළිගනිමින් අදහස් දක්වයි.

**හැඳින්වීම** -

19 වන සියවසේ බිහි වූ සමාජ විද්‍යා විෂය වර්තමානය වන විට පුළුල් පරාසයක පැතිරී ඇත. මිනිසා හා සමාජය පිළිබඳව විද්‍යාත්මක ක්‍රමවේද භාවිත කරමින් අධ්‍යයනය කරන විෂය සමාජ විද්‍යාවයි. එහි විෂය ක්ෂේත්‍රය ද ඉතා පුළුල් ය. එසේ විශාල පරාසයක පැතිර යන මෙම විෂය පිළිබඳව ආරම්භයේ සිට වර්තමානය දක්වාම නිර්වචන ගොඩ නඟා ගැනීමට සමාජ හා මානව විද්‍යාඥයින් උත්සාහ ගෙන ඇත. එහෙත් විශ්ව සාධාරණ නිර්වචනයක් ගොඩ නඟා ගැනීමට මේ දක්වා සමත් වී නැත. එක් එක් විද්‍යාඥයා තමා කැමති විෂය පථය පිළිබඳ විග්‍රහ කිරීමට ප්‍රියතාවයක් දැක්වීම එවැනි තත්ත්වයක් උදා වීමට හේතු වී ඇත. මේ අනුව නිර්වචන වලින් තොරව සමාජ විද්‍යා විෂය තේරුම් ගැනීම ඉතා අපහසු කාර්යයක් බව පැහැදිලි වේ. එබැවින් සමාජ විද්‍යා විෂය ඉගෙනීම සඳහා නිර්වචන කොතරම් දුරට උපකාර වන්නේ දැයි වටහා ගැනීම මෙම පාඩමේ මූලික අරමුණ වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රශ්නකරණය
- ප්‍රදර්ශන ක්‍රමය
- දේශන ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ විද්‍යාඥයින්ගේ නිර්වචන අධ්‍යයනය කිරීම සමාජ සම්බන්ධතා හැදෑරීමට මහත් උපකාරයක් බව වටහා ගනියි.

2. සමාජ විද්‍යා විෂය හැදෑරීමේ දී නිර්වචනවල වැදගත්කම අගයයි.

**ගුණාත්මක යෙදවුම්**

- සමාජ විද්‍යාඥයින්ගේ රූප රාමු
- සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කරන ලද නිර්වචන ඇතුළත් දෘශ්‍යාධාරක
- වයිට් බෝඩ්, පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

පිවිසීම

- සමාජ විද්‍යාව අර්ථ දක්වමින් නිර්වචන ඉදිරිපත් කළ විද්‍යාඥයින් හඳුන්වා දෙන්න. ඒ සඳහා සමාජ විද්‍යාඥයින්ගේ රූප රාමු ද යොදා ගන්න. (ඇමුණුම් 01)
- සමාජයේ වාසය කරන විවිධ සාමාජිකයින්ගේ චර්යාව යථාර්ථවාදී ව විග්‍රහ කරන විෂයක් ලෙස සමාජ විද්‍යාව හැඳින්විය හැකි බව පෙන්වා දෙන්න.
- සමාජ විද්‍යාඥයින් සමාජ විද්‍යාව පිළිබඳ ඉදිරිපත් කරන ලද නිර්වචන ඇතුළත් දෘශ්‍යාධාරකය ප්‍රදර්ශනය කර ඒ ඇසුරින් සමාජ විද්‍යාව හඳුනා ගැනීමට යොමු කරන්න. (ඇමුණුම් 02)
- සමාජ විද්‍යාඥයින්ගේ නිර්වචන අධ්‍යයනය කිරීම සමාජ සම්බන්ධතා හැදෑරීමට උපකාරීවන බව හඳුන්වා දෙන්න.
- සමාජ විද්‍යාත්මක අධ්‍යයනය මගින් සමාජ ගැටලු විවරණය කර දැක්විය හැකි බව සනාථ කරන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ විද්‍යාඥයින්ගේ නිර්වචන අධ්‍යයනය කිරීම සමාජ සම්බන්ධතා හැදෑරීමට උපකාරීවන අයුරු පැහැදිලි කරන්න. (ඇමුණුම 02) | ප්‍රදර්ශන ක්‍රමය / නිරීක්ෂණ ක්‍රමය |
| සමාජ විද්‍යාව නිර්වචන ඇසුරින් හඳුනා ගන්නා අයුරු පැහැදිලි කර ඒ ඇසුරින් ප්‍රශ්න කරන්න. | ප්‍රශ්නකරණය |
| සමාජ විද්‍යාත්මක පර්යේෂණ මගින් සමාජ ගැටලු විවරණය කරන අයුරු පැහැදිලි කරන්න. | සාකච්ඡා ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සමාජ විද්‍යාව පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයින් තිදෙනකු නම් කිරීම.
- සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කර ඇති නිර්වචන 02ක් ඉදිරිපත් කිරීම.
- සමාජ විද්‍යාව මගින් සමාජ ගැටලු විවරණය කරන ආකාරය කෙටියෙන් විස්තර කිරීම.

ඇමුණුම 01


ඔගස්ට් කොම්ට්


එමිල් ඩුර්කයිම්


කිංස්ලි ඩේවිස්

ඇමුණුම 02

- “සමාජ විද්‍යාව සමාජ ආයතන හෙවත් සමාජ සංස්ථා පිළිබඳව අධ්‍යයනය කරන විද්‍යාව යි”

  - එමිල් ඩුර්කයිම් - Emile Durkheim -

- “සමාජ ශාස්ත්‍රවල රැජින සමාජ විද්‍යාව වේ”

  - ඔගස්ට් කොම්ට් - Auguste Comte -

- “සමාජ විද්‍යාව යනු සමාජය පිළිබඳ ප්‍රධාන විද්‍යාවයි”

  - කිංස්ලි ඩේවිස් - Kingsley Davis -

- “සමාජ විද්‍යාව යනු සාමූහික චර්යාව පිළිබඳ අධ්‍යයනය වේ”

  - රොබට් පාර්ක් - Robert Park -

- “සමාජ විද්‍යාව සමාජ සම්බන්ධතා පිළිබඳ විද්‍යාව වේ”

  - ඒ. ඩබ්ලිව්. ස්මෝල් - A. W. Small -

- “සමාජ සමූහ පිළිබඳ අධ්‍යයනය කරන විෂය සමාජ විද්‍යාවයි”

  - හැරී. එම්. ජොන්සන් - H. M. Jahnson -

**නිපුණතාව** - සමාජ විද්‍යාව යන්න විවරණාත්මකව පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම-** 1.2 සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් අනුසාරයෙන් සමාජ විද්‍යාව විෂයයක් ලෙස සංවර්ධනය වූ ආකාරය පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. සමාජ විද්‍යාව විද්‍යාත්මක විෂයයක් ලෙස පෝෂණය කිරීමට දායක වූ සමාජ විද්‍යාඥයින් නම් කරයි.
2. සමාජ විද්‍යාවේ වර්ධනය සඳහා මූලික වූ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින්, හඳුනාගෙන, ඔවුන්ගේ මතවාද ප්‍රකාශ කරයි.
3. සමාජ විද්‍යාව වර්ධනය කිරීම සඳහා ප්‍රංශය තුළ එමිල් ඩුර්කයිම් විසින් කර ඇති සම්මාදම අගය කරමින් කතා කරයි.
4. සමාජ විද්‍යාව වර්ධනය කිරීම සඳහා මැක්ස් වේබර්ගේ දායකත්වය සඳහන් ක්ෂේත්‍ර හඳුනාගෙන ප්‍රකාශ කරයි.
5. කාල් මාක්ස්ගේ විග්‍රහයන් සමාජ විද්‍යාවේ වර්ධනය සඳහා බලපෑම් කර ඇති ආකාරය පැහැදිලි කරයි.

**හැඳින්වීම** -

ඔගස්ට් කොම්ට් (1798 - 1857) යනු සමාජ විද්‍යාවේ පියා ලෙසට හඳුන්වා දිය හැකිය. සමාජ විද්‍යා විෂය සමාජගත කිරීමට මොහු සුවිශේෂී කාර්යයක් ඉටු කළේ ය. සමකාලීන යුරෝපා සමාජයේ ප්‍රසිද්ධ සමාජවාදී චින්තකයෙකු වූ හෙන්රි ඩී. සෙන්ට් සිමොන්ගේ ආභාෂය ලබා මොහු සිය දාර්ශනික අදහස් වැඩි දියුණු කර ගත්තේ ය. මුලින් ම මොහු සමාජ විද්‍යාව විෂය හැඳින්වූයේ සමාජ භෞතික විද්‍යා විෂය නමිනි. පසුව සමාජ භෞතික විද්‍යාව යන නාමය වෙනුවට සමාජ විද්‍යාව (Sociology) යන නාමය 1838 වර්ෂයේ දී යොදා ගන්නා ලදි. එතැන් පටන් මෙම විෂය ඉතා කෙටි කලක් තුළ දී ජනප්‍රිය විෂයයක් බවට පත් කිරීමට හැකි වී ඇත.

ඉන් අනතුරුව මෙම විෂය වැඩි දියුණු කිරීම සඳහා පසු කාලීන සමාජ විද්‍යාඥයින් කීපදෙනෙක් ම ඉදිරිපත් විය. ඔවුන් සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් වශයෙන් ප්‍රචලිත ය. එම විද්‍යාඥයින් අතරින් එමිල් ඩුර්කයිම් (1858 - 1917), මැක්ස් වේබර් (1864 - 1920), හර්බට් ස්පෙන්සර් (1820 - 1903) සහ කාල් මාක්ස් (1818 - 1883) මෙම විෂය ප්‍රචලිත කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කළහ. සමාජ විද්‍යාවේ දියුණුව සඳහා මොවුන්ගේ කාර්යභාරය පිළිබඳ මෙම පාඩම යටතේ අවධානය යොමු කරනු ඇත.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රශ්නකරණය
- දේශන ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීමේ විධිමත් ක්‍රමයක් ඔස්සේ සමාජ විද්‍යාව විෂය ගොඩනැඟී සංවර්ධනය වූ බව අවබෝධ කර ගනියි.
2. සම්භාවය සමාජ විද්‍යාඥයින්ගේ මතවාද අගයයි.
3. එක් එක් සමාජ විද්‍යාඥයාගේ අවධානයට ලක් වූ විෂය කරුණු විවිධාකාර බව පෙන්වා දෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින්ගේ රූප රාමු
- වයිට් බෝඩ්
- පෑන්

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

- සමාජ විද්‍යාවේ පියා ලෙස හඳුන්වනු ලබන "ඔගස්ට් කොම්ට්" පිළිබඳව සිසුන් දන්නා තොරතුරු පිළිබඳව විමසමින් ඔහු සමාජ විද්‍යාව විෂයයක් ලෙස සංවර්ධනය කිරීමට දායක වූ ආකාරය සාකච්ඡා කරන්න.
- සමාජ විද්‍යාවේ වර්ධනය සඳහා මූලික වූ සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් පිළිබඳ මූලික හැඳින්වීමක් කරන්න.
    - ඔගස්ට් කොම්ට් (සමාජ විද්‍යාවේ පියා)
    - හර්බට් ස්පෙන්සර්
    - එමිල් ඩුර්කයිම්
    - මැක්ස් වේබර්
    - කාල් මාක්ස්

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ විද්‍යා විෂය ගොඩනැගී සංවර්ධනය වූ බටහිර සමාජය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජ විද්‍යාවේ වර්ධනය සඳහා මූලික වූ සමාජ විද්‍යාඥයින් ඔවුන්ගේ රූප රාමු ද යොදා ගනිමින් හඳුන්වා දෙන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කරන ලද මතවාද වෙන වෙනම පැහැදිලි කර ඒවා වගු ගත කරන්න. | දේශන ක්‍රමය |
| සමාජ විද්‍යාව විෂයයක් ලෙස සංවර්ධනය වූ ආකාරය ඇසුරෙන් ප්‍රශ්න අසන්න. | ප්‍රශ්නකරණය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් 05 දෙනෙකු නම් කිරීම.
- සමාජ විද්‍යාවේ වර්ධනය සඳහා සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කරන ලද මතවාදවල මූලික කරුණු වගුගත කිරීම.

ඇමුණුම 01



ඔගස්ට් කොම්ට්




හර්බට් ස්පෙන්සර්



එමිල් ඩුර්කයිම්



මැක්ස් වේබර්



කාල් මාක්ස්

**නිපුණතාව** - සමාජ විද්‍යාව යන්න විවරණාත්මකව පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම-** 1.3 සමාජ විද්‍යාවේ මූලික සංකල්ප හඳුන්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 04**

**ඉගෙනුම් පල**

1. සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කර ඇති නිර්වචන ඇසුරින් සමාජ සමූහ හඳුන්වයි.
2. ද්විතියික සමූහ පිළිබඳව තොරතුරු සෙවීමට ඉදිරිපත් වෙයි.
3. තත්ත්වය හා කාර්ය කොටස තේරුම් ගෙන පැහැදිලි කරයි.
4. පුද්ගලයා සමාජය හා සම්බන්ධ වන විවිධ ආකාරයන් පැහැදිලි කරනු ලබන්නේ තත්ත්වය හා කාර්ය කොටස මාර්ගයෙන් බව විස්තර කරයි.
5. පුද්ගලයකු සමාජගත කිරීමේ දී සමාජානුයෝජන කාරකවල වැදගත්කම පැහැදිලි කරයි.

**හැඳින්වීම** -

සමාජ විද්‍යාව නැමැති විෂය යටතේ සමාජ සමූහ, තත්ත්වය හා කාර්යභාරය සහ සමාජානුයෝජනය යන විෂය කරුණුවලට සුවිශේෂී වැදගත්කමක් හිමිවේ. කවර හෝ සමාජයක් මෙකී මූලික සාධක මත රඳා පැවතීම ඊට හේතුවන්නේ ය.

සමාජ සමූහයක් ගොඩනැගීම සඳහා මිනිසුන් දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසකගේ දායකත්වය අත්‍යවශ්‍ය වේ. එහෙත් සමාජ විද්‍යාත්මක අර්ථයෙන් සලකා බැලීමේ දී සමූහයක ලක්ෂණ කීපයක් හඳුනාගත හැකිය. එනම් සාමාජිකයා අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා පැවතිය යුතු වේ. එහි දී ඔවුන් පොදු අරමුණු හා අවශ්‍යතාවයන් වෙනුවෙන් පෙනී සිටිය යුතුය. එම ලක්ෂණ සහිත සාමාජික එකතුවක් සමාජ සමූහයක් ලෙස විග්‍රහ කළ හැකි වේ.

එසේ ම තත්ත්වය හා කාර්ය කොටස පිළිබඳව ද මෙම පාඩම යටතේ කරුණු විග්‍රහ කරනු ලැබේ. ආරෝපිත හා සාධික වශයෙන් තත්ත්වය කොටස් දෙකකට බෙදා දක්වා ඇත. එමෙන්ම තත්ත්ව කට්ටලය, කාර්ය කොටස්, භූමිකා ගැටුම හා වික්‍රියාව යන කරුණු පිළිබඳව ද මෙහි දී සාකච්ඡා කෙරේ.

සමාජානුයෝජනය ද විශේෂයෙන් අවධානයට යොමු විය යුතු විෂය කරුණකි. පුද්ගලයෙකු සමාජගත වීමේ දි හෙවත් සමාජයට අනුරූපව හැඩ ගැසීමේ දී මෙහි සඳහන් සමාජානුයෝජන කාරක කෙරෙහි වැඩි අවධානය යොමු වේ. එනම් පවුල, පාසල, සමවයස් කණ්ඩායම් හා ජනමාධ්‍ය යන ඒවා ය. ඒ අනුව මෙම විෂය කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමට මෙම පාඩම මගින් ඉඩකඩ සලසා තිබේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රශ්නකරණය
- ප්‍රදර්ශන ක්‍රමය
- දේශන ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ සමූහවල වැදගත්කම අගයයි.
2. සමාජානුයෝජනය මගින් යහපත් පුරවැසියෙකු වීමට අවශ්‍ය ගති ලක්ෂණ සපුරාගත හැකි බව වටහා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- සංකල්ප සිතියම
- වයිට් බෝඩ්
- පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සමාජ විද්‍යාවේ මූලික සංකල්ප ඇතුළත් සංකල්ප සිතියමක් ප්‍රදර්ශනය කර ඒ පිළිබඳව විමසමින් පාඩමට පිවිසිය හැක. (ඇමුණුම් 01)
- සමාජ සමූහ පිළිබඳව සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කළ නිර්වචන ඇසුරින් හඳුන්වා දෙන්න.
  නිර්වචනය - "අන්‍යෝන්‍ය වශයෙන් සාපේක්ෂව ස්ථාවර සම්බන්ධතා ඇති කරගන්නා ලද කුමන හෝ මිනිස් එකතුවක් සමාජ සමූහයක් ලෙස හැඳින්වේ - මැක් අයිවර් -
- සමාජ සමූහවල ලක්ෂණ පෙන්වා දෙන්න.
  - නිරන්තර අන්තර් ක්‍රියා පැවතීම.
  - ක්‍රියා හා ප්‍රතික්‍රියා පැවතීම.
  - සමාජයට පොදු වූ අරමුණු හෙවත් අපේක්ෂා පැවතීම.
  - ප්‍රතිමානානුකූල පොදු හැසිරීම් ක්‍රමයක් තිබීම.
  - සමූහයට අයත් වීම පිළිබඳ සාමූහික හැඟීමක් පැවතීම.
  - සංස්කෘතික අනන්‍යතාව.
  - තත්ත්ව සමූහයක එකතුවක් වීම.


**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ සමූහ පිළිබඳව සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කළ නිර් වචන කිහිපයක් සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| ද්විතියික සමූහ හා ඒවායේ ලක්ෂණ ඉදිරිපත් කරන්න. | සාකච්ඡා ක්‍රමය<br>දේශන ක්‍රමය |
| පුද්ගලයකු සමාජගත කිරීමේ දී සමාජානුයෝජනය වැදගත් වන අයුරු උදාහරණ සහිතව පැහැදිලි කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| තත්ත්වය හා කාර්ය කොටස පිළිබඳ සාකච්ඡා කර ප්‍රශ්න අසන්න. සිසු පිළිතුරු අගය කරන්න. | සාකච්ඡා ක්‍රමය<br>ප්‍රශ්නකරණය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සමාජ සමූහ පිළිබඳව සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කළ නිර්වචන ඇසුරින් පොත් පිංචක් සකස් කිරීම.
- සමාජ සමූහයක හා ද්විතියික සමූහයක ලක්ෂණ දැක්වීම.
- තත්ත්වය හා කාර්ය කොටස පිළිබඳව උදාහරණ ඇසුරින් පැහැදිලි කිරීම.
- සමාජානුයෝජන කාරක 04ක් නම් කර ඒවා යහපත් පුරවැසියෙකු සැකසීමට දායකවන අයුරු කෙටියෙන් පැහැදිලි කිරීම.

ඇමුණුම 01



**ඇමුණුම 02**

| තත්ත්වය (Status) | කාර්ය කොටස (Role) |
|---|---|
| 1. න්‍යායාත්මකය | 1. ප්‍රායෝගිකය |
| 2. රැඩික්ලිෆ් බ්‍රවුන්ට අනුව තත්ත්වය සමාජ ව්‍යුහයට අයත් වන්නේ ය. | 2. රැඩික්ලිෆ් බ්‍රවුන්ට අනුව සමාජ ව්‍යුහයේ පිළිබිඹු කාර්ය කොටසක් වන්නේ ය. |
| 3. තත්ත්වය යන්නෙන් පැවසෙන්නේ කල් පවත්නා වූ චර්යාකම් ය. | 3. කාර්ය කොටසෙන් හැඟවෙන්නේ වෙනස්වන සුළු චර්යාකම් ය. |
| 4. තත්ත්වය සාමාන්‍යයෙන් ස්ථිතිකය | 4. කාර්ය කොටස සාමාන්‍යයෙන් ගතිකය |
| 5. තත්ත්වය අදෘශ්‍යමානය | 5. කාර්ය කොටස දෘශ්‍යමානය |
| 6. තත්ත්වයන් අතර ගැටුමක් නැත. | 6. නමුත් කාර්ය කොටස් අතර ගැටුම් ඇත. |

**නිපුණතාව** - සමාජ විද්‍යාව යන්න විවරණාත්මකව පැහැදිලි කරයි.

**නිපුණතා මට්ටම-** 1.4 බුදු දහමේ සමාජ විද්‍යාත්මක පදනම විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. බුදු දහමේ ඉගැන්වීම් සමාජ විද්‍යාවට අනුගත බව උදාහරණ ඇසුරින් පැහැදිලි කරයි.
2. බෞද්ධ සමාජ විද්‍යාවේ ප්‍රධාන ලක්ෂණ දෙක වෙන වෙන ම හඳුනාගෙන අදහස් දක්වයි.
3. බුදු දහමේ අඩංගු සමාජ වෙනස්වීමේ සිද්ධාන්තය පිළිබඳ තොරතුරු විමර්ශනය කරයි.

**හැඳින්වීම** -

ආගම සමාජයේ ආරම්භක අවධියේ සිට ම මානව ක්‍රියාකාරකම් හා සමග බැඳී පැවැති මූලිකාංගයකි. සෑම සංස්කෘතියකටම අයත් ජනතාව විසින් යම් යම් විශ්වාස ගොඩනගා ගන්නා ලදි. ඊට අනුරූප ඇදහිලිද ගොඩනගා ගන්නා ලදි. මෙසේ පවතින විශ්වාස ඇදහිලි සියල්ල ම පොදුවේ ගෙන විමසන විට ආගම යනු පුළුල් සමාජ සම්මුතියක් බව තහවුරු වේ. ලොව පවතින එක් එක් ආගම්වලින් පිළිබිඹු වන මතවාද හා අරමුණු එකිනෙකින් වෙනස් වුව ද ඒ හැම එකකම අවසාන ඉලක්කය සමාජයට හිතකර සාමාජිකයෙකු නිර්මාණය කර ගැනීම යි.

ඒ අතරින් බුදු දහම යනු භෞතිකවාදී ඉගැන්වීමක් මත පදනම් වන ජීවන දර්ශනයකි. බෞද්ධ ඉගැන්වීම් සමාජ විද්‍යාවට අනුගත බව පැහැදිලි ලෙස දක්නට ලැබේ. බුදු දහමේ සාකච්ඡා වන ප්‍රධාන සංකල්ප සියල්ල ම සමාජ විද්‍යාත්මක පදනමක් මත පදනම් වන බව පැහැදිලි වේ.

පංචසීල ප්‍රතිපදාව, කර්ම සංකල්පය, අනිත්‍ය සංකල්පය මෙන් ම මංගල, පරාභව, වසල, අග්ගඤ්ඤ, කාලාම යන සූත්‍ර දේශනාවල ගැබ්වන සමාජ විද්‍යාත්මක වටිනාකම ඉතා විශාල ය. ඒ අනුව බුදු දහමේ ඉගැන්වෙන බොහෝ සංකල්ප සමාජ විද්‍යාඥයින් විසින් යම් තරමකට හෝ පරිශීලනය කර ඇති බව පැහැදිලි ය. ඒ බව සනාථ කරමින් බුදු දහමේ අන්තර්ගත සමාජ විද්‍යාත්මක ලක්ෂණ මෙම පාඩම යටතේ උගන්වනු ලැබේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ප්‍රදර්ශන ක්‍රමය
- දේශන ක්‍රමය
- ප්‍රශ්නකරණය
- සාකච්ඡා ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. බෞද්ධ ඉගැන්වීම මගින් සමාජ අනුකලනය ශක්තිමත් කරන බව වටහා ගනියි.
2. සාමාජිකයාගේ පෞරුෂ වර්ධනයට බුදු දහමෙන් ලැබෙන අනුබලය සුවිශේෂී බව පැහැදිලි කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- වයිට්බෝඩ්
- පෑන්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- පිවිසීම - ගමයි පන්සලයි, වැවයි දාගැබයි රූප රාමුවක් පන්තියට ප්‍රදර්ශනය කර එහි සමාජ විද්‍යාත්මක පදනම පැහැදිලි කර දෙමින් පාඩමට පිවිසිය හැකි ය.
- බෞද්ධ සමාජ විද්‍යාවේ ප්‍රධාන ලක්ෂණ දෙක සිසුන් සමග සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| නිර්වචන ඇසුරින් බුදුදහම විද්‍යාත්මක පදනමක් මත ගොඩනගා ඇති බව පෙන්වා දෙන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| බුදු දහමේ සමාජ විද්‍යාත්මක පදනම උදාහරණ ඇසුරින් පෙන්වා දෙන්න. | දේශන ක්‍රමය |
| බෞද්ධ සමාජ විද්‍යාවේ ප්‍රධාන ලක්ෂණ දෙක වෙන වෙන ම හඳුන්වා දෙමින් සාකච්ඡා කරන්න | සාකච්ඡා ක්‍රමය |
| සමාජය පරිණාමයට පත්වන බව අඟවන බෞද්ධ ඉගැන්වීම් පෙන්වා දෙන්න. ඒ ඇසුරින් ප්‍රශ්න අස මින් සිසු පිළිතුරු අගය කරන්න. | ප්‍රශ්න කරණය<br>සාකච්ඡා ක්‍රමය |
| බෞද්ධ ඉගැන්වීම් සමාජ අනුකලනයට හා පෞරුෂ වර්ධනයට හේතුවන බව තහවුරු කරන්න. | දේශන ක්‍රමය |

ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක

- බුදු දහමේ සමාජ විද්‍යාත්මක පදනම උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කිරීම.
- බෞද්ධ සමාජ විද්‍යාවේ ප්‍රධාන ලක්ෂණ දෙකක් පැහැදිලි කිරීම.

ඇමුණුම 01

1. ගමයි - පන්සලයි වැවයි - දාගැබයි දක්නට ලැබෙන පින්තූරයක්



## සමාජ පරිණාමය

**නිපුණතාව** - සමාජ පරිණාමී ක්‍රියාවලිය අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම් -**

2.1 සාම්ප්‍රදායික සමාජ පිළිබඳ සම්භාව්‍ය න්‍යාය ඇසුරින් ශ්‍රී ලාංකීය සමාජය පැහැදිලි කරයි.

2.2 සම්භාව්‍ය න්‍යාය ඇසුරින් නවීන ශ්‍රී ලාංකික සමාජය පැහැදිලි කරයි.

2.3 නව සොයා ගැනීම් සමාජ පරිණාමී ක්‍රියාවලියේ ගාමක බලවේගය බව තේරුම් කරයි.

2.4 නූතන සමාජ පරිණාමය වේගවත් කරන බලවේග අධ්‍යයනය කරයි.

2.5 බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් සමාජ පරිණාමී ක්‍රියාවලිය විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 06**

හැඳින්වීම -

සරල සාම්ප්‍රදායික අවදියක සිට සංකීර්ණ නූතන සමාජය දක්වා මිනිසා පැමිණ ඇත්තේ ඔහු විසින් අත්පත් කරගනු ලැබූ නව දැනුම හා නිර්මාණකරණයට අනුව යි. සමාජ පරිණාමී ක්‍රියාවලිය අවධි තුනක් යටතේ ඔගස්ට් කොම්ට් විසින් විවරණය කර දක්වයි.

දේවවාදී අවධිය
පාර භෞතික අවධිය
යථානුභූත අවධිය යනු එකී අවධි තුනයි

මීට අමතරව අනෙකුත් සමාජ විද්‍යාඥයන් විසින් ඉදිරිපත් කළ සම්භාව්‍ය න්‍යායන් අතර ගැටුම්වාදී න්‍යාය, කෘත්‍යවාදී න්‍යාය, චර්යාවාදි න්‍යාය, චක්‍රීය න්‍යාය වැනි ඒවා වැදගත් වේ.

ඉතාමත් ප්‍රාථමික වනචාරී අවදියකින් පෘථිවිය මත ජීවිතය ආරම්භ කළ මානවයා එතැනින් නික්ම ක්‍රම ක්‍රමයෙන් ඉදිරියට ආවේ ය. එකී ඉදිරි ගමන සමාජ පරිණාමය නමින් හඳුන්වනු ලැබේ. එම ගමනේ දී ප්‍රකට කරන සුවිශේෂ ගති ලක්ෂණවලට සාපේක්ෂව විවිධ යුගවලට බෙදා දක්වනු ලැබ ඇත. ඔගස්ට් කොම්ට් විසින් ඉදිරිපත් කරන ලද අවධි තුනේ රීතිය එවැන්නකි.

පසු කාලයේ දී කාල් මාක්ස් විසින් සංඝටනාත්මක න්‍යාය ඉදිරිපත් කළේ ය. පූර්ව කොමියුනිස්ට්, වහල්, වැඩවසම්, ධනවාදී, සමාජවාදී හා අපර හෙවත් පූර්ණ කොමියුනිස්ට් යන අවධි ඔහුගේ ආකෘතියට ඇතුළත් වේ. එමිල් ඩුර්කයිම් විසින් කෘත්‍යවාදී න්‍යාය ඉදිරිපත් කළේ ය. එම න්‍යායට අනුව යාන්ත්‍රික ඒකාබද්ධතාව හා ඓන්ද්‍රීය ඒකාබද්ධතාව නම් අවධි යටතේ සමාජය පරිණාමය

වේ. චර්යවාදී න්‍යායාත්මක ආකෘතිය ඉදිරිපත් කරන ලද්දේ මැක්ස් වේබර් නමැති සමාජ විද්‍යාඥයා විසින් ය. සාම්ප්‍රදායික අවධිය හා තාර්කික අවධිය යටතේ ලොව සෑම සමාජයක් ම පරිණාමය වන බව වේබර්ගේ මතය යි.

වර්තමාන ලෝක සමාජය අවතීර්ණ වී ඇත්තේ මාක්ස්ගේ විග්‍රහයේ දැක්වෙන ධනේශ්වර අවධියට ය. එමෙන් ම ඩුර්කයිම් විසින් විවරණය කර දක්වන ලද ඓන්ද්‍රීය සමාජ ක්‍රමය ද වර්තමාන ලෝක සමාජයට සමාන ය. එපමණක් නොව වේබර්ගේ විග්‍රහයෙන් කියැවෙන තාර්කික සමාජ ක්‍රමය ද වත්මන් නවීන ලෝක සමාජ රාමුව හා සමපාත වන්නේ ය.

නවීන මහාපරිමාණ නාගරික වෙළෙඳපොළ සමාජය කාර්මීකරණයේ සෘජු ප්‍රතිඵලයකි. කාර්මීකරණය යනු විද්‍යාව, තාක්ෂණය හා නව සොයා ගැනීම්වල ප්‍රතිඵලයකි. තව දුරටත් නවීන සමාජය දිනෙන් දින සංවර්ධනාත්මකව ඉදිරියට ගමන් කරනු ලබන්නේ විද්‍යාව, තාක්ෂණය නව සොයාගැනීම් මත පදනම් වන නිර්මාණකරණයට සාපේක්ෂව යි. ඒ අනුව කොම්ට්ගේ යථානුභූත අවධියේ ලක්ෂණ ද, මාක්ස්ගේ ධනේශ්වර අවධියේ ලක්ෂණ ද, ඩුර්කයිම්ගේ ඓන්ද්‍රීය අවධියේ ලක්ෂණ ද වේබර්ගේ තාර්කික අවධියේ ලක්ෂණ ද මෙම නවීන, නාගරීක, සංකීර්ණ සමාජ ක්‍රමයෙන් නියෝජනය වන බව පෙන්වා දිය හැකි ය.

බටහිර සංවර්ධිත ලෝකයේ රටවලින් වාර්තා වන සමාජ වෙනස්කම් ලොව පුරා සෙසු සමාජවලට විසරණය කරනු ලබන බලවේග ගණනාවක් ද ක්‍රියාත්මක වේ. නවීකරණය, බටහිරකරණය, ගෝලීයකරණය යනු ඒ අතර ඇති වර්තමානය වන විට වඩාත් වැදගත් කොට සැලකිය හැකි බලවේග තුනයි.

**නිපුණතාව** - සමාජ පරිණාමී ක්‍රියාවලිය අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම** - 2.1 සාම්ප්‍රදායික සමාජ පිළිබඳ සම්භාව්‍ය න්‍යාය ඇසුරින් ශ්‍රී ලාංකීය සමාජය පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 04**

**ඉගෙනුම් පල**

1. න්‍යායාත්මක අර්ථ නිරූපණ ඇසුරින් සාම්ප්‍රදායික ශ්‍රී ලාංකීය සමාජය හඳුන්වයි.
2. සාම්ප්‍රදායික ශ්‍රී ලාංකීය සමාජයෙන් හමුවන යාන්ත්‍රික ලක්ෂණ විස්තර කරයි.
3. සාම්ප්‍රදායික ශ්‍රී ලාංකීය සමාජය තුළ දක්නට ලැබුණු යහ ධර්ම අගය කරයි.
4. සාම්ප්‍රදයික ශ්‍රී ලංකා සමාජයේ හමුවන පාර භෞතික විශ්වාස හා ඇදහිලි පෙන්වා දෙයි.

**හැඳින්වීම** -

ඔගස්ට් කොම්ට්ගේ විග්‍රහයට අනුව සාම්ප්‍රදයික කෘෂි සමාජ නියෝජනය වන්නේ පාර භෞතික අවදියෙන් ය. අදෘෂ්‍යමාන දිව්‍ය, යක්ෂ ආදී බලවේග මෙම ගණයේ සමාජවල මානව චර්යාව හසුරවනු ලබන මූල සාධක වේ. නව අභියෝගවලට මුහුණ දීමට තරම් ශක්තියක් මෙහි වැසියන්ට නොවීය. එහෙයින් සමාජය දිගු කාලීනව ඒකාකාරී විය.

මැක්ස් වේබර් හඳුන්වා දී ඇති ආකාරයට සාම්ප්‍රදායික ආධිපත්‍ය (Traditional Authority) පැරණි සමාජවල දක්නට ලැබුණු අතර එහි ලක්ෂණ වනුයේ, රාජාණ්ඩු පාලන ක්‍රමය සියලු නිලතල පරපුරෙන් හිමිවීම, ආරෝපිත දිශානතිය, සාමූහික මානසිකත්වය, සියල්ල සම්ප්‍රදයට අනුව තීරණය වීම, සමාජ සම්බන්ධතාවල මූලික පදනම ඥාතීත්වය වීම යනාදිය යි.

එමෙන් ම එමිල් ඩුර්කයිම්ගේ න්‍යායාත්මක රාමුවට අනුව සාම්ප්‍රදයික සමාජ නියෝජනය වන්නේ යාන්ත්‍රික ඒකාබද්ධතාවෙන් ය. ඩුර්කයිම් විසින් ඉදිරිප් කළ යාන්ත්‍රික සමාජ ලක්ෂණ ද වේබර් දක්වන ලද සාම්ප්‍රදයික සමාජ ලක්ෂණ හා බොහෝ දුරට සමාන ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය
- විස්තර කිරීම්
- ඉදිරිපත් කිරීමේ ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සාම්ප්‍රදායික ශ්‍රී ලාංකීය සමාජය තුළ දක්නට ඇති යහපත් සමාජ ගති ලක්ෂණ ප්‍රවර්ධනය කරගැනීමේ වැදගත්කම අගයයි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්
- බ්‍රිස්ටල් බෝඩ්
- A4 ෂීට්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සාම්ප්‍රදායික සමාජ අධ්‍යයනය කිරීම සඳහා සම්භාව්‍ය සමාජ විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කර ඇති මතවාද යොදා ගත හැකි ආකාරය පහදන්න.
- පාර භෞතික යාන්ත්‍රික හා සාම්ප්‍රදයික අවධි පිළිබඳ ඉගැන්වීම් වෙන වෙනම පැහැදිලි කරමින් පාඩමට පිවිසෙන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සම්භාව්‍ය න්‍යායයන් අන්තර්ගත පුවරු 2ක් නිර්මාණය කිරීම<br>1 මැක්ස් වේබර් = සාම්ප්‍රදායික ආධිපත්‍යය<br>2 එමිල් ඩුර්කයිම් = යාන්ත්‍රික ඒකාබද්ධතාව | ප්‍රදර්ශනය |
| යාන්ත්‍රික එකාබද්ධතා ලක්ෂණ සහිත සාම්ප්‍රදායික ශ්‍රී ලාංකීය සමාජය හඳුන්වන්න. | විස්තර කථනය |
| පාරභෞතික අවදියට අයත් ගති ලක්ෂණ පුවරුවක ලියා පෙන්වන්න. | ප්‍රදර්ශනය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සාම්ප්‍රදායික ආධිපත්‍යය ශ්‍රී ලාංකීය සමාජය තුළ ක්‍රියාත්මක වූ ආකාරය පැහැදිලි කිරීම.
- සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික සමාජයෙන් හමුවන හා නවීන ශ්‍රී ලාංකීය සමාජය තුළ දක්නට නොලැබෙන යහ ධර්ම 05ක් ඉදිරිපත් කිරීම.

**නිපුණතාව - සමාජ පරිණාමී ක්‍රියාවලිය අධ්‍යයනය කරයි.**

**නිපුණතා මට්ටම-** 2.2 සම්භාව්‍ය න්‍යාය ඇසුරින් නවීන ශ්‍රී ලාංකීය සමාජය පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 04**

**ඉගෙනුම් පල**

1. නවීන සමාජ පිළිබඳ සම්භාව්‍ය න්‍යාය හඳුන්වයි.
2. සම්භාව්‍ය න්‍යාය ඇසුරින් ශ්‍රී ලාංකීය නවීන සමාජය අර්ථ දක්වයි.
3. නවීන ශ්‍රී ලාංකීය සමාජයෙන් හමුවන ඓන්ද්‍රීය ලක්ෂණ නිදසුන් දෙමින් පැහැදිලි කරයි.

**හැඳින්වීම -**

මිනිසා විසින් නව දැනුම උත්පාදනය කර ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස අභිවෘද්ධිය කරා පිය නගන ලද්දේ ය. සරළ සාම්ප්‍රදායික සමාජයක සිට සංකීර්ණ නූතන සමාජය කරා මිනිසා පැමිණ ඇත්තේ ඔහු විසින් අත්පත් කරගනු ලැබූ මෙකී නව දැනුමට අනුව ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ය.

සීමිත සම්බන්ධතා වෙනුවට පුළුල් විශ්වීය සම්බන්ධතා මේ යුගයේ දී නිර්මාණය වන අතර මනුෂ්‍යත්වය වෙනුවට ආර්ථික අරමුණු පෙරට ආවේ ය. සමාජ ප්‍රගතියේ උසස් ම අවධිය ලෙස ඔගස්ට් කොම්ට් දක්වා ඇත්තේ ඉහත සඳහන් යථානුභූත අවධිය යි. මීට අමතරව, ඓන්ද්‍රීය අවධිය, තාර්කික අවධිය, කාර්මික සමාජය, ධනේෂ්වර, සමාජවාදී හා සුපිරි කොමියුනිස්ට් යනාදී තේමාවන් මෙහි දී සාකච්ඡාවට බඳුන් වේ.

සමාජ ක්‍රමය වේගයෙන් හා දිගු කාලීනව වෙනස් කරන බලවේග 04ක් පිළිබඳ සමාජ විද්‍යාඥයින් විසින් අදහස් දක්වා ඇත.
එනම්, නවීකරණය
නාගරීකරණය
බටහිරකරණය
කාර්මිකකරණය යනුයි.

විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුවේ ප්‍රතිඵලයක් ලෙස බටහිර රටවල කාර්මික සංවර්ධනය ක් ඇති වූයේ ය. කාර්මික නිෂ්පාදන අලෙවිය අරමුණුකොට ගෙන නාගරික සමාජ බිහි විය. කාර්මික භාණ්ඩ පරිහරණය කිරීමට හුරුවීමේ ප්‍රතිඵලයක් ලෙස මිනිසාගේ අදහස් ආකල්ප හා ඇවතුම් පැවතුම් අලුත් හැඩයක් ගත්තේ ය. මෙම තත්ත්වය නවීකරණය ලෙස හඳුන්වනු ලබයි. මහා පරිමාණයෙන් නිපදවනු ලබන කාර්මික භාණ්ඩ අලෙවි

කර ගැනීමට නව වෙළෙඳපොලවල් සොයා ගතයුතු විය. ආසියානු හා අප්‍රිකානු රටවල නව වෙළෙඳපොළවල් ඉදි වන්නේ එහි ප්‍රතිඵලයක් ලෙස ය. මෙකී රටවල මිනිසුන් අතර කාර්මික භාණ්ඩ ප්‍රචලිත කිරීම එතරම් පහසු වූයේ නැත. ඒ සාම්ප්‍රදයික මතධාරීන් වූ හෙයිනි. කෙසේ වූව ද පසු කාලයේ දී බටහිර රටවල නවීන සිරිත් විරිත් ඇමතුම් පැවතුම්, ජීවන විලාසිතවන් ද මෙම රටවල ප්‍රචලිත කරනු ලැබේ. එයින් පසු මෙම කලාපවල මිනිසුන් විසින් කාර්මික නිෂ්පාදන මිල දී ගැනීම හා පරිශීලනය වේගවත් විය. මෙම ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ බටහිරකරණය යනුවෙන් ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- දේශන ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සාම්භාව්‍ය න්‍යාය ඇසුරින් ශ්‍රී ලාංකීය සමාජය අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්
- බ්‍රිස්ටල් බෝඩ්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- යථානුභූත අවධිය
- ඓන්ද්‍රීය අවධිය
- කාර්මික සමාජය
- ධනේෂ්වර අවධිය
- සුපිරි කොමියුනිස්ට් යන අවධි පිළිබඳ ශිෂ්‍යයා දනුවත් කරන්න.
- නවීන සමාජ පිළිබඳ සම්භාව්‍ය න්‍යාය ඇසුරින් නූතන සංකීර්ණ ශ්‍රී ලාංකීක සමාජය විස්තර කිරීම

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සාම්ප්‍රදායික සමාජය සහ නවීන සමාජය අතර දක්නට ලැබෙන සුවිශේෂි වෙනස්කම් ඇසුරෙන් සංවාදයක් පිළියෙල කරන්න.<br>සංවාදය ගොඩනැගිය යුත්තේ සුවිශේෂී වෙනස්කම් 10ක් ගෙන වෙනස්වීම සුභදායක හෝ අසුභදායක බව අසන්නන්ට පැහැදිලි වන අයුරිනි. | කණ්ඩායම් දෙකක් නම්කර<br>A කණ්ඩායම සුභදයක බව ප්‍රකාශ කරයි.<br>B කණ්ඩායම අසුභදයක බව ප්‍රකාශ කරයි.<br>සිසුන් ප්‍රමාණවත් නොවේ නම් ගුරුවරයා හා ශිෂ්‍ය අතර සංවාදය ප්‍රශ්නකරණය ඔස්සේ සකස් කරන්න. |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- නවීන ශ්‍රී ලාංකීක සමාජය සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික සමාජයට වඩා ලබා ඇති දියුණුව පිළිබඳ උදහරණ 03ක් ඉදිරිපත් කිරීම.
- සම්ප්‍රදායික ශ්‍රී ලාංකීය සමාජයේ දක්නට ලැබුණු යහ චර්යා 05ක් දැක්වීම.

**නිපුණතාව** - සමාජ පරිණාමී ක්‍රියාවලිය අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම-** 2.3 නව සොයා ගැනීම් සමාජ පරිණාමී ක්‍රියාවලියේ ගාමක බලවේගය බව තේරුම් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 03**

**ඉගෙනුම් පල**

1. සමාජ පරිණාමය කෙරෙහි ඉවහල් වූ නව සොයා ගැනීම් හඳුන්වයි.
2. සමාජ පරිණාමය කෙරෙහි බලපාන ලද නව සොයා ගැනීම් ලැයිස්තුගත කරයි.

**හැඳින්වීම**

මානව පරිණාමයේ ආරම්භක මුල් යුගයේ සිට නූතන සමාජ අවධිය දක්වා මිනිසා විසින් කරන ලද නව සොයා ගැනීම් හා නිමැවුම් ප්‍රමාණය නිශ්චිත ලෙස ගණනය කර දැක්විය නොහැකි තරම් ය. එහෙත් සමාජ පරිණාමී ක්‍රියාවලිය සඳහා සෘජුව හා වක්‍රව බලපෑම් කළ එවැනි දෑ පිළිබඳ සොයා බැලිය යුතු ය.

ඇතැම් සාධකවල බලපෑම නිසා සමාජයක සුළු වෙනස්කම් කෙටි කාලයක් තුළ ඇති වන ආකාරය හඳුනාගත හැකි අතර ඇතැම් සාධකවල බලපෑම මත සමාජයක් තුළ ස්ථාවර වූ කල්පවත්නා වෙනස්කම් ඇති වේ. දිගු කාලීන ව සමාජය වෙනස් වීම සඳහා හේතුවන මෙවැනි නව සොයා ගැනීම් පිළිබඳ මෙහි දී අධ්‍යයනය කෙරේ. ඒ අතර ගින්දර සොයා ගැනීම, රෝදය, යකඩ, වාෂ්ප බලය, පෙට්‍රෝලියම් වැනි නව සොයා ගැනීම් සමාජ පරිණාමී ක්‍රියාවලියේ ගාමක බලවේග බවට පත් වූ අයුරු විස්තර කරනු ලැබේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශනය
- ඉදිරිපත් කිරීම

**ආකල්ප හා ඇගයුම්**

1. නව සොයා ගැනීම් සමාජ පරිණාමී ක්‍රියාවලියේ ගාමක බලවේගය බව අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්
- රූප රාමු
- ලිපි ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- මානව පරිණාමී ක්‍රියාලියේ වැදගත් සොයා ගැනීම් 05ක් නම් කරන්න.
- නව සොයා ගැනීම් හේතුවෙන් සමාජ ජීවිතය පහසු වූ බව නිදසුන් 03ක් ඇසුරෙන් පැහැදිලි කරන්න.
- ගෝලීයකරණය වෙමින් පවත්නා සමාජයක විවිධ ගැටලු සහගත තත්ත්වයන් නිර්මාණය වන බව නිදසුන් 02ක් සමගින් සාකච්ඡා කරන්න.
- නව සොයායෑම් හේතුවෙන් සමාජය තුළ ගොඩනැගෙන අසහනකාරී වටපිටාව සමනය කරන හා සමාජය සුවපත් කරන නව සොයා ගැනීම් කිරීමේ වැදගත්කම අගය කරන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| මානව සමාජයේ ප්‍රගතිය උදෙසා නව සොයා ගැනීම්වල වැදගත්කම සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| මානව පරිණාමී ක්‍රියාවලියේ දී බලපෑ නව සොයා ගැනීම් 10ක් ලේඛනගත කරන්න. | ලේඛණගත කිරීම |
| එම සොයා ගැනීම් මානව සමාජය කෙරෙහි බලපෑම් කළ අයුරු වගුගත කර දක්වන්න. | වගුගත කිරීම |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- මානව සමාජයේ ප්‍රබල නව සොයා ගැනීම් 10ක් නම් කිරීම.
- නව සොයා ගැනීම් හේතුවෙන් ඇති වූ කාර්ය සඵලතාවය සඳහා නිදසුන් 05ක් ඉදිරිපත් කිරීම.
- නව සොයා ගැනීම් හේතුවෙන් සමාජය තුළ ඇති වූ ගැටලුකාරී අවස්ථාවන් සඳහා නිදසුන් 04ක් ඉදිරිපත් කිරීම.
- සමාජ පරිණාමී ක්‍රියාවලියේ ගාමක බලවේගය නව සොයා ගැනීම් බව නූතන සමාජයේ ඔබ දකින සාධක 04ක් ඇසුරින් පැහැදිලි කිරීම.

**නිපුණතාව** - සමාජ පරිණාමී ක්‍රියාවලිය අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම-** 2.4 නූතන සමාජ පරිණාමය වේගවත් කරන බලවේග අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 04**

**ඉගෙනුම් පල**

1. නූතන සමාජ වෙනස් වීම හඳුන්වයි.
2. නූතන සමාජ වෙනස් වීම සඳහා පදනම් වූ බලවේග නිදසුන් ඇසුරින් පැහැදිලි කරයි.

**හැඳින්වීම** -

සමස්ත ලෝකය ම විශ්ව ගම්මානයක් බවට පත් කළ හැකි තත්ත්වයට නූතන සන්නිවේදන තාක්ෂණය සුවිශාල දියුණුවක් ලබා ඇත. අනෙකුත් සමාජ ආර්ථික කටයුතු දියුණු කර ගැනීමට මෙන්ම වේගවත් කර ගැනීමට ද මෙම තත්ත්වය මහෝපකාරී වේ.

සමාජ වෙනස්වීම පිළිබඳ කරුණු අධ්‍යයනය කරනු ලබන සමාජ විද්‍යාඥයින් විසින් ප්‍රාථමික අවධියේ සිට කාර්මික යුගය ලෙස නම්ලත් නූතන අවධිය දක්වා ලෝක සමාජය වෙනස් වන ආකාරය අවධාරණය කරයි. මෙහිදී එම වෙනස්වීම හෙවත් පරිණාමය වේගවත් කරනු ලබන කාර්මිකකරණය, වාණිජකරණය, නාගරීකරණය, නවීකරණය, බටහිර කරණය පිළිබඳ බලවේග පිළිබඳ අවධානය යොමු කරනු ලැබේ.

නූතන සමාජයන්හි කැපී පෙනෙන තවත් ප්‍රබල බලවේගයක් නම් ලෝක වෙළෙඳපොළ ආර්ථිකයයි. ලෝක වෙළෙඳ පොළේ ඇතිවන මිල උච්චාවචනය ග්‍රාමීය කුඩා පරිමාණ නිෂ්පාදකයාට පවා බලපෑම් ඇතිකරනු ලැබේ. සෑම සාමාජිකයකු ම පාහේ මෙම බලපෑමට යටත්වන පරිදි නවීන ජීවන රටාව නිර්මාණය වී තිබේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශනය
- ඉදිරිපත් කිරීම
- විස්තර කිරීම

**ආකල්ප හා ඇගයුම්**

1. නූතන සමාජ වෙනස් වීම කෙරෙහි සන්නිවේදන මාධ්‍යයේ බලපෑම තේරුම් ගෙන ප්‍රකාශ කරයි

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්
- බ්‍රිස්ටල් බෝඩ්
- ලිපි ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- නූතන සමාජ වෙනස් වීම සඳහා තුඩු දෙන ප්‍රධාන බලවේග විමසමින් පාඩමට පිවිසීම.
- නූතන සමාජ තුළ වැඩි වශයෙන් දක්නට ඇති තාක්ෂණික මෙවලම් පිළිබඳ සාකච්ඡා කරන්න.
- තාක්ෂණික දියුණුව නිසා මතුවන අයහපත් බලපෑම් පිළිබඳව සිසුන් හා සාකච්ඡාවේ යෙදෙන්න.
- නූතන සමාජ වෙනස් වීම සඳහා පාදක වූ බලවේගවල පවත්නා සමාජ හිතකර ස්වභාවය පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| නාගරීකරණය නිසා පැරණි ගම පාලුවී ගිය ස්වභාවය මනාව ඉස්මතු කර දැක්වීම සඳහා බ්‍රිස්ටල් බෝඩයක් භාවිතා කර අලංකාර සිතුවමක් චිත්‍රණය කරන්න | චිත්‍රකරණය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- කාර්මිකරණය සඳහා තුඩුදුන් හේතු සාධක 05ක් නම් කිරීම.
- නාගරීකරණය නිසා මතු වූ ගැටලු 05ක් දැක්වීම.
- නවීකරණ ලක්ෂණ 02ක් කෙටියෙන් හැඳීන්වීම.
- බටහිරකරණය වීම නිසා ශ්‍රී ලාංකීය සමාජය තුළ ස්ථාපිත වූ ප්‍රධාන ආයතන 02ක් නම් කිරීම.

**නිපුණතාව** - සමාජ පරිණාමී ක්‍රියාවලිය අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම-** 2.5 බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් සමාජ පරිණාමී ක්‍රියාවලිය විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 03**

**ඉගෙනුම් පල**

1. සමාජ පරිණාමී ක්‍රියාවලිය බෞද්ධ ඉගැන්වීම් වලට අනුකූලව පැහැදිලි කරයි.
2. සමාජ පරිණාමී ක්‍රියාවලිය බෞද්ධ ඉගැන්වීම් අනුව ප්‍රත්‍යක්ෂ කර ගනිමින් තුලනාත්මකව විස්තර කරයි.

හැඳින්වීම -

බුදු දහම යනු බුද්ධිය හා සදාචාරය මත පදනම් වූ ජීවන දර්ශනයක් වන්නේ ය. පරිණාමය පිළිබඳ තර්කානුකූල විග්‍රහයක් බුදු දහම මගින් ඉදිරිපත් කරයි. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රය, වාසෙට්ඨ හා කූට දන්ත සූත්‍ර මේ සඳහා මූලාශ්‍ර සපයයි.

අග්ගඤ්ඤ සූත්‍රයේ දී, මානවයා ආලෝක දහරා විහිදුවමින් ගමන් කොට පෘථිවියේ පා තබා ස්වයංජාත ඇල් සහල් අනුභව කොට, රස තෘෂ්ණාව හේතුවෙන් ආධ්‍යාත්මික ශක්තීන් හීනවී යාම, සමාජ ප්‍රශ්න ඉස්මතු වීම, ඒවා නිවාරණය සඳහා විධිමත් පාලන තන්ත්‍රයක් නිර්මාණය වීම යන කරුණු පැහැදිලි කරයි.

කූට දන්ත සූත්‍රයේ දී, රටේ පාලකයා විසින් ජනතාවගේ ආර්ථික සංවර්ධනය උදෙසා ක්‍රියාකළ යුතු ආකාරය විස්තර කෙරේ. මෙයට අමතරව කෙනෙකු සිය ආර්ථික ක්‍රියාදාමය සවිමත් කරගත යුතු ආකාරය සිඟාලෝවාද සූත්‍රයේ දී උගන්වනු ලැබේ.

කාර්මිකකරණය, වාණිජකරණය, නාගරීකරණය, නවීකරණය හා බටහිරකරණය හේතුවෙන් මතු වූ සමාජ ගැටලු පාලනය සඳහා ධර්මානුකූල විවරණයක අවශ්‍යතාව දැඩි ව උද්ගතව ඇත. එකී විශ්ව සාධාරණ අවශ්‍යතාව වෙනුවෙන් වඩාත් අර්ථාන්විත මැදිහත් වීමක් කිරීමට තරම් ප්‍රමාණවත් ප්‍රතිපාදන බුදු දහමේ අන්තර්ගත වන බව පෙන්වා දිය හැකි ය.

ගොවිතැන, වෙළෙඳාම, කර්මාන්ත යන ජීවිකා වෘත්තීන් බුදු දහම මගින් අනුමත කරනු ලැබේ. එහෙත් එකී ජීවිකා වෘත්තීන් නිවැරදි ලෙස හෙවත් මෙලොව ජීවිතය මෙන් ම පරලොව ජීවිතය ද සැපවත් වන ආකාරයට පවත්වාගෙන යාම සඳහා බුදු දහම මගින් මග පෙන්වනු ලබයි. එනම් ධර්මානුකූල අයුරින් හෙවත් සමාජශීලී ලෙස ජීවිකා වෘත්තියෙහි නියැලෙන ආකාරය යි. එසේ වුවහොත් තමාට මෙන් ම සෙසු සාමාජිකයන්ට ද, කායික, මානසික සුවය සැලසෙනු ඇත. ආරෝග්‍යය, අන්‍යෝන්‍ය විශ්වාසය හා සතුට සමග නිවන් මගට මංපෙත් විවර කරන සමාජයක් කරා ගමන් කිරීම බෞද්ධ සමාජ පරිණාමයේ සැබෑ අර්ථය වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශනය
- ඉදිරිපත් කිරීම්
- විස්තර කිරීම්

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ පරිණාමය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම ඇගයීමට ලක් කරයි.
2. බෞද්ධ ඉගැන්වීම් අනුව සමාජ පරිණාමී ක්‍රියාවලිය අධ්‍යයනය කොට එකී ක්‍රියා තර්කානුකූලව වටහා ගනියි.
3. සමාජ පරිණාමී ක්‍රියාවලිය බෞද්ධ ඉගැන්වීම් අනුව තුලනය කිරීමට පෙළඹෙයි.
4. සමාජ පරිණාමී ක්‍රියාවලිය සඳහා තුඩුදෙන සමාජ, ආර්ථික, සංස්කෘතික පසුබිම් බෞද්ධ ඉගැන්වීම් අනුව තුලනය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්
- මූලාශ්‍ර
- ලිපි ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සමාජ පරිණාමය පිළිබඳ විග්‍රහයන් දක්වෙන බෞද්ධ සූත්‍ර 03ක් හඳුන්වන්න.
- සමාජ පරිණාමය සඳහා පාදක වූ සාධක 02ක් බෞද්ධ සූත්‍ර ඇසුරින් විස්තර කර දෙන්න.
- සමාජ පරිණාමී සිද්ධාන්තය ගම්‍ය වන ජාතක කථා කිහිපයක් ගෙන සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ පරිණාමය පිළිබඳ ඉගැන්වෙන සූත්‍ර 03ක් සාරාංශ කර දක්වන්න. | ලේඛනය |
| සමාජ ජීවිතය ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා යුතුකම් වගකීම් මෙන්ම ආර්ථික කළමනාකරණය ද ඉතා වැදගත් වේ. සිගාලෝවාද - ව්‍යග්ඝපජ්ජ සූත්‍ර දේශනානුසාරයෙන් ශිෂ්‍ය සමිතියේ කතාවක් ඉදිරිපත් කිරීම. | කථනය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සමාජ පරිණාමය පිළිබඳ ඉගැන්වෙන සූත්‍ර 03ක් නම් කිරීම.
- බෞද්ධ පුදපූජා විධි නවීන සමාජයට අනුරූපව වෙනස් වී ඇති ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කිරීම.
- ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් මෙලොව දියුණුව සඳහා හේතුවන කරුණු 04 නම් කිරීම.
- ආර්ථික දියුණුව සලසන කළමනාකරණ විධි දක්වෙන "ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය" ගාථාව සම්පූර්ණ කිරීම.

### සංස්කෘතිය

**නිපුණතාව** - සංස්කෘතිය යන්න අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම-**

3.1 සංස්කෘතිය පිළිබඳ න්‍යායාත්මක විග්‍රහය සනොක්ෂණය කරයි.

3.2 සංස්කෘතික සංරචක ඇසුරින් ශ්‍රී ලංකාවේ සංස්කෘතිය පැහැදිලි කරයි.

3.3 පෞරුෂ වර්ධනයෙහිලා සංස්කෘතියේ කාර්යභාරය ගවේෂණය කරයි.

3.4 ගෝලීය ප්‍රවණතා සංස්කෘතියට බලපාන ආකාරය විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 08**

හැඳින්වීම -

කිසියම් සමාජයක අනන්‍යතාව සංස්කෘතියෙන් පිළිබිඹු වේ. සමාජයක පදනම ඊට අයත් සංස්කෘතිය යි. සමාජය පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගැනීම සඳහා සංස්කෘතිය අධ්‍යයනය කිරීම අනිවාර්ය වේ. සමාජය හා සංස්කෘතිය අතර අවියෝජනීය සම්බන්ධතාවක් තිබීම ඊට හේතුවයි. සංස්කෘතිය යන්න නිර්වචනය කිරීම සඳහා බොහෝ සමාජ විද්‍යාඥයින් උත්සුක වී ඇත. එම උත්සාහයන්හි ප්‍රතිඵල වශයෙන් සංස්කෘතිය යන්නට නිර්වචන රාශියක් ඉදිරිපත් වී තිබේ. සංස්කෘතිය පිළිබඳව අදහස් දක්වන රේමන්ඩ් විලියම්ස් (Ragmond Williams) ගේ අදහස වන්නේ සංස්කෘතිය (Culture) යන වචනය ඉංග්‍රීසි භාෂාවේ ඇති ඉතා සංකීර්ණම වචන දෙක තුනෙන් එකක් බවයි. සංකීර්ණ සංකල්පයක් වන සංස්කෘතිය යන්න අර්ථ දැක්වීම සඳහා ඉදිරිපත් වී ඇති නිර්වචන අතුරින්

ඊ. බී. ටයිලර් (E. B. Tylor)

රැල්ෆ් ලින්ටන් (Ralph Linton)

ආර්. බ්‍රවුන් (R. Brown)

යන අයගේ නිර්වචන පිළිබඳ මෙහිදී අවධානය යොමු කෙරේ.

මිනිසා විසින් නිර්මාණය කර ගනු ලබන භෞතිකවූත් අභෞතිකවූත් සියල්ලෙහි එකතුව සංස්කෘතියයි. මේ අනුව සිරිත්, විරිත් සම්ප්‍රදායයන්, නීති - රීති, භාෂාව, සාහිත්‍යය, ආගම, දහම, ආහාර රටා, තාක්ෂණය යන සියල්ල සංස්කෘතියට අයත් වේ. අප ජීවත්වන සමාජයෙහි එක් එක් ජන කණ්ඩායම් අතර ඉහත සඳහන් අංගවලට සාපේක්ෂ වූ වෙනස්කම් දක්නට ලැබේ. එම වෙනස්කම් මගින් ඔවුන්ගේ වාර්ගික අනන්‍යතාව ප්‍රකට කරයි. ඔවුනොවුන්ගේ සංස්කෘතිය මේ යැයි පැහැදිලි කරගත හැකි වන්නේ මෙම වෙනස්කම් වලට අනුව යි.

කෙනෙකුගේ පෞරුෂය ගොඩ නැගෙන්නේ ඔහු ජීවත්වන සමාජ පරිසරයට අනුවය. තම වැඩිහිටියන්ගේ මග පෙන්වීමට අනුකූල සමාජානුයෝජනය මගින් එකී පෞරුෂය නිර්මාණය කරයි. ඒ සඳහා පදනම් වන්නේ ඔහු අයත්වන සමාජයේ සංස්කෘතිය යි. යම් කිසි සමාජයක ආක්‍රමණශීලි චරිත ලක්ෂණ පොදු අනන්‍යතාව වන්නේ නම් එහි සෑම කෙනෙකුම ආක්‍රමණශීලි වෙයි. ඒ අනුව එය සංස්කෘතික අංගයක් බවට පත් වේ. එසේම සමාජ පරිසරය යහපත් එකක් වනවිට එම තත්ත්වය ග්‍රහණය කර ගැනීමෙන් සැකසෙන පුද්ගල පෞරුෂය ද සාමකාමී එකක් බවට පත් වෙයි.

ජාතික සංස්කෘතික අනන්‍යතාව ගෝලීය ප්‍රවණතා හමුවේ අභියෝගයට ලක්වන බව පෙනී යයි. කාර්මීකරණය, නාගරිකරණය, වානිජකරණය වැනි තත්ත්වයන් හමුවේ මානව සමාජයේ සිදුවන වෙනස්වීම් සංචාරය, විද්‍යුත් මාධ්‍ය, අන්තර්ජාලය වැනි මාධ්‍ය මාර්ගයෙන් ලොව පුරා ඉතා සිසුයෙන් පැතිරී යයි. මේ තත්ත්වය හමුවේ ලෝකය විශ්ව ගම්මනායක් බවට පත්ව තිබේ. මෙහි දී වන සංස්කෘතික විසරණය අප වැනි සංස්කෘති වේගවත් වෙනසකට ලක් කිරීමට සමත් වී ඇත. මේ තත්ත්වය මත එක් සමාජයකට අනන්‍ය වූ සංස්කෘතියක් නොවෙනස්ව පවත්වා ගෙන යාම උගහට වී තිබේ. නිදසුනක් ලෙස ශ්‍රී ලාංකික බෞද්ධ සමාජය වෙත අනපේක්ෂිත වූ සිරිත් - විරිත්, ධර්මතා, ප්‍රතිමාන ආදිය බැහැරින් ගලා එන අතර ඊට අනුරූපව මෙරට සංස්කෘතිය වෙනස් වේ.

**නිපුණතාව** - සංස්කෘතිය යන්න අධ්‍යයනය කරයි

**නිපුණතා මට්ටම-** 3.1 "සංස්කෘතිය පිළිබඳ න්‍යායාත්මක මත සත්‍යාක්ෂණය කරයි"

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. සංස්කෘතිය පිළිබඳ න්‍යායාත්මක මත ඉදිරිපත් කරයි.
2. සංස්කෘතිය පිළිබඳ න්‍යායාත්මක මතවාද ඇසුරින් සංස්කෘතිය යනු කුමක් දැයි හඳුනාගෙන ප්‍රකාශ කරයි.
3. සංස්කෘතිය නම් සාධකය අපගේ සමාජයෙහි ක්‍රියාත්මක වන ආකාරය පෙන්වා දෙයි.

හැඳින්වීම -

යම් තැනක අප දකින සමාජීය ජීවන ක්‍රමය සංස්කෘතියේ පිළිබිඹුවයි. එකී සමාජය තේරුම් ගැනීමට නම් සංස්කෘතිය පිළිබඳ විධිමත් ලෙස අධ්‍යයනය කළ යුතු ය. සාමාජික යා විසින් නිර්මාණය කරගත් ආම්පන්න මෙන් ම ඔහුගේ ආධ්‍යාත්මික ගුණ ධර්ම සියල්ල ද සංස්කෘතියට අයත් වේ. සංස්කෘතිය යන සංකල්පය විග්‍රහ කර ගැනීම අපහසු වී ඇත්තේ එහි පවතින විෂම වූත් සංකීර්ණවූත් ස්වභාවය නිසා ය. සංස්කෘතිය හා සම්බන්ධයෙන් නිර්වචන සැපයීමට සමාජ මානව විද්‍යාඥයින් වැඩි වෙහෙසක් ගෙන ඇත්තේ ද මේ නිසා ය.

සංස්කෘතිය යන්න විග්‍රහ කළ ඊ. බී. ටයිලර්ගේ අදහස වූයේ ඕනෑම පුද්ගලයෙකු සමාජීය සත්ත්වයෙකු වශයෙන් ලබා ගන්නා දැනුම, විශ්වාස, කලාව, සාරධර්ම, සිරිත් විරිත් හා වෙනත් හැදියාවන් හා හුරු පුරුදු ආදියෙහි එකතුව සංස්කෘතිය වන බවයි.

"රැල්ෆ් ලින්ටන්" ගේ මතය වන්නේ "මිනිසා පරම්පරාවෙන් පරම්පරාවට දායාදයක් වශයෙන් ගෙනයන ජීවන රටා සමුදාය" සංස්කෘතිය වන බවයි. මෙමගින් ලින්ටන් සංස්කෘතිය යන්න සමාජයෙන් උරුම කරගනු ලබන ඊළඟ පරම්පරාවට සම්ප්‍රේෂණය කරන දැනුම් සම්භාරයක් වශයෙන් හැඳින්වීමට උත්සාහ ගෙන ඇති ආකාරය පෙනේ.

"අප සමාජයේ ජීවත් වීමෙන් ලබා ගන්නා කාටත් පොදු වූ, නිතර භාවිත කෙරෙන, අනාගත පරපුරට ද භාර දෙන හැසිරීම් ක්‍රමය පිටුපස ඇති සංකල්පමය රාමුව සංස්කෘතිය" බව ආර්. බ්‍රවුන්ගේ මතයයි.

සාමාජිකයා තමා අයත් සමාජයෙන් උරුම කර ගන්නා අනාගත පරපුරට භාරදෙනු ලබන හැසිරීම්වලට පාදක වූ සංකල්ප සමූහය සංස්කෘතිය ලෙස ඔහු විස්තර කර ඇත. සාමාජිකයා සමාජීය සත්ත්වයෙකු ලෙස හැඩ ගස්වනු ලබන බලවේගය සංස්කෘතිය ලෙස හඳුනා ගැනීමට ඔහු උත්සාහ ගෙන ඇත.

මේ නිර්වචනවල දක්වෙන බොහෝ අදහස් හා සංකල්ප සිංහල සංස්කෘතිය ඇසුරින් පැහැදිලි කළ හැකි ය. තමාගේ සමාජයෙන් ලබා ගන්නා දැනුම, එම දැනුම අනාගත සමාජයට භාරදීම සහ එමගින් සංස්කෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාම මෙරට සමාජයට ද පොදු තත්ත්යන් වේ. සිරිත් - විරිත් සාරධර්ම ආදියෙහි ඇති වලංගුතාවය වැනි කරුණු ඔස්සේ මේ න්‍යායාත්මක සිද්ධාන්ත අප සමාජවල ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කළ හැකි ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සංස්කෘතිය පිළිබඳ න්‍යායාත්මක මතවාදවල ඇතුළත් ඉගැන්වීම් අප සමාජයේ ක්‍රියාත්මක වන ආකාරය හඳුනා ගනී.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්වචන සඳහන් කරන ලද කාඩ්පත්
- ලියන කඩදාසි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- ඊ. බී ටයිලර්, රැල්ෆ් ලින්ටන්, ආර් බ්‍රවුන් යන තිදෙනා විසින් ඉදිරිත් කර ඇති නිර්වචන කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරන්න.
- හතරවන ශ්‍රේණියේ දී ලබාගත් දැනුම යළි අවදි කරන්න.
- නිර්වචනවලින් ඉදිරිපත් වූ ලක්ෂණ තමා අයත් සංස්කෘතිය තුළ ක්‍රියාත්මක වන ආකාරය හඳුනා ගැනීමට මඟ පෙන්වන්න.
- එක් එක් කණ්ඩායම් වලට (සිසුවාට) එක් නිර්වචනය බැගින් ලබා දී එහි ලක්ෂණ තමාගේ සංස්කෘතිය තුළ ක්‍රියාත්මක වන ආකාරය ගවේශණය කිරීමට මඟ පෙන්වන්න.
- තමාගේ නිගමන පංතියට ඉදිරිපත් කිරීමට ඉඩ සලසන්න.
- ඇගයීම ද එම අවස්ථාවේ දී ම කරන්න.

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ඊ. බී. ටයිලර්, රැල්ෆ් ලින්ටන් ආර්. බ්‍රවුන් යන තිදෙනා සංස්කෘතිය සඳහා ඉදිරිපත් කර ඇති නිර්වචන පිළිබඳ සිසුන් දැනුවත් කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් තුනකට වෙන් කිරීම හා ඒ ඒ කණ්ඩායමට (හෝ සිසුවාට) නිර්වචන වෙන් කර දීම හා නිර්වචනවල ලක්ෂණ පැහැදිලි කරදීම. | සාකච්ඡා ක්‍රමය |
| එක් එක් කණ්ඩායමට අදාළ නිර්වචනවල ලක්ෂණ තමා අයත් සංස්කෘතිය තුළ ක්‍රියාත්මක වන ආකාරය සත්‍යාක්ෂණය කිරීම. | කණ්ඩායම් හෝ කේවල ක්‍රමය |
| තම කණ්ඩායම විසින් අනාවරණය කර ගත් කරුණු වාර්තාගත කිරීම හා පංතියට ඉදිරිපත් කිරීම. | ඉදිරිපත් කිරීම් |
| ඉදිරිපත් කළ කරුණු ඇගයීම හා ඌන පූරණය කිරීම. | සාකච්ඡා ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- රැල්ෆ් ලින්ටන්, ඊ. බී. ටයිලර්, ආර් බ්‍රවුන් යන තිදෙනා සංස්කෘතිය පිළිබඳ ලියා ඇති නිර්වචන ඉදිරිපත් කිරීම.
- සංස්කෘතිය ඊළඟ පරම්පරාව වෙත පැවරීමේ ක්‍රියාවලිය පැහැදිලි කිරීම.
- සමාජයේ කොටස්කරුවෙකු වශයෙන් සමාජයෙන් ඉගෙන ගත් සිරිත් - විරිත් පිළිබඳ විස්තර කිරීම.
- සිංහල බෞද්ධයන් වශයෙන් අපගේ වැඩිහිටියන්ගෙන් ලබාගත් උසස් ජීවන හර පිළිබඳ විස්තර කිරීම.
- අනාගත පරපුරට යහපත් ගති සිරිත් හුරුකර වීමෙන් සමාජයකට ලැබෙන ප්‍රතිලාභ පැහැදිලි කිරීම.

**නිපුණතාව** - සංස්කෘතිය යන්න අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම**- 3.2 විවිධ සංරචක ඇසුරින් ශ්‍රී ලංකාවේ සංස්කෘතිය පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. සංස්කෘතිය හා පෞරුෂ වර්ධනය අතර සම්බන්ධතාව පෙන්වා දෙයි.
2. සාරධර්මවල ක්‍රියාකාරීත්වය හඳුනාගෙන විස්තර කරයි.
3. සාරධර්ම ඇසුරින් ශ්‍රී ලාංකික සංස්කෘතිය පිළිබඳ විග්‍රහ කරයි.
4. සංස්කෘතික විසරණය බටහිරකරණය ඇසුරින් පැහැදිලි කරයි.

හැඳින්වීම -

- සංස්කෘතික ලැග්ම
- සංස්කෘතික ගැටුම
- සංස්කෘතික විසරණය
- ප්‍රතිමාණ, ඇගයුම් හා සාරධර්ම යන සංරචකයන් ශ්‍රී ලාංකික සංස්කෘතියෙහි ක්‍රියාත්මක වන ආකාර විමසමින් එහි විශේෂත්වය පිළිබඳ අධ්‍යයනය කළ හැකි ය.

සංස්කෘතික ලැග්ම විලියම් එෆ් මග්බර්න් විසින් හඳුන්වා දුන් සංකල්පයකි. සංස්කෘතියේ පසුබෑම, සංස්කෘති සුනංගුව යනුවෙන් ද මේ තත්වය හැඳින්වේ. භෞතික සංස්කෘතියේ හා අභෞතික සංස්කෘතියේ අසමබර වෙනස් වීම සංස්කෘතික ලැග්මට හේතුවයි. පුද්ගලයා ඉතා ඉක්මනින් භෞතික සංස්කෘතියේ වෙනසට අනුගත වේ. එහෙත් අභෞතික සංස්කෘතියට අයත් අදහස්, ධර්මතා, සාරධර්ම ආදිය ඉක්මනින් වෙනස් කර නොග නී. මෙලෙස අභෞතික සංස්කෘතියේ නැවතීමේ හෙවත් පසුබෑමේ ස්වභාවය සංස්කෘතික ලැග්ම නමින් හැඳින්වේ. ශ්‍රී ලාංකිකයා ඉතා ඉක්මනින් නවීන තාක්ෂණයට හුරුවේ. නමුත් සෑම විශේෂ අවස්ථාවකදීම නැකත් බැලීමට උත්සුක වේ. දියුණු තාක්ෂණය සහිත මෝටර් රථයක් පදවන රියැදුරු තැන රාහු කාලය ගැන දැඩි සේ සැලකිලිමත් වන්නේ ය. මෝටර් රථයක් මුලින්ම කතරගමට ගෙන යයි. මෙවැනි ලක්ෂණ සංස්කෘතික ලැග්මට උදාහරණ ලෙස දැක්විය හැකි ය.

සංස්කෘතික ගැටුම පරම්පරා ගැටුම ලෙස ද හැඳින්වේ. වැඩිහිටි පරපුර තමන් අනුගමනය කරන ලද සංස්කෘතිකාංග වෙනස් කිරීමට හෝ අත් හැරීමට එකග නොවේ. එහෙත් ඉක්මනින් නූතනත්වය වැළඳ ගන්නා බාල පරපුර සාම්ප්‍රදායික සංස්කෘතිකාංග පසෙක ලා නව සංස්කෘතිකාංග වැළඳ ගැනීමට උත්සුක වේ. වෙනස් වීමට අකමැත්තක් දක්වන වැඩිහිටි පරපුර හා බාල පරපුර අතර ඇතිවෙන මෙකී පරස්පරය පරම්පරා ගැටුම ලෙස හැඳින් වේ. ශ්‍රී ලාංකික සමාජයේ ද මේ තත්ත්වය දක්නට ලැබේ. නූතන විලාසිතා අගයන බාල පරපුර හා පරණ දේ අගයන වැඩිහිටි පරපුර අතර නොරුස්සන ස්වභාවයක් ඇත.

සංස්කෘතික විසරණය යනු සංස්කෘතියේ ව්‍යාප්තිය යි. එකම රට තුළ එක් සංස්කෘතික කලාපයක සිට තවත් කලාපයකට ද එක් රටක සංස්කෘතිය තවත් රටකට ද ව්‍යාප්ත වීම සංස්කෘතික විසරණය නමින් හඳුන්වනු ලැබේ. නාගරීක සංස්කෘතිකාංග ග්‍රාමීය සමාජ කරා විසරණය වී ගැමි සමාජ ද වෙනස් වේ. එමෙන් ම යටත් විජිත ව්‍යාපාරය හරහා බටහිර සංස්කෘතිකාංග අප වැනි යටත් විජිත රටවල ව්‍යාප්ත විය. එහි ප්‍රතිඵලයක් ලෙස යටත් විජිත සමාජ වේගවත් පෙරළියකට පාත්‍ර විය. වර්තමානය වන විට විසරණ කාර්යය ඉටු කරනු ලබන්නේ රූපවාහිනිය, අන්තර්ජාලය වැනි මාධ්‍යයන් ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ඉදිරිපත් කිරීම

**ආකල්ප හා ඇගයුම්**

1. සංස්කෘතික සංරචකවල ක්‍රියාකාරී ස්වරූපය ශ්‍රී ලාංකික සංස්කෘතිය ඇසුරින් හඳුනා ගනී.
2. සංස්කෘතික ගැටුම නිදසුන් දෙමින් පැහැදිලි කරයි.
3. අවට සමාජයෙන් ගත් උදාහරණවලට අනුව සංස්කෘතික විසරණය පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්
- ලියන කඩදාසි

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සංස්කෘතික සංරචකයන් වශයෙන් සංස්කෘතික ලැග්ම, සංස්කෘතික ගැටුම, සංස්කෘතික විසරණය, ප්‍රතිමාන, ඇගයුම් හා සාරධර්ම තේරුම් ගැනීමට මඟ පෙන්වන්න

- එක් එක් සංරචකල විශේෂත්වයට අදාළ කරුණු පෙළගස්වා ගැනීමට මඟ පෙන්වන්න.

- එම සංරචක ශ්‍රී ලාංකික සමාජය තුළ ක්‍රියාත්මක වන ආකාරය අවබෝධ කර ගැනීමට මඟ පෙන්වන්න

- තමා අයත් සමාජයෙහි එම සංරචකයන් ක්‍රියාත්මක වන ආකාරය තේරුම් ගැනීමට ඉඩ සලසා දෙන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සංස්කෘතික සංරචකයන් ලෙස සංස්කෘතික ලැග්ම, සංස්කෘතික ගැටුම පිළිබඳ අවබෝධය ලබා ගැනීමට අවස්ථා සම්පාදනය කිරීම. | සාකච්ඡා ක්‍රමය<br>විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| සංස්කෘතික සංරචකයන් ලෙස සංස්කෘතික විසරණය, ප්‍රතිමාන ඇගයුම් හා සාරධර්ම පිළිබඳව අවබෝධ කර ගැනීමට අවස්ථා සම්පාදනය කිරීම. | සාකච්ඡා ක්‍රමය |
| සංස්කෘතික ලැග්ම හා සංස්කෘතික ගැටුම ශ්‍රී ලාංකික සමාජයේ ක්‍රියාත්මක වන ආකාරය පහද න්න. | කණ්ඩායම් ක්‍රමය<br>කේවල ක්‍රමය |
| සංස්කෘතික විසරණය, ප්‍රතිමාන, ඇගයුම් හා සාරධර්ම ශ්‍රී ලාංකීක සමාජයේ ක්‍රියාත්මක වන ආකාරය අවබෝධ කර ගැනීම. | කණ්ඩායම් ක්‍රමය<br>කේවල ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

පහත සඳහන් සංරචකයන් පිළිබඳ හැඳින්වීම

I සංස්කෘතික ලැග්ම
II සංස්කෘතික ගැටුම
III සංස්කෘතික විසරණය
IV ප්‍රතිමාන හා සාරධර්ම

I සංස්කෘතික ලැග්ම ශ්‍රී ලාංකීක සමාජයේ දක්නට ලැබෙන ආකාරය පෙන්වාදීම
II සංස්කෘතික ගැටුමට ඔබ අයත් සමාජයේ උදාහරණ දෙකක් ඉදිරිපත් කිරීම
III බෞද්ධ සාරධර්ම ආරක්ෂාකර ගැනීමේ වැදගත්කම වර්තමාන සමාජයෙන් ගත් උදාහරණ දෙකක් ඇසුරින් විස්තර කිරීම

**නිපුණතාව** - සංස්කෘතිය යන්න අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම-** 3.3 පෞරුෂ වර්ධනයෙහිලා සංස්කෘතියේ කාර්ය භාරය ගවේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. සමාජානුයෝජනය හා සංස්කෘතිය අතර ඇති අන්තර් සම්බන්ධතාව පිළිබඳ අදහස් දක්වයි.
2. සංස්කෘතික හර පද්ධතීන් හඳුනාගෙන විස්තර කරයි.
3. සංස්කෘතික හර ජීවිතවයට ආදේශ කර ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.
4. සංස්කෘතිය හා පෞරුෂය අතර ඇති සමබන්ධතාව පැහැදිලි කරයි.

**හැඳින්වීම** -

පෞරුෂ වර්ධනයේ පදනම සමාජඅනුයෝජනය යි. සමාජානුයෝජනය යනු සාමජිකයාගේ සමාජීය ආත්මය තුළට සංස්කෘතිය ඇතුළු කිරීමේ ක්‍රියාවලිය යි. ආක්‍රමණශීලි බව හෝ කරුණාවන්ත බව සාමාජිකයාගේ පෞරුෂයට ඇතුළු වන්නේ ඔහු අයත් සමාජයෙන් ලැබෙන අනුයෝජනය මාර්ගයෙන් ය. මාග්‍රට්මීඩ් නම් සමාජ විද්‍යාඥවරිය නිව්ගිනියාවේ දී කරන ලද පර්යේෂණයක දී මේ බව පැහැදිලි කර තිබේ. එහි මුණ්ඩුමාර් ගෝත්‍රිකයන් ආක්‍රමණශීලින් විය. කුඩා කල සිට ඔවුන් ලද සංස්කෘතික බලපෑම ඒ කෙරේ ඉවහල් වී ඇත. අනුයෝජන ක්‍රියාවලියේ දී අභ්‍යන්තරීකරණය කරනු ලබන පෞරුෂ ලක්ෂණ වෙනස් කිරීම ද ඉතා අපහසු ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- ඉදිරිපත් කිරීමේ ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සංස්කෘතියට අයත් හර පද්ධතිය ඇසුරින් තම පෞරුෂය වර්ධනය කරගනි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්, ලිපි ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සමාජානුයෝජන ක්‍රියාවලිය පිළිබඳ සිසුන්ගේ දැනුම පෝෂණය කරන්න.
- සංස්කෘතිය පවරාදීමේ ක්‍රියාවලිය ලෙස සමාජානුයෝජනය හඳුනා ගැනීමට මඟ පෙන්වන්න.
- සංස්කෘතික හර පද්ධතින් පිළිබඳ සිසුන්ගේ දැනුම අවදි කරන්න.
- සංස්කෘතික හර පද්ධතින් සමාජයක පැවැත්ම සඳහා දයක වන ආකාරය පෙන්වා දෙන්න.
- සංස්කෘතික හර උපයෝගි කරගෙන පෞරුෂය වර්ධනය කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජානුයෝජන ක්‍රියාවලිය පිළිබඳ කරුණු සාකච්ඡා කිරීම. | සාකච්ඡා ක්‍රමය |
| සංස්කෘතියේ හර පද්ධති ගවේෂණය කිරීම. | කණ්ඩායම් හෝ කේවල ක්‍රමය |
| සංස්කෘතික හර සමාජයක පැවැත්මට උපයෝගිවන ආකාරය සොයා බැලීම. | සාකච්ඡා ක්‍රමය |
| සංස්කෘතික හර උපයෝගීකර ගෙන පෞරුෂය වර්ධනය කරගත හැකි ආකාරය පිළිබඳ කරුණු සෙවීමට යොමු කිරීම. | ගවේෂණය<br>කේවල ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

I සමාජානුයෝජනය යන්න පැහැදිලි කිරීම.
II සිංහල බෞද්ධ සංස්කෘතියේ හර පිළිබඳ විස්තර කිරීම.
III සමාජානුයෝජනය හා සංස්කෘතිය අතර ඇති සම්බන්ධය පැහැදිලි කිරීම.
IV සංස්කෘතික හර අභ්‍යන්තරීකරණය කර ගැනීම මගින් පුද්ගල පෞරුෂය වර්ධනය වන ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කිරීම.
V භික්ෂු පෞරුෂය වර්ධනය කර ගැනීම සඳහා ඉවහල්වන බෞද්ධ සංස්කෘතික ලක්ෂණ නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කිරීම.

**නිපුණතාව** - සංස්කෘතිය යන්න අධ්‍යයනය කරයි.

**නිපුණතා මට්ටම-** 3.4 ගෝලිය ප්‍රවණතා සංස්කෘතියට බලපාන ආකාරය විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. ගෝලීය ප්‍රවණතා ලෝකයේ විවිධ සංස්කෘතින් කෙරෙහි බලපෑම් කරන ආකාරය හඳුනාගෙන ප්‍රකාශ කරයි.
2. ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවනට ලක්ව ඇති ආකාරය සමාජ වෙනස් වීම ඇසුරින් වටහාගෙන පැහැදිලි කරයි.
3. ගෝලීය ප්‍රවණතා හමුවේ ශ්‍රී ලාංකික සංස්කෘතියට සිදු වූ බලපෑම විස්තර කරයි.
4. ශ්‍රී ලාංකික සංස්කෘතියට එල්ල වූ බලපෑම්වල යහපත් හා අයහපත් ලක්ෂණ පැහැදිලි කරයි.

**හැඳින්වීම** -

ගෝලිය ප්‍රවණතා වශයෙන් නාගරීකරණය, කාර්මීකරණය, බටහිර කරණය, වාණිජකරණය වැනි බලවේග හමුවේ රටක සංස්කෘතිය විශාල අභියෝගයන්ට ලක් වීම අවධාරණය කරයි. ශ්‍රී ලංකාවට ද ඉන් මිදීමට අවකාශයක් නැත. ගෝලීය වශයෙන් ජනප්‍රිය වන ජනමාධ්‍ය, සංචාරක ව්‍යාපාරය, ණය හා සංවර්ධන ව්‍යාපෘති වැනි මැදිහත්වීම් වලින් ලොව පුරා ප්‍රචාරය වන බටහිර බලපෑම හමුවේ අපේ සිරිත් - විරිත් පද්ධතිය බොහෝ වෙනස්කම්වලට භාජන වී ඇත. ශ්‍රී ලාංකික සිරිත් විරිත් අතර පැවති පොදු හැඟීම පරෝපකාරය, ආගන්තුක සත්කාරය, කරුණාව, මෛත්‍රිය වැනි ලක්ෂණ බිඳවැටි මූල්‍යමය ප්‍රතිලාභ මත සියල්ල තීරණය වන සමාජයක් නිර්මාණය වී ඇත. ස්වදේශිය භාෂාවලින් කටයුතු කිරීම එක්තරා අවමානයක් ලෙස සලකන සමාජයක් නිර්මාණය වී ඇත. කට වහරේ දී වැඩි වශයෙන් ඉංග්‍රීසි පද වහරන ආකාරය දක්නට ලැබේ.

පිරිවෙණ මුල් කරගෙන පැවැති ලංකාවේ අධ්‍යාපන ක්‍රමය පිරිවෙණෙන් ගිලිහි ගොස් බටහිර පන්නයට හැඩ ගැසුණු පාසල් පද්ධතිය වෙත මාරු වී ඇත. ගුණ ධර්මවලින් බැහැර වූ තරගකාරී අධ්‍යාපන රටාවක් මෙමගින් නිර්මාණය කර තිබේ. බොහෝ උගතුන් සිටිය ද ගුණ දහමින් පිරි බුද්ධිමතුන් විරල බවට චෝදනා නැගෙන්නේ මෙහි ප්‍රතිඵලයක් ලෙස ය.

සරල දේශිය ආහාර රටාව බිඳවැටී ඇත. ඒ වෙනුවට බොහෝ දෙනා බටහිර පන්නයේ ක්ෂණික ආහාර රටාවකට හුරු වී ඇත. පිටි කිරි වර්ග, ඇසිරූ ආහාර, පිසූ ආහාර, පැණිබීම වැනි දෑ ජනප්‍රිය වී තිබේ. බෝනොවන රෝග පැතිරීයාම, කුඩා දරුවන් පවා එහි ගොදුරක් බවට පත්වීම මෙම පරිභෝජන රටාවේ ඍජු ප්‍රතිඵලයක් බව පෙන්වා දිය හැකි ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- ඉදිරිපත් කිරීමේ ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. ගෝලීය ප්‍රවණතා හමුවේ ශ්‍රී ලංකා සංස්කෘතියට එල්ල වන අයහපත් බලපෑම හඳුනාගෙන ඒවා අවම කර ගැනීමට ක්‍රියා කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්
- ලිපි ද්‍රව්‍ය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- ගෝලීය ප්‍රවණතා හඳුනා ගැනීමට මඟ පෙන්වන්න.
- ගෝලීය ප්‍රවණතා ලෝකයේ විවිධ සංස්කෘතීන්ට බලපෑම් කරනු ලබන ආකාරය අවබෝධ කර ගැනීමට සිසුන්ට මඟ පෙන්වන්න.
- ශ්‍රී ලංකාවේ සංස්කෘතිය වෙනස් වීමට ගෝලීය ප්‍රවණතා හේතු වී ඇති ආකාරය පිළිබඳ දැනුම අවදි කරන්න.
- ශ්‍රී ලංකාවේ සංස්කෘතිය කෙරෙහි ඇති වූ බලපෑම් ලැයිස්තු ගත කිරීමට සිසුන් මෙහෙයවන්න.
- මේ බලපෑම් මගින් සංස්කෘතියට වෙන යහපත හා අයහපත හඳුනාගෙන වගුගත කිරීමට මඟ පෙන්වන්න.
- සිසුන් විසින් ලැයිස්තුගත කරන ලද කරුණු පංතියට ඉදිරිපත් කිරීමට ඉඩ සලසන්න.
- ඇගයීම ද එම අවස්ථාවේදීම කරන්න. අවශ්‍ය ඌණ පූර්ණයන් ද කරන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ගෝලීය ප්‍රවණතා හඳුන්වාදීම හා එයින් වන බලපෑම පිළිබඳ පැහැදිලි කිරීම. | සාකච්ඡා ක්‍රමය |
| ගෝලීය ප්‍රවණතා හමුවේ ශ්‍රී ලංකාවේ සංස්කෘතිය මුහුණ දී ඇති තත්ත්වය<br>සිරිත් - විරිත්<br>භාෂාව<br>අධ්‍යාපනය<br>ආහාර පාන ඇඳුම් පැළඳුම් යන අංගයන්හි වෙනස්කම් ලැයිස්තු ගත කිරීම. | කේවල ක්‍රමය |
| ගෝලීය ප්‍රවණතා හමුවේ ශ්‍රී ලාංකික සංස්කෘතියේ සිදු වූ යහපත් හා අයහපත් වෙනස්කම්<br>සිරිත් - විරිත්<br>භාෂාව<br>අධ්‍යාපනය<br>ආහාර - පාන, ඇඳුම් - පැළඳුම් හා විලාසිතා යටතේ වගුගත කිරීම. | කණ්ඩායම් ක්‍රමය |
| සංස්කෘතියට එල්ල වන අයහපත් බලපෑම්වලින් මිදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග යෝජනා කිරීම. | සිසුන්ගේ ඉදිරිපත් කිරීම් |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

I ගෝලීය ප්‍රවණතා හමුවේ
- (අ) සිරිත් විරිත්
- (ආ) අධ්‍යාපනය
- (ඇ) ආහාර පාන යන ක්ෂේත්‍රවල ඇති වූ යහපත් හා අයහපත් වෙනස්කම් 02 බැගින් ලිවීම

II ගෝලීය ප්‍රවණතා හමුවේ දුර්වල වෙමින් පවතින දේශීය සංස්කෘතිය රැක ගැනීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කරමින් පිරිවෙණෙහි පළකරන සඟරාවකට ලිපියක් ලිවීම

**නිපුණතාව** **-** සාමාජිකයා හා සමාජය අතර ඇති අන්තර් සම්බන්ධතාව විවරණය කර දක්වයි.

**නිපුණතා මට්ටම-** 4.1 පුද්ගලයා සමාජයේ සාමාජිකයෙකු වන ආකාරය පෙන්වා දෙයි.

4.2 සමූහයේ කොටස්කරුවෙකු ලෙස සාමාජිකයාගේ කාර්යභාරය අවබෝධ කර ගනියි.

4.3 මහ සමාජයේ හවුල්කරුවෙකු ලෙස සාමාජිකයාට පැවරෙන භූමිකා සමූහය පිළිබඳ වටහා ගනියි.

4.4 සමාජ යහපත සලසන ධර්මානුකූල සාමාජිකයෙකු නිර්මාණ කර ගැනීමට මග පෙන්වන බෞද්ධ ඉගැන්වීම් කෙරෙහි අනුගත වෙයි.

කාලච්ඡේද සංඛ්‍යාව - 08

**හැඳින්වීම** **-**

සාමාජිකයා හා සමාජය අතර පවතින්නේ වෙන් කළ නොහැකි අන්තර් සම්බන්ධතාවයකි. පුද්ගලයා කුමන හෝ සමාජයක සාමාජිකයෙකු වන අතර සාමාජිකයාගෙන් තොරව සමාජයකට පැවැත්මක් හෝ සමාජයකින් තොරව සාමාජිකයාට පැවැත්මක් නැත.

සමාජ ගති ස්වභාවන්ගෙන් පරිපෝෂිත සත්ත්වයෙකු වන හෙයින් සමාජයක සාමාජිකත්වය දරනු ලබන්නා සාමාජිකයා නමින් හඳුන්වනු ලැබේ. එහෙයින් මෙම සාමාජිකයාගේ සමාජීය ආත්මයෙන් ඔහු / ඇය අයත් වන සංස්කෘතිය පිළිබිඹු වේ. මේ ආකාරයට සිංහල බෞද්ධ සංස්කෘතික හර පද්ධතිය ආරෝපණය කරන ලද සමාජීය ආත්මයක හිමිකරුවෙකු වන හෙයින් කෙනෙකු සිංහලයෙකු ලෙස හඳුන්වනු ලැබේ.

මේ අනුව සිංහල බෞද්ධයා නම් ආකෘතිය නිර්මාණය කොට ඇත්තේ සමස්ත බෞද්ධ ආචාරධර්ම හා සිංහල සංස්කෘතිය අභ්‍යන්තරීකරණය කිරීමෙන් ය. නැතහොත් කාවැද්දීමෙන් ය. එහෙයින් එවැනි සාමාජිකයෙකුගෙන් සැදි සමාජය ගැටලුවලින් තොර නිරවුල්, සමාජශීලි ගුණධර්මවලින් පිරි වාසස්ථානයක් බවට පත් වේ.

**නිපුණතාව - සාමාජිකයා හා සමාජය අතර ඇති අන්තර් සම්බන්ධතාව විවරණය කර දක්වයි**

**නිපුණතා මට්ටම-** 4.1 පුද්ගලයා සමාජයේ සාමාජිකයෙකු වන ආකාරය පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. පුද්ගලයා සමාජයේ අනිවාර්ය කොටස්කරුවෙක් වන බව පෙන්වා දෙයි.
2. පුද්ගලයා සාමාජීය සත්වයෙකු බවට පත් වීමේ ප්‍රතිඵලයක් ලෙස සමාජය අඛණ්ඩව විකාශය වන බව පැහැදිලි කරයි.

හැඳින්වීම -

ඕනෑම මිනිසෙකු හට කවර හෝ සමාජයක කොටස්කරුවෙකු නොවී ජීවත් වීමට හෝ සිය පැවැත්ම සාධනය කර ගැනීමට නොහැක. පුද්ගලයා යනු කිසියම් හෝ සමාජයක සාමාජිකයෙකි. මෙම සාමාජිකත්වය බොහෝ විට උරුම වන්නේ උපතින්මය. එතැන් සිට පවරා දෙන සාරධර්ම, ප්‍රතිමාන, ඇගයුම්වලට අනුව තවදුරටත් මෙම සාමාජිකයා සමාජීය සත්ත්වයෙකු ලෙස සංවර්ධනය වන්නේ ය. මෙකී සමාජීය සත්ත්වයා හෙවත් සාමාජිකයා සමාජය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා දයක කර ගැනීම ඊළඟ වැදගත් අවශ්‍යතාවය වන්නේ ය. සුදුසු පරිදි අඹු සැමි, මා - පිය, දු - දරු, ගෘහණිය,ගෘහප්‍රති ආදී සමාජ තත්ත්වයන් ප්‍රදානය කර ඒවාට අදළ වගකීම හෙවත් කාර්ය කොටස් සාමාජිකයා ලවා ඉටුකරවා ගනු ලැබේ. මේ ආකාරයට සාමාජිකයා සක්‍රීය කරගනු ලබයි. සාමාජිකයා සක්‍රීය වීමේ නියත ප්‍රතිඵලය වන්නේ සමාජය සක්‍රීය වීමයි. මේ අනුව පැහැදිලි වන වැදගත් කරුණ වන්නේ සමාජයේ හැඩය සාමාජිකයාට සාපේක්ෂව තීරණය වන බවයි. එනම් සාමාජිකයා යහපත් වන විට සමාජය ද යහපත් වනවා මෙන් ම ඔහු / ඇය අයහපත් වන විට සමාජය ද අයහපත් වන බවයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශනය ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සාමාජිකයා සමාජයෙහි කොටස්කරුවෙක් බව හඳුනා ගනියි.
2. සාමාජිකයාගෙන් තොරව සමාජ විකාශනයක් අපේක්ෂා කළ නොහැකි බව හඳුනා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන
- කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- ශිෂ්‍යයා සමාජයේ කොටසක් බව පෙන්වා දෙන්න.
- ගිහි හා පැවිදි සමාජ ක්‍රම දෙකෙහි අගනාකම්වල වෙනස් බව පෙන්වන්න.
- සාමාජිකයා නොමැතිව සමාජයෙහි පැවැත්මක් නොමැති බවත් සමාජය නොමැතිව සාමාජිකයාට පැවැත්මක් නොමැති බවත් පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ඡායා රූප මගින් ශිෂ්‍යයාට විවිධ සමාජ සමූහ හඳුන්වා දෙන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| ශිෂ්‍යයා ඉහත සමාජ සමූහ වලින් එක් සමූහයකට අයත් බව පෙන්වා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| තමා මෙන් ම අනෙකුත් සාමාජිකයන් ද කුමන හෝ සමාජයකට අයත් බව පෙන්වා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| මිනිසා සමාජීය සත්ත්වයෙකු වීම වාසි සහගත බව පෙන්වා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකාව ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| වාර්තා පංතියට ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක

- සමාජ කොටස් පහක් නම් කර ඒවාට අයත් තත්ත්වයන් දෙකක් ලිවීම.
- පහත A කාඩ්පත්වල ඇති සමාජ කොටස් B කාඩ්පතට ගැලපීම.

A කාඩ්පත්

| ගිහි සමාජය | පැවිදි සමාජය |
|---|---|
| | |

| විශ්ව විද්‍යාල සමාජය | ධීවර සමාජය |
|---|---|
| | |

B කාඩ්පත්

පන්න ක්‍රම | දායකයා | පාංශුකූල

කථිකාචාර්යවරු

ඇමුණුම 01

**කාර්යය පත්‍රිකා අංක 01**

3. එක් එක් කණ්ඩායමට පහත දැක්වෙන සමාජ සමූහ මගින් සාමාජිකයාට ලැබෙන වාසි 05ක් ලියන්න

A කණ්ඩායම - පාසල

B කණ්ඩායම - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

C කණ්ඩායම - පන්සල

**නිපුණතාව** **-** සාමාජිකයා හා සමාජය අතර ඇති අන්තර් සම්බන්ධතාව විවරණය කර දක්වයි.

**නිපුණතා මට්ටම-** 4.2 සමාජයේ කොටස් කරුවෙකු ලෙස සාමාජිකයාගේ කාර්යභාරය අවබෝධ කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**


1. සාමාජිකයා කුමන හෝ සමූහයක කොටස්කරුවෙක් වන බව නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.

2. සමූහයේ කොටස්කරුවෙක් ලෙස සාමාජිකයාට විවිධ කාර්ය කොටස් පැවරෙන බව පෙන්වා දෙයි.

හැඳින්වීම **-**

සාමාජිකයාට හුදකලාව, තනිව ජීවත් වීම කිසිවිටකත් කළ හැකි දෙයක් නොවේ. සාමාජිකයාට කුමන හෝ සමූහයක කොටස් කරුවෙකු ලෙස විවිධ තත්ත්වයන් හා කාර්ය කොටස් හිමි වේ. කාර්ය කොටස් රංගනයේ ප්‍රතිඵලයක් ලෙස තව දුරටත් සමාජය ශක්තිමත්ව හා සංවිධානාත්මකව නොනැවතී ඉදිරියට ගලා යයි.

එකම සාමාජිකයා විවිධ තත්ත්වයන් රැසක් නියෝජනය කරන අතර ඒ එක් එක් තත්ත්වයට අදාළ කාර්ය කොටස් රඟ දක්වයි.




මේ සෑම තත්ත්වයකටම අදාළ නිශ්චිත කාර්ය කොටසක් ද වේ. ස්ත්‍රී - පුරුෂ, ගිහි - පැවිදි, උගත්, - නූගත්, දුප්පත් - පොහොසත් භේදයකින් තොරව සෑම සාමාජිකයෙකුට ම විවිධ තත්ත්වයන් හෙබවීමට ද ඒවාට අදාළ කාර්ය කොටසේ රඟ දැක්වීමට ද සිදුවනු ඇත.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ඉදිරිපත් කිරීම්
- ප්‍රදර්ශන ක්‍රමය

- කණ්ඩායම් ක්‍රමය

- ප්‍රශ්නාවලි ක්‍රමය

- සාකච්ඡා ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සාමාජිකයා සමාජයෙහි කොටස්කරුවෙක් බව හඳුනා ගනියි.
2. සාමාජිකයා විවිධ සමාජ සමූහ නියෝජනය කරන බවත් එකිනෙක සමූහයට සාපේක්ෂව කාර්ය කොටස වෙනස් වන බවත් පෙන්වා දෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන

- කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- එකම සාමාජිකයා සමාජයේ විවිධ අවස්ථාවලදී විවිධ කාර්යභාරයන් ඉටු කරන බව පෙන්වා දෙන්න.

- පැවිදි සාමාජිකයෙකුට අදාළ කාර්යභාරය පෙන්වා දෙන්න.

- ගිහි සාමාජිකයෙකුට අදළ කාර්යභාරය පෙන්වා දෙන්න.

- එම සාමාජිකයන් දෙදෙනාගේ කාර්යභාරය සංසන්දනය කරන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| රූප සටහන් මගින් සාමාජිකයා අයත්වන සමූහ පෙන්වන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| එක් එක් සමූහයට අනුව හිමිවන කාර්යභාරය පෙන්වන්න. | සාකච්ඡා ක්‍රමය |
| එම කාර්ය කොටස ඉටු කිරීමේ වැදගත්කම පෙන්වන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 01 කාර්ය පත්‍රිකාව ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| වාර්තා පංතියට ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |


ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක

- සාමාජිකයා හා සමාජය අතර ඇති අන්‍යොන්‍ය සම්බන්ධතාව පැහැදිලි කිරීම.
- සාමාජිකයා වෙත සමූහයට අනුව හිමිවන කාර්යභාරය පැවිදි ශිෂ්‍යයා ඇසුරින් පෙන්වා දීම.

ඇමුණුම 01

**කාර්ය පත්‍රිකා අංක 01**

A කණ්ඩායම



**නිපුණතාව - ** සාමාජිකයා හා සමාජය අතර ඇති අන්තර් සම්බන්ධතාව විවරණය කර දක්වයි.

**නිපුණතා මට්ටම-** 4.3 සමාජයේ හවුල්කරුවෙකු ලෙස සාමාජිකයාට පැවරෙන භූමිකා සමූහය වටහා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. සාමාජිකයා මත සමාජය රඳා පවතින අයුරු විස්තර කරයි.
2. සමාජයේ යහපැවැත්ම හා සංවිධානය සඳහා විවිධ භූමිකාවන්හි වැදගත්කම අවධාරණය කරයි.

හැඳින්වීම -

සාමාජිකයාට මහා සමාජය සමග කටයුතු කිරීමේ දී භූමිකා සමූහයක් පැවරෙන බව පෙනී යයි. එකී භූමිකා කොටස් දෙකකට බෙදා දැක්විය හැකි ය.

1) ආරෝපිත තත්ත්වය
2) සාධිත තත්ත්වය යනු ඒවා ය.

ආරෝපිත තත්ත්වය යනු උපතින්ම ආරෝපනය වන තත්ත්වයන් ය. ජීව විද්‍යාත්මකව ලැබෙන ස්ත්‍රී, පුරුෂ භාවය ආරෝපිත තත්ත්වයක් ලෙස සැලකිය හැකි ය. කුලය හා ආගම ද ආරෝපිත තත්ත්වයන් ලෙස සැලකිය හැකි ය.

සාමාජිකයා විසින් සාධනය කරගනු ලබන හැකියාවනට, දක්ෂතාවනට අනුව සමාජය විසින් පවරනු ලබන තත්ත්වයන් සාධිත තත්ත්වයන් ලෙස හඳුන්වනු ලැබේ. ගුරුවරයා, ක්‍රීඩකයා, මන්ත්‍රීවරයා, විනිශ්චයකරුවා, ව්‍යාපාරිකයා, කම්කරුවා, රියදුරා, ගොවියා, යාචකයා, සංගීතඥයා නළුවා යනු එම ගණයේ තත්ත්වයන් සඳහා නිදසුන් ය.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය
- ඉදිරිපත් කිරීමේ ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සාමාජිකයාට විවිධ භූමිකා සමාජය තුළ නිරූපනය කිරීමට සිදුවන බව හඳුනා ගනියි.
2. රටක සාමාජිකත්වය භූමිකා රඟ දක්වන ආකාරය මත සමාජයෙහි අනාගතය තීරණය වන බව හඳුනා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන
- කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සිසුන් සමග සමාජය යනු කුමක් දැයි සාකච්ඡා කරන්න.
- තමා නොදැනුවත්වම එම සමාජයෙහි කොටස්කරුවෙකු වී ඇති ආකාරය පෙන්වා දෙන්න.
- එම සමාජය තුල එකම සාමාජිකයාට විවිධ භූමිකා පැවරෙන බව පෙන්වා දෙන්න.
- කාර්යක්ෂම භූමිකා රංගයනයට අනුව සමාජ ස්ථාවරත්වය තහවුරු වන බව නිදසුන් මගින් පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| මහ සමාජයේ හවුල්කරුවෙකු ලෙස සාමාජිකයාට පැවරෙන භූමිකා පිළිබඳව සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර කාර්ය පත්‍රිකා 3 ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| එම කාර්ය පත්‍රිකාවෙහි ශිෂ්‍යයෙක්, ආගමික නායකයෙකු, මිතුරෙකු, ලෙස පැවරෙන කාර්යයන් වෙන වෙනම ලිවීමට උපදෙස් දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| කණ්ඩායම තුළ එකම භූමිකාවට අදළ විවිධ ක්‍රියාකාරකම් සාකච්ඡා කරන්න. | කණ්ඩායම් ක්‍රමය |
| එම වාර්තාව පංතියට ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- ශිෂ්‍යයෙකු ලෙස නිරූපණය කිරීමට සිදුවන විවිධ කාර්ය කොටස් හඳුන්වාදීම.
- භූමිකාව සමාජයට වැදගත් වන අයුරු පැහැදිලි කිරීම.

ඇමුණුම 01

**කාර්ය පත්‍රිකාව 3**

ශිෂ්‍යයාගේ නම

පංතිය

| දිනය | වේලාව | කරන ලද කාර්යය | වැය වූ කාලය |
|---|---|---|---|
| | | | |

**නිපුණතාව** **-** සාමාජිකයා හා සමාජය අතර ඇති අන්තර් සම්බන්ධතාව විවරණය කර දක්වයි.

**නිපුණතා මට්ටම-** 4.4 සමාජ යහපත සලසන ධර්මානුකූල සාමාජිකයෙකු නිර්මාණය කර ගැනීමට මඟ පෙන්වන බෞද්ධ ඉගැන්වීම් කෙරේ අනුගත වෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. බෞද්ධ සූත්‍ර ඇසුරින් සාමාජිකයාගේ භූමිකාව පැහැදිලි කරයි.
2. සදිසා නමස්කාරය ඇසුරින් සාමාජිකයාගේ අන්‍යොන්‍ය වගකීම විස්තර කරයි.
3. සිගාලෝවද සූත්‍රය ඇසුරින් ඒ ඒ භූමිකාවට අයත් යුතුකම් හා වගකීම්වල වැදගත්කම විවරණය කරයි.

**හැඳින්වීම** **-**

තමා නිවැරදි වීමෙන් මෙලොව හා පරලොව වශයෙන් ස්වකීය ජීවිතය ද පොදුවේ සමාජය ද යහපත් වන බව බෞද්ධ ඉගැන්වීම වන්නේ ය. මේ සඳහා මඟ පෙන්වන ලද සූත්‍ර දේශනා රැසකි. ඒ අතුරින් සිගාලෝවාද සූත්‍රයට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි.

හිරු උදාවනතෙක් නිදා ගැනීම, පර අඹුවන් සේවනය කිරීම, සුරාපානය හා නෘත්‍ය ගීතවලට ඇති ලෝලත්වය පුරුෂයා විනාශයට පත් කරන බව මෙම සූත්‍ර දේශනාවෙහි දැක්වෙන්නේ ය. හිරු උදාවන තෙක් නිදා ගැනීමෙන් දවසෙහි කටයුතු නිමවා ගැනීමට නොහැකි වෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස ආදායම් හීන වෙයි. ණය වීමට සිදු වෙයි. අග හිඟකම් වැඩි වෙයි. ජීවිතය ව්‍යාකූල වෙයි. ශිෂ්‍යයෙකු නම් පාඩම් කටයුතු වත්පිළිවෙත් මඟ හැරීමෙන් ඉතා කෙටි කාලයක් ඇතුළත විනාශයට පත් වෙයි. එමගින් පෙනී යන්නේ තම භූමිකාව නිසි ආකාරයට රඟ දැක්විය යුතු බවයි.

සදිසා නමස්කාරය යටතේ සමස්ත සමාජය යුගල හයකට බෙදා එකිනෙක කොටස වෙත පැවරෙන කාර්ය කොටස විවරණය කර දක්වා ඇත. දෙමාපියන් දූ දරුවන්ට ද , දූ දරුවන් දෙමාපියන්ට ද, ගුරුවරයා ශිෂයයාට ද ශිෂ්‍යයා ගුරුවරයාට ද, ස්වාමී පුරුෂයා බිරිඳට ද බිරිඳ ස්වාමී පුරුෂයාට ද, මිතුරන් අන්‍යෝන්‍ය වශයෙන් ඔවුනොවුන්ට ද, පැවිද්ද ගිහියාට ද ගිහියා පැවිද්දට ද, ස්වාමියා දැසි දස්සන්ට ද දැසි දස්සන් ස්වාමියාට ද ඉටු කළ යුතු යුතුකම් වඩාත් විස්තරාත්මකව මෙම සූත්‍රයේ දී දේශනා කොට ඇත. එනම් එකිනෙක තත්ත්වය වෙත පැවරෙන කාර්ය කොටස් ඉටු කරන ආකාරය යි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- ඉදිරිපත් කිරීමේ ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජයක් තුල විවිධ භූමිකාවන් ඇති බව හඳුනා ගනියි.
2. සිය භූමිකාව නිවැරදිව කළ යුතු බව බුදු දහම ඇසුරින් අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන
- කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- ශිෂ්‍යයා සමග සමාජ සම්බන්ධතා ගොඩ නැගෙන ආකාරය සාකච්ඡා කරන්න.
- ශිෂ්‍යයාට සමාජය හා ගනුදෙනු කිරීමේ දී භූමිකා කිහිපයක් නිරූපනය කිරීමට සිදු වන බව පෙන්වා දෙන්න.
- එම භූමිකා නිවැරදිව ඉටු කිරීමෙන් සමාජය නිවැරදිව සංවිධානය වන බව පෙන්වා දෙන්න.
- සිගාලෝවාද සූත්‍රයේ එන සදිසා නමස්කාරය යටතේ දක්වන භූමිකාවන්ට අයත් යුතුකම් වගකීම්වල වැදගත්කම විවරණය කර දෙන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ ජීවිතය හැඩගසා ගැනීමට අදාළ කරුණු බෞද්ධ සූත්‍ර ඇසුරින් පෙන්වා දෙන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| සිගාලෝවාද සූත්‍රය ඇසුරින් යමෙකුගේ භූමිකාව පෙන්වා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| සදිසා නමස්කාරය ඇසුරින් ඒ ඒ භූමිකාවට අයත් කාර්යය සාර්ථක ලෙස ඉටුවන ආකාරය සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 04 කාර්ය පත්‍රිකාව ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| වාර්තා පංක්තියට ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රතිපෝෂණය ලබාදෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- භූමිකා වලට අයත් කාර්යයන්හි වැදගත්කම සිගාලෝවාද සූත්‍රය ඇසුරින් පෙන්වා දීම.
- එක් එක් දිසාව නියෝජය කරන තත්ත්වයට අදළ කාර්ය කොටස පැහැදිලි කිරීම.
- කවර හෝ කාර්ය කොටසක් ඉටු නොවුන හොත් උද්ගත වන ප්‍රතිඵල මොනවා දැයි පැහැදිලි කිරීම.

ඇමුණුම 01

**කාර්ය පත්‍රිකාව 4**

A කණ්ඩායම

සදිසා නමස්කාරය ඇසුරින් භූමිකා රංගනය පහදන්න.

B කණ්ඩායම

තුදුස්පාප කර්මයන්ගෙන් ඈත් වීම භූමිකා සංවර්ධනයට බලපාන ආකාරය පහදන්න.

**සමාජ පාලනය**

**නිපුණතාව** - සමාජ පාලනයේ අවශ්‍යතාව අවධාරණය කරයි.

**නිපුණතා මට්ටම** - 5.1 සමාජ පාලනයේ අවශ්‍යතාව හා එහි ඓතිහාසික විකාශනය විමසා බලයි

5.2 සමාජ පාලනය සඳහා නීති පද්ධතියෙන් කෙරෙන බලපෑම පැහැදිලි කරයි.

5.3 බෞද්ධ ඉගැන්වීම් මගින් දිරි ගන්වනු ලබන ස්වයං පාලනය නූතන සමාජ පාලනයේ දී ව්‍යවහාරික වශයෙන් වැදගත් වන ආකාරය පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 08**

**හැඳින්වීම** -

අන්‍යෝන්‍ය අන්තර් ක්‍රියාකාරීත්වයක් සහිත පොදු එකගතාවයන්ගෙන් යුක්ත වූ සාමාජික පිරිසකගෙන් සැදුම් ලත් සමාජය අතීතයේ සිට අද දක්වා ම විධිමත් මෙන් ම අවිධිමත් සමාජ පාලන යාන්ත්‍රණයක උපකාරයෙන් සමාජීය යහ පැවැත්ම තහවුරු කර ගැනීමට සමත් වී ඇත.

මෙම පාඩම මගින් සමාජ පාලනයෙහි අවශ්‍යතාවය හා එහි ඓතිහාසික විකාශනය, ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය සමාජ පාලනය කෙරෙහි ඇති කරනු ලබන බලපෑම මෙන් ම බෞද්ධ ඉගැන්වීම් සමාජ පාලනය කෙරෙහි ඇති කරනු ලබන දයකත්වය කෙරෙහි ද අවධානය යොමු කර ඇත. ඒ අනුව බුදු දහමේ ඉගැන්වෙන පංච ශීලය, පංච නීවරණ, සප්ත අපරිහානි ධර්ම, දසරාජ ධර්ම යන බෞද්ධ ඉගැන්වීම් සාමාජිකයාට ස්වයං පාලනයක් ඇතිකර ගැනීමට මගපෙන්වන අයුරුත් පෙන්වා දෙනු ඇත. එවැනි සාමාජික එකතුවකින් සාමාජ යහ පැවැත්ම උදාවන ආකාරය තේරුම් ගැනීමට ද මග පෙන්වනු ලැබේ.

**නිපුණතාව** - සමාජ පාලනයේ අවශ්‍යතාව අවධාරණය කරයි.

**නිපුණතා මට්ටම-** 5.1 සමාජ පාලනයේ අවශ්‍යතාව හා එහි ඓතිහාසික විකාශනය විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 02**

**ඉගෙනුම් පල**

1. සමාජය හා සමාජ පාලනය අතර සම්බන්ධතාව පිළිබඳව පැහැදිලි කරයි.
2. සමාජ පාලනය පිළිබඳව ඓතිහාසික විකාශනය විස්තර කරයි.
3. දසරාජ ධර්ම, සප්ත අපරිහානි ධර්ම මාර්ගයෙන් සමාජය පාලනය වෙන අයුරු නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.
4. පවුල් ඒකකය මගින් සාමාජිකයා පාලනය වන ආකාරය පිළිබඳ නිදසුන් ඉදිරිපත් කරයි.

**හැඳින්වීම**

මානව සමාජය යනු අන්තර් ක්‍රියා සමුදායක් ඒකරාශී වීමෙන් නිර්මාණය වන සංකීර්ණ ආයතනය කි. සමාජයේ ජීවත්වන සාමාජිකයා විවිධ විෂම අදහස්, ආකල්ප, රුචි අරුචිකම්, ඕනෑ එපාකම් ඇති අයෙකි. මෙම සමාජිකයාට තම තමන්ගේ අභිමතය පරිදි ජීවත් වීමට අවකාශ සැලසුවහොත් එහි දී නිර්මාණය වන්නේ උන්මත්තකාරයක් වැනි දැඩි අවිධිමත් හා වයකින් යුත් ව්‍යාකුල මිනිස් එකතුවකි. එවැනි තැනක් සමාජයක් ලෙස නම් කළ නොහැක. එහෙයින් එවැනි තැනක් මනුෂ්‍ය වාසයට සුදුසු වන්නේ ද නැත. මෙයින් පැහැදිලි වන්නේ සමාජයකට සුදුසු පරිදි මනුෂ්‍ය චර්යාව පාලනය කළ යුතු බවයි.

ඥාතීත්වය, විවාහය, චාරිත්‍ර වාරිත්‍ර, ආගම, නීතිය, දඬුවම යන සියලු ප්‍රතිපාද මිනිසා විසින් සකසා ගන්නා ලද්දේ මිනිසාගේ චාර්යාව පාලනය කරගැනීම සඳහා ය. මෙකී ප්‍රතිපාදන ශත වර්ෂාධික කාලයක් තිස්සේ ක්‍රම ක්‍රමයෙන් සංවර්ධනය කොටගෙන වර්තමාන තත්ත්වය දක්වා ගෙන එනු ලැබ ඇත.

පන්සිල්, අටසිල්, දසරාජ ධර්ම, සප්ත අපරිහානි ධර්ම, මංගල කරුණු, පරාභවට තුඩු දෙන හේතු වැනි ධර්ම කරුණු සුවිශාල ප්‍රමාණයක් දේශනා කොට ඇත්තේ නොහික්මුනු මිනිසා හික්මවා හෙවත් පාලනය කර සමාජශීලි සත්ත්වයෙකු බවට පත්කර ගැනීම සඳහා ය. සාමාජික යා නිවැරදි කර ගැනීමෙන් හෙවත් පාලනය කර ගැනීමෙන් සමාජය පාලනය කර ගත හැකි බව බුදු දහමේ ද පිළිගැනීම වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය
- ඉදිරිපත් කිරීමේ ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සාමාජිකයා සහ සමාජය අතර යහපත් සබඳතාව සමාජ පාලනයේ පදනම බව අවධාරණය කරයි.
2. පාලනය පිළිබඳව ඓතිහාසික තොරතුරු මූලාශ්‍ර උපයෝගී කරගෙන පැහැදිලි කරයි.
3. ගැමි සමාජ පාලන කාරක හඳුනා ගනියි.
4. බුදු දහමේ ඉගැන්වෙන දසරාජ ධර්ම, සප්ත අපරිහානි ධරම, සමාජ පාලනය සඳහා යොද ගත හැකි අයුරු නිදසුන් සහිතව පැහැදිලි කර ගනියි.
5. සමාජයේ අඛණ්ඩ පැවැත්ම සමාජ පාලනය මත පදනම් වෙන බව අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්වචන ලියන ලද පුවරු
- පෑන්, පැන්සල්, බ්‍රිස්ටල් බෝඩ්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සමාජයේ යහ පැවැත්මට පාලනය අත්‍යාවශ්‍ය බව උදාහරණ සහිතව පැහැදිලි කරන්න.
- පවුල පදනම් කරගෙන සමාජ පාලනය ආරම්භ වෙන අයුරු පහදා දෙන්න.
- සමාජ පාලනයට නවීන නීතිය දායක වන අයුරු පහදා දෙන්න.
- බුදු දහමට අනුව සමාජය පාලනය වෙන අයුරු පංච සීලය, දසරාජ ධර්ම, සප්ත අපරිහානී ධර්ම ඇසුරින් පහදන්න.
- සමාජ පාලන සංකල්පය සමාජ සම්භවය හා සමග යා වෙන අයුරු දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රය උපයෝගී කර ගනිමින් පහදන්න.
- සමාජ ජීවිතයේ දී ස්වයං පාලනය, ස්වයං හික්මීම ඇතිකරගත යුතු ය, යන්න සහේතුකව පහදන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ පාලනය යනු කුමක් දැයි සරලව සිසුන් ලවා පංතිය ඉදිරියේ පැහැදිලි කර වන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |
| නිවස, පාසල, පන්සල ආශ්‍රයෙන් සමාජ පාලනය සක්‍රීය වෙන අයුරු තේරුම් ගැනීමට මඟ පෙන් වන්න. | සාකච්ඡා ක්‍රමය |
| බුදු දහමේ ඉගැන්වෙන දසරාජ ධර්ම, සප්ත අපරිහානි ධර්ම, පංච සීලය ආදිය මාර්ගයෙන් සමාජ පාලනය සිදුවෙන අයුරු සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජ පාලනය නිසි අයුරින් සිදු නොවන විට පොලීසිය, අධිකරණ, බන්ධනාගාර අවශ්‍ය බව නිදර්ශන සහිතව සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| ස්වයං පාලනය හා සමාජ පාලනය යන මාතෘකාව ඔස්සේ පංතිය ඉදිරියේ කථාවක් ඉදිරිපත් කිරීමට මඟ පෙන්වන්න. | ඉදිරිපත් කිරීම් ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සමාජ "පාලනය" යන්න සරලව පැහැදිලි කිරීම.
- සමාජ පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් සවිස්තරාත්මකව පැහැදිලි කිරීම.
- සමාජ පාලන ක්‍රම ක්‍රමයෙන් විධිමත් වීම පිළිබඳ අදහස් දැක්වීම.
- සමාජ පාලනය නිසිලෙස සිදු වන්නේ නම් සාරධර්ම, සිරිත් විරිත්, ගුණ ධර්ම පිරි සමාජයක් බිහි වීමට හැකි ය. මෙම අන්තර්ගතය ප්‍රයෝජනයට ගනිමින් රචනාවක් ලිවීම.

**නිපුණතාව** - සමාජ පාලනයේ අවශ්‍යතාව අවධාරණය කරයි.

**නිපුණතා මට්ටම** - 5.2 සමාජ පාලනය සඳහා නීති පද්ධතියෙන් කෙරෙන බලපෑම පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 03**

**ඉගෙනුම් පල**

1. නීතිය සමාජ පාලනයට දායක වන ආකාරය පැහැදිලි කරයි.
2. අතීතයෙහි පැවති ලංකාවේ සමාජ පාලන විධි පිළිබඳ පැහැදිලි කරයි.
3. සිවිල් නීතිය සහ අපරාධ නීතිය පිළිබඳව හදුරයි.
4. ශ්‍රී ලංකාවේ නීතිය ක්‍රියාත්මක කරණ පොලීසිය, අධිකරණය, බන්ධනාගාරය යන ආයතනවල වගකීම් අධ්‍යයනය කරයි.

**හැඳින්වීම** -

නවීන සංකීර්ණ සමාජය බහු වාර්ගික ය. බහු ආගමික ය. සමාජ, ආර්ථික වශයෙන් සාමාජිකත්වය අතර දැඩි විවිධත්වයක් නිර්මාණය වී ඇත. මෙවැනි සමාජයක සාමාජිකයා තව දුරටත් සිරිත් විරිත් වැනි සාම්ප්‍රදායික සමාජ පාලන කාරක මාර්ගයෙන් පාලනය කළ නොහැක. එහෙයින් සමස්ත සමාජයට ම පොදු නීති ක්‍රමයක අවශ්‍යතාව උද්ගත වේ. නවීන නීතිය බිහි වන්නේ එහි ප්‍රතිඵලයක් ලෙස ය. මෙම නීතිය ව්‍යවස්ථාගත කර ඇත. එය පුරවැසියන්ට වුවමනා ආකාරයට වෙනස් කිරීමට හෝ විකෘති කිරීමට නොහැකි වේ. නීති පැනවීමේ බලය හිමි වන්නේ ව්‍යවස්ථාදායකයට ය. නීතිය ආරක්ෂා කිරීමේ වගකීම පොලිසිය වෙත භාර දී ඇත. එමෙන් ම නීතිය පසිඳලීමේ වගකීම භාර කරනු ලැබ ඇත්තේ අධිකරණය වෙත ය. රටක ජීවත්වන සියලු පුරවැසියන් නීතිය අභියස එක හා සමාන ය. එය නීතියේ සමානත්වය ලෙස අර්ථ දක්වනු ලැබේ. පුරවැසියා නීතිගරුක විය යුතු ය. නීතිගරුක සමාජයක් මනා පාලනයකින් යුත් ජනාවාසයක් බවට පත් වේ. නීතිය උල්ලංඝනය වන තරමට සමාජ පාලනය බිඳ වැටේ. එහෙයින් නීතිය කඩ කිරීම වරදක් ලෙස අර්ථ දක්වා ඇත. ඒ අනුව නීතිය කඩ කරන්නන් නීතියේ රැහැනට හසු කරගෙන උසාවිය වෙත ඉදිරිපත් කිරීමේ බලය පොලිසිය වෙත පවරා ඇත. යුක්තිය පසිඳලීමෙන් පසු වරදකරුවන්ට දඬුවම් නියම කිරීම හා නිවැරදිකරුවන් නිදොස් කොට නිදහස් කිරීම පිළිබඳ වගකීම අධිකරණය වෙත පවරනු ලැබ ඇත.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- ඉදිරිපත් කිරීමේ ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. නීතිය සමාජ පැවැත්මට හේතු වෙන බව අවධාරණය කරයි.
2. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වෙන නීති ක්‍රමය අධ්‍යයනය කරයි.
3. සිවිල් නීතිය ක්‍රියාත්මක කිරීමේ දී පොලිස් සේවයේ කාර්යභාරය වටහා ගනියි.
4. අධිකරණය හා එහි වගකීම පිළිබඳ විමර්ශනය කරයි.
5. සමාජය සුමගට ගැනීම සඳහා නීතිය අත්‍යාවශ්‍ය බව හඳුනා ගනියි.
6. සමාජ පාලනයේ දී දඬුවම අත්‍යාවශ්‍ය සාධකයක් වන බව පිළිගනී.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්, ලිපි ද්‍රව්‍යය
- බ්‍රිස්ටල් බෝඩ්, ප්ලැටිග්නම්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- නීතිය පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
- නීතිය මගින් සමාජ පාලනය සිදු වෙන අයුරු උදාහරණ සහිතව පහදන්න.
- ලංකාවේ අතීත පාලන ක්‍රම පිළිබඳව සිසුන් දැනුවත් කරන්න.
- නීතිය ක්‍රියාත්මක කරන ආයතනය ලෙස අධිකරණයේ ක්‍රියා පටිපාටිය පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් සිසුන්ට ලබා දෙන්න.
- නවීන සමාජ පාලනයේ මූලික පදනම නීතිය බව පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| සමාජ පාලනයට නීතිය යොදා ගන්නා ආකාරය පෙන්වා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජය පාලනයට පොලිස් නිළධාරියෙකුගේ කැපවීම කෙතරම් ද යන්න අවබෝධ කරවන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |
| ලංකාවේ අතීත පාලන ක්‍රම පිළිබඳව සනිදර්ශනව සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| බන්ධනාගාර ක්‍රමය පිළිබඳ සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| "නීතිමය පාලනය" යන මාතෘකාව ඔස්සේ රචනාවක් ලිවීමට උපදෙස් දෙන්න. | ඉදිරිපත් කිරීම් |
| සාධු සම්මත සමාජයක් නිර්මාණය කිරීම භික්ෂුන් වහන්සේ සතු කාර්යභාරයක් බව සාකච්ඡා කරන්න. | කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| සමාජ පාලනයේ දී විහාරස්ථානය ඇසුරින් ලබා දෙන මඟපෙන්වීම අන් හැම දෙයටම වඩා වැදගත් බව සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- සමාජ පාලනයට නීතිය අවශ්‍ය බව පැහැදිලි කිරීම.
- බන්ධනාගාර ගතවීම යනු සමාජයෙන් ඉවත් කර තැබීමයි. වැරදි නිවැරදි කර ගැනීමෙහි ලා එය ප්‍රශස්ත මග පෙන්වීමකි. එම ප්‍රකාශය යටතේ තම අදහස් ඉදිරිපත් කිරීම.
- පොලීසිය යනු නීතිය සුරැකීමේ ආයතනය බව පැහැදිලි කිරීම.
- නූතන සමාජ පාලන ක්‍රම වඩාත් විධිමත් බව පෙන්වා දීම.
- නවීන සංකීර්ණ සමාජ පාලනයේ දී ද ආගමේ වැදගත්කම නොවෙනස්ව ඇති බව පෙන්වා දීම.

**නිපුණතාව** **-** සමාජ පාලනයේ අවශ්‍යතාව අවධාරණය කරයි.

**නිපුණතා මට්ටම -** 5.3 බෞද්ධ ඉගැන්වීම් මගින් දිරිගන්වනු ලබන ස්වයං පාලනය නූතන සමාජ පාලනයේ දී ව්‍යවහාරික වශයෙන් වැදගත් වන ආකාරය පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 03**

**ඉගෙනුම් පල**

1. සමාජ පාලනයට ස්වයං විනය අත්‍යාවශ්‍ය බව පැහැදිලි කරයි.
2. බුදු දහමේ ඉගැන්වෙන පංච නීවරණ, පංච සීලය, සප්ත අපරිහානි ධර්ම, දසරාජ ධර්ම යන සංකල්ප මාර්ගයෙන් සමාජ පාලනය වන අයුරු පැහැදිලි කරයි.
3. භාවනාව සමාජ පාලනයට දයක කර ගත හැකි බව පෙන්වා දෙයි.
4. සමාජ පාලනකාරකයක් ලෙස විහාරස්ථානයේ වැදගත්කම පිළිබඳ අදහස් දක්වයි.

**හැඳින්වීම** **-**

බුදු දහමේ කේන්ද්‍රීය අරමුණ වන්නේ සාමාජිකයා නිවැරදි කර ගැනීම යි. සාමාජිකයා ධර්මයට අනුකූලව තම සිත, කය, වචනය සංවර කර ගැනීම ස්වයං පාලනය මගින් බලාපොරොත්තු වේ. සමස්ත සාමාජිකත්වය මේ ආකාරයට සංවර කර ගැනීමට හැකි වුවහොත් එහි නියත ප්‍රතිඵලය වන්නේ මනා ලෙස පාලනය වූ සමාජයක් නිර්මාණය වීමයි. එවැනි සමාජයකින් කිසිදු සමාජ විරෝධී ක්‍රියාවක් හෙවත් අපරාධයක් වාර්තා නොවනු ඇත.

ළමා වියේ සිට දරුවා මනා ලෙස අනුයෝජනය කිරීමෙන් නීරෝගී පෞරුෂයක් ගොඩනගා ගත හැකි ය. එකී දරුවා දහමේ ඇසුරට යොමු කිරීමෙන් තව දුරටත් මෙම පෞරුෂය සමාජශීලි යහපත් ගුණ ධර්මවලින් පෝෂණය වනු ඇත.

නූතන සමාජය පිරිහීමට හේතුව පංචසීලය, ආර්ය අෂ්ටාංගික මාර්ගය, සප්ත අපරිහානි ධර්ම, දසරාජ ධර්ම වැනි කාරණා පිළිබඳ දැනුම සමාජයෙන් ඈත් වීමයි. එබැවින් මෙම ධර්ම කරුණු අධ්‍යයනය කර පිළිපැදීම සුචරිතවත් සමාජයක් ගොඩ නගා ගැනීමට හේතු වනු ඇත.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- ඉදිරිපත් කිරීමේ ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. බෞද්ධ ඉගැන්වීම් ස්වයං ශික්ෂණය සඳහා ඉවහල් වන අයුරු අධ්‍යයනය කරයි.
2. සාමාජිකයා තුළ ආකල්පමය සංවර්ධනයක් ඇති කිරීමට විහාරස්ථානය සුවිශාල මෙහෙවරක් ඉටු කරන බව අවබෝධ කර ගනියි.
3. සමාජ ශික්ෂණය යනු භික්ෂූන් වහන්සේගේ කැප වීමේ ප්‍රතිඵලයක් බව තේරුම් ගැනීමට සමත් වෙයි.
4. රටේ පවතින නීතිරීති පද්ධතියට අනුගතව ස්වයං පාලනය ඇති කර ගැනීමට කටයුතු කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්, ලිපි ද්‍රව්‍යය
- බ්‍රිස්ටල් බෝඩ්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- බෞද්ධාගම නිරතුරුවම ශික්ෂණය, පාලනය උගන්වන බව සූත්‍ර ධර්ම උපයෝගී කරගෙන පැහැදිලි කරන්න.
- භාවනාව දියුණු කර ගැනීමෙන් ස්වයං ශික්ෂණය ඇතිකර ගත හැකි බව උදාහරණ සහිතව පෙන්වා දෙන්න.
- භික්ෂූන් වහන්සේ සෑම විටම සමාජයට නායකත්වය ලබා දෙන තැනැත්තෙකි. සනිදර්ශනව පහදා දෙන්න.
- දහම් දේශනා කිරීමේ දී නූතන සමාජ ගැටලු ධර්මානුකූලව විග්‍රහ කරන අයුරු පහදා දෙන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| ස්වයං පාලනය ඇති කරන පංච සීලය, සූත්‍ර ධර්ම, හා අනිකුත් බෞද්ධ ඉගැන්වීම ගැන හැකි අයුරු සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| ධම්ම පදයේ ඉගැන්වෙන ගාථා ධර්ම ඇසුරින් සමාජ පාලනයට මඟ පෙන්වන අයුරු සාකච්ඡා කරන්න. (අදාළ ගාථා ධර්ම යොදා ගන්න) | සාකච්ඡා ක්‍රමය |
| විහරස්ථානය මුල් කරගෙන සමාජය තුළ පාලනය, ශික්ෂණය ඇති කරවන අයුරු පැහැදිලි කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| භික්ෂුව නිරතුරුව සමාජයට නායකත්වය දියයුතු පුද්ගලයෙකු බව අවබෝධ කරවන්න. (ආගමික සංහිදියාව පැහැදිලි කරමින්) | සාකච්ඡා ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- ස්වයං පාලනය ඇතිකර ගැනීමට ප්‍රායෝගිකව යොදා ගත හැකි බෞද්ධ ඉගැන්වීම් 04ක් පැහැදලි කිරීම.
- බෞද්ධ සූත්‍ර ධර්ම සමාජ පාලනයට දායක වන අයුරු පැහැදිලි කිරීම.
- මිනිසා සංවර වීම යනු සිත සංවර කර ගැනීමයි. බිත්ති පුවත්පතකට ලිපියක් ලිවීම.
- සමාජ පාලනය, ශික්ෂණය ඇතිකර ගැනීමට භික්ෂූන් වහන්සේ ඉටු කරන කාර්යභාරය කරුණු 5ක් යටතේ පැහැදිලි කිරීම.

## සමාජ ගැටලු

**නිපුණතාව -** සමාජ ගැටලු විශ්ලේෂණය කරයි.

**නිපුණතා මට්ටම -** 6.1 එකිනෙක සමාජ ගැටලුවට පසුබිම්වන හේතු සාධක විශ්ලේෂණය කරයි.

6.2 කසල කළමනාකරණ ගැටලුව, මදිරාබාධය සමාජ ගැටලු බවට පත්වන ආකාරය පැහැදිලි කරයි.

6.3 ඉහත තෝරා ගත් සමාජ ගැටලු කළමනාකරණය සඳහා බුදු දහමේ ඉගැන්වීම් භාවිතා කරයි.

**කාලච්ඡේද -** 12

**හැඳින්වීම -**

සමාජ විද්‍යාව නමැති නව විෂය බිහිවන්නේ ම සමාජ ගැටලු පදනම් කොට ගෙනය. සමාජ සංකීර්ණත්වය වැඩිවන සෑම තැනක ම විවිධාකාර සමාජ ගැටලු නිර්මාණය වන බව යළි යළිත් තහවුරු වී ඇත. 19 වන සියවස වන විට යුරෝපයේ කාර්මික ජනපද ආශ්‍රිත නාගරික සමාජවල විවිධ සමාජ ගැටලු උද්ගත වී ඇත. ජනගහනය ඉහළ යාම, ජන වාර්ගික අසමානත්වය, පන්ති විෂමතාව, සේවා වියුක්තිය, දුප්පත්කම, නූගත්කම වැනි හේතු සාධක මෙලෙස උද්ගත වූ සමාජ ගැටලුවලට පාදක වූයේ ය. සමාජ විද්‍යාව නම් විෂය බිහිවන්නේ මෙලෙස උද්ගත වූ සමාජ ගැටලු අධ්‍යයනය කිරීම අරමුණු කොට ගෙන ය. වර්තමාන ලෝක සමාජය අන් කවර කලකටත් වඩා විවිධ සමාජ ගැටලුවලට මුහුණ දෙමින් සිටින බව නොරහසකි. වර්තමාන ශ්‍රී ලංකා සමාජය ද ගැටලු රැසකට මුහණ පා සිටින බව ඉතාමත් ප්‍රකට ය. සුපුරුදු පරිදි මෙරට සමාජ ගැටලු නිර්මාණය වීම සඳහා ද ඉවහල් වන්නේ ලොව අනිකුත් සමාජවලට පදනම් වූවා හා සමානව එකම හේතු සාධක සමූහයකි. සීමිත භූමි භාගයක ප්‍රමාණය ඉක්මවා එකතුවන ජනගහනය සමාජ ගැටලු නිර්මාණය කෙරේ ඉවහල් වන මූල සාධකය වන්නේ ය. විශේෂයෙන් මෙරට නාගරික ජනාවාසවල මෙම තත්ත්වය දැකිය හැකි වන්නේ ය. එහි ප්‍රතිඵලයක් ලෙස විරැකියාව, දුප්පත්කම, මත් උවදුර, පැල්පත් ජනාවාස, හොරකම්, මංකොල්ල, මිනී මැරුම්, ගණිකා වෘත්තිය, සමාජ රෝග ව්‍යාප්තිය, කැලි කසල ගැටලුව, නූගත්කම්, ළමා අපයෝජනය වැනි සමාජ ගැටලු රැසක් නිර්මාණය වී ඇත. මේ එක ද ගැටලුවක් හෝ ස්වභාවික හේතු මත නිර්මාණය වී නැත. සියල්ලට පදනම් වී ඇත්තේ මිනිස් ක්‍රියාකාරකම් ය. එහෙයින් ඒවා සමාජ ගැටලු ලෙස නම් කරනු ලැබේ. එනම් සැලසුමකින් තොර අවිධිමත් මිනිස් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස සමාජ ගැටලු උත්පාදනය වන බවයි. එහෙයින් මිනිස් ක්‍රියාකාරකම් විධිමත් කර ගැනීමෙන් මෙකී සමාජ ගැටලු මිනිසාට ම විසඳ ගැනීමට හැකි වන බව පෙන්වා දිය හැකි ය.

**නිපුණතාව -** සමාජ ගැටලු විශ්ලේෂණය කරයි.

**නිපුණතා මට්ටම-** 6.1 එකිනෙක සමාජ ගැටලුවට පසුබිම්වන හේතු සාධක විශ්ලේෂණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 04**

**ඉගෙනුම් පල**

1. සමාජ ගැටලු නිර්මාණයවීම කෙරෙහි බලපාන සාධක හඳුන්වයි.
2. එක් එක් සමාජ ගැටලු නිර්මාණයවීම කෙරෙහි බල පෑ සමාජ පසුබිම පැහැදිලි කරයි.

**හැඳින්වීම -**

සමාජ ගැටලු නිර්මාණය වීමෙහිලා ඉවහල්වන මූලික ඒකකය පවුල බව පෙන්වා දිය හැකිය. සමාජයේ කුඩාම ඒකකය වන පවුලේ මූලිකත්වයෙන් නිර්මාණය වන ව්‍යාකූලතා වර්ධනය වීමෙන් සමස්ත සමාජයටම බලපාන සමාජ ගැටලු උද්ගත වේ. ශ්‍රී ලාංකික සමාජයේ පවතින උග්‍ර සමාජ ගැටලු ලෙස සැලකිය හැක්කේ, මත්ද්‍රව්‍ය භාවිතය, ස්ත්‍රී දූෂණය, ළමා අපයෝජනය, ගණිකා වෘත්තිය, දුගීකම, සියදිවි හානිකර ගැනීම ආදිය යි. ඕනෑම සමාජ ගැටලුවක පසුබිම් වාචී හේතු සාධක ලෙස,

- බිඳුණු පවුල්
- නිසි රාජ්‍ය පාලන ප්‍රතිපත්තියක් නොමැති කම
- නීතිය අකර්මන්‍ය වීම
- සංස්කෘතිය බිඳ වැටීම
- ආර්ථික අපහසුතාවය
- නූතන තාක්ෂණය අනිසි ලෙස භාවිත කිරීම
- සමාජානුයෝජන ඌණතා
- ආගමේ සමාජ මෙහෙවර බිඳ වැටීම
- ආකල්ප බිඳ වැටීම
- නවීන විද්‍යුත් මාධ්‍ය අව භාවිතය

යනාදී කරුණු දැක්විය හැකිය. පවුල නමැති ඒකකය තුළ ස්වාමි භාර්යා, දෙමාපිය දූදරු සබඳතාවය ගිලිහීම ද සමාජ ගැටලුවලට ප්‍රධාන හේතුවක් වී ඇත. නිවසින් නිසි සමාජානුයෝජනයක් නොලැබුණහොත් එවැනි දරුවන් සමාජයට පිළිලයක් වේ. යහපත්

සුචරිතවත් දරුවෙකු බිහි කිරීම සඳහා පවුලෙන් ඉටු වන කාර්යභාරය අතිමහත් ය. පවුල බිඳ වැටුණහොත් එයින් බිහි වන දරුවන් විවිධ ව්‍යසනයන්ට යොමුවීමෙන් සමාජ ප්‍රගමනයට බාධා ඇති වන්නේ ය.

බිඳුණු පවුල් වලින් පැවත එන දරුවන් විවිධ අක්‍රමිකතාවලට ගොදුරුවීමේ ප්‍රවණතාවය බහුල බව වාර්තාවලින් අනාවරණය වී ඇත.

තවත් කරුණක් ලෙස රාජ්‍ය පාලන ප්‍රතිපත්තිද සමාජ ගැටලු නිර්මාණය වීමට හේතුවක් වී ඇත. රජය මගින් නිසි පාලන ප්‍රතිපත්ති අනුගමනය නොකරන හෙයින් එය විවිධ සමාජ ගැටලුවලට මංපෙත් විවර කරනු ඇත. ඕනෑම රටක පාලන ප්‍රතිපත්තිය තුළ නීතිය ශක්තිමත් වීම අත්‍යවශ්‍ය කරුණකි. එහෙත් රටේ නීතිය ආරක්ෂා කරනු ලබන පොලීසිය, අධිකරණය වැනි ආයතන අඩපන වීම සමාජ ගැටලු වර්ධනය වීමට හේතු වනු ඇත.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය
- ඉදිරිපත් කිරීම්
- කණ්ඩායම් ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ ගැටලුවලට පසුබිම් වන හේතු සාධක අනාවරණය කර ගැනීම ගැටලු වළක්වා ගැනීම සඳහා වැදගත් වන බව වටහා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන, කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සාමාජිකයා හා සමාජය අතර රෝගී සම්බන්ධතාව පිළිබඳ සාකච්ඡා කරන්න.
- එම සමාජ පසුබිම මත ගැටලු ඇති වන ආකාරය පැහැදිලි කරන්න

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| විවිධ සමාජ පසුබිම්වලට අදාළ ඡායාරූප හෝ වීඩියෝ දර්ශන පෙන්වන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| විවිධ සමාජ පසුබිම්වලට අදාළව ගැටලු ඇති වන බව සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජ ගැටලු නිර්මාණය වීම කෙරෙහි බලපාන සාධක සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සමාජ ගැටලුවලට හේතු වන සාධක එක් එක් සමාජ ගැටලුවට ඉවහල් වන ආකාරය සමාජ ගැටලු කිහිපයක් අනුසාරයෙන් සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම අංක 1 කාර්ය පත්‍රිකාව ලබා දෙන්න. | කණ්ඩායම් ක්‍රමය |
| වාර්තා පන්තියට ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- දකින, අසන සමාජ ගැටලු 5 ක් ලිවීම.
- එක් සමාජ ගැටලුවක් තවත් සමාජ ගැටලු හට ගැනීමට හේතුවන ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කිරීම.

**ඇමුණුම 01**

**කාර්ය පත්‍රිකා 01**

පහත සඳහන් මාතෘකාවට අනුව සමාජ ගැටලුවක් නිර්මාණය වීමට බලපා ඇති හේතු සාධක වෙන වෙන ම ලැයිස්තුගත කරන්න.

A කණ්ඩායම - මත්ද්‍රව්‍ය භාවිතය

B කණ්ඩායම - ළමා අපයෝජනය

**නිපුණතාව -** සමාජ ගැටලු විශ්ලේෂණය කරයි.

**නිපුණතා මට්ටම -** 6.2 කසළ කළමනාකරණ ගැටලුව, මදිරාබාධය, සමාජ ගැටලු බවට පත්වන ආකාරය පැහැදිලි කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 04**

**ඉගෙනුම් පල**

1. කසළ කළමනාකරණ ගැටලුව මගින් සාමාජිකයාට හා සමාජයට සිදුවන බලපෑම පැහැදිලි කරයි.
2. මදිරාබාධයෙන් සාමාජිකයාට සහ සමාජයට සිදු වන බලපෑම පැහැදිලි කරයි.

හැඳින්වීම -

කැලිකසළ ගැටලුව මගින් සිදුවන හානිකර බලපෑම :

කැලිකසළ කළමනාකරණය සමාජ ගැටලුවක් බවට පත්වීම සමාජමය වශයෙන් ඉතාමත් හානිකර වේ.

- පරිසර දූෂණය
  - → ජල දූෂණය
    - → භූගත දූෂණය
    - → භූතල දූෂණය
  - → වාතය දූෂණය
  - → පස දූෂණය
- බෝවන රෝග ව්‍යාප්තිය
- වනජීවීන්ගේ වඳ වී යාම
- හානිකර රසායනික ද්‍රව්‍ය පරිසරයට එකතු වීම
- මානසික අසහනය ඇතිවීම.
- ශාරීරික සෞඛ්‍ය හා මානසික සෞඛ්‍ය පිරිහීම
- බෝග වගාවන් විනාශ වීම

**මදිරාබාධය මගින් සිදුවන හානිකර බලපෑම්:**

**මත්ද්‍රව්‍ය යනු භාවිත කරන්නන් තුළ යම් යම් කායික මානසික හා චර්යාමය වෙනස්කම් ඇතිකර වන ස්වාභාවික හෝ කෘතිම දවය වලින් නිපදවනු ලබන රසායනික දව්‍ය විශේෂයකි. නීතියෙන් තහනම් කර ඇති එම නීතිවිරෝධි ද්‍රව්‍යයන් භාවිතයෙන් භාවිත කරන්නාට මෙන්ම සමාජයට දැඩි හානිකර බලපෑම් ඇති වේ.**

මදිරාබාධය

- කායික රෝග
- මානසික රෝග
- බිඳුණු පවුල් නිර්මාණය වීම
- දරුවන්ගේ අධ්‍යාපනය බිඳ වැටීම
- දරුවන් නොමඟ යාම
- ළමා අපයෝජනය
- දුප්පත්කම
- සමාජ රෝග පැතිරීම
- ස්නායු ආබාධ ඇතිවීම
- සියදිවි නසා ගැනීම
- හොරකම්, මංකොල්ල කෑම්, වංචා, දූෂණ, බහුල වීම
- අඬ දබර, සණ්ඩු සරුවල් බහුල වීම
- මාර්ග අනතුරු වැඩි වීම

**මෙවැනි ගැටලු රැසක් නිර්මාණය කිරීමට ඉහල් වන පදනම් සාධකය මදිරා බාධය යි. මෙකී සියලු ගැටලුවල බලපෑම සමාජයක සමබර පැවැත්ම දැඩි ලෙස අභියෝගයට ලක් කරන බව ඉතාමත් පැහැදිලි ය.**

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ප්‍රදර්ශන ක්‍රමය
- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- ඉදිරිපත් කිරීමේ ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. මදිරාබාධය සෞඛ්‍යයට අහිතකර බව හා එහි හානිකර සමාජ බලපෑම හැදින ගනියි.
2. කසල ගැටලුව පරිසර දූෂණයට මෙන් ම තවත් ගැටලු රැසකට හේතුව බව අවබෝධ කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- වීඩියෝ දර්ශන
- කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- මදිරාබාධය මගින් සමාජයට ඇතිවන හානිකර තත්ත්වය නිදසුන් මගින් පැහැදිලි කරන්න.
- කැලිකසල ගැටලුව මගින් සමාජයට ඇති කරන හානිකර බලපෑම නිදසුන් දෙමින් පැහැදිලි කරන්න
- තෝරාගත් ගැටලු දෙක මගින් ඇති කරන අහිතකර බලපෑම පහත ශීර්ෂ යටතේ සාකච්චා කරන්න.
- සෞඛ්‍යමය, ආර්ථිකමය, සමාජීය, සංස්කෘතික, දේශපාලන

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| මදිරාබාධය, කැලිකසල කළමනාකරණ ගැටලුව මගින් සමාජයට කරන හානිය දැක්වෙන වීඩියෝ දර්ශනයක් නැරඹීමට සලස්වන්න. | ප්‍රදර්ශන ක්‍රමය |
| මදිරාබාධය මගින් සමාජයට ඇති කරන හානිකර බලපෑම සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| කැලිකසල ගැටලුව මගින් සමාජයට ඇති කරන හානිකර බලපෑම සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 3 කාර්ය පත්‍රිකාව ලබා දෙන්න. | සාකච්ඡා ක්‍රමය |
| වාර්තා පන්තියට ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- කසළ ගැටලුව හා මදිරාබාධය නිසා සමාජයට වන හානිකර බලපෑම පැහැදිලි කිරීම.
- සතියේ දින පහට අදළව පිරිවෙණ තුළ කසළ කළමනාකරණය කර ගැනීම සඳහා සැලැස්මක් සකස් කිරීම.

**ඇමුණුම් අංක 3**

**කාර්ය පත්‍රිකා 02**

පහත සඳහන් සමාජ ගැටලු දෙකට අදාළව සමාජයට වන හානිකර බලපෑම් 5 බැගින් ලියන්න.

A කණ්ඩායම - මදිරාබාධය

B කණ්ඩායම - කැලිකසළ ගැටලුව

**නිපුණතාව -** සමාජ ගැටලු විශ්ලේෂණය කරයි.

**නිපුණතා මට්ටම -** 6.3 තෝරාගත් සමාජ ගැටලු කළමනාකරණය සඳහා බුදු දහමේ ඉගැන්වීම් භාවිතා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 04**

**ඉගෙනුම් පල**

1. තෝරා ගත් සමාජ ගැටලු කළමනාකරණයෙහිලා උපයෝගී කර ගත හැකි බෞද්ධ ඉගැන්වීම් හඳුන්වයි.
2. සමාජ ගැටලු වළක්වා ගැනීමෙහිලා බෞද්ධ ඉගැන්වීම් උපයෝගී කර ගනියි.

**හැඳින්වීම -**

සමාජ ගැටලු වළක්වා ගැනීම සඳහා බුදු දහමේ දැක්වෙන දහම් කරුණු උපයෝගී කර ගත හැකිය. වසර 2500 කට පෙර බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්ම කරුණු වර්තමානයේ පැන නැගෙන බොහෝ සමාජ ගැටලු නිරාකරණය කර ගැනීමට ද භාවිත කළ හැකිය. මෙහිදී දැක්වෙන සමාජ ගැටලු දෙකක් වන මදිරාබාදය හා කසළ ගැටලුව අරමුණු කොට ගෙන එක එල්ලේ ම පිළිතුරු සැපයීම සඳහා බුදුන් වහන්සේ විසින් දේශිත පහත සඳහන් සූත්‍ර ධර්ම දයක කර ගත හැකි වේ.

- සීගාලෝවාද සූත්‍රය
- ආරාමරෝපා වනරෝපා සූත්‍රය
- පරාභව සූත්‍රය
- චක්කවත්ති සීහනාදසූත්‍රය
- සිඟලෝවාද සූත්‍රය :

තුදුස්පාප ධර්ම තුළ ඇති ධන විනාශ මුඛ හයෙන් එකක් වන සුරාමේරය මජ්ජපමාදට්ඨානානුයොගො

මදයට හෙවත් මත්වී සිහි කල්පනාව නැතිවීමට, ප්‍රමාදයට හෙවත් විළිබිය නැතිව අකුසල කර්මවල යෙදීමට හේතු වේ. සුරාමේරය යැයි කියන මත්පැන් හෝ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ආදීනව හයකි.

i. බලා සිටියදීම ධනය විනාශ වී යාම.

ii. කලකෝලාහල වැඩිවීම.

iii. රෝගයන්ට ආකරයක්වීම.

iv. අපකීර්තිය ඇතිවීම.

v. විළිබිය නැතිව හැසිරීම

vi. නුවණ දුර්වල වීම.

vii. යුතුකම් වගකීම් ඉටු නොවීම
ආරාම රෝපා වනරෝපා සූත්‍රය

ආරාම ඉදි කිරීම, ගස් කොලන් ඉදි කිරීම, ඒ දඬු ඉදි කිරීම, පැන් භාජන තැබීම, උද්‍යාන ඉදි කිරීම වාසස්ථාන සකස් කිරීම යන සෑම කටයුත්තක් ම පිං වැඩෙන පිංකම් ලෙස සඳහන් කර ඇත. අප අවට පරිසරය අපිරිසිදු නොකර පිරිසිදුව තබා ගැනීම කළ යුතු බව මෙහිදී පෙන්වාදී ඇත. කුණු කසල නැති පිරිසිදු වටා පිටාවක් තබා ගත යුතු බව ද මෙහි පෙන්වාදී ඇත.

- පරාභව සූත්‍රය

ඉත්ථී ධුත්තෝ සුරාධුත්තෝ අක්ඛධුත්තෝ ච යෝ නරෝ
ලද්ධං ලද්ධං විනස්සන්ති තං පරාභවතෝ මුඛං

''යම් මිනිසෙක් ස්ත්‍රීන්ට ලොල් වූයේ සුරාවට ලොල් වූයේ, සූදුවට ලොල් වූයේ ලැබුණු ලැබුණු ධනය වනසයිද, එය පිරිහෙන්නාගේ දොරටුවකි''.

සුරාවට ලොල්වීමෙන් පිරිහෙන බව මෙයින් කියැවේ.

- චක්කවත්ති සීහනාද සූත්‍රය

දස සක්විතිවත්, දසරාජධර්ම, සප්ත අපරිහානි ධර්ම, සතර සංග්‍රහ වස්තුව

මෙම කරුණු වලින් ද කියවෙන්නේ වැරදි ජීවන ක්‍රම වලින් ඇත්වී (මත්ද්‍රව්‍ය වලින් ඇත්වීම) සුචරිතවත්, අර්ථවත් ජීවන ක්‍රමවල නියැලිය යුතු බවයි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- ප්‍රදර්ශන ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- ඉදිරිපත් කිරීම් ක්‍රමය
- සාකච්ඡා ක්‍රමය

**ආකල්ප හා ඇගයුම්**

1. සමාජ ගැටලු විසඳීමට බුදු දහම දායක කර ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- සූත්‍ර, පොත් පත්, වීඩියෝ දර්ශන, කාර්ය පත්‍රිකා

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සමාජ ගැටලු විසඳීමට බුදු දහම දායක කර ගත හැකි බව පෙන්වා දෙන්න.
- තෝරාගත් සමාජ ගැටලු දෙක සඳහා බුදු දහමේ දැක්වෙන විසඳුම් සූත්‍ර ධර්ම ඇසුරින් සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ලැයිස්තුගත කළ සූත්‍ර ධර්ම එක එකක් තෝරාගත් ගැටලුව විසඳීමට යොදා ගත හැකි ආකාරය සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| තෝරාගත් සමාජ ගැටලු දෙක විසඳීමෙහිලා පාදක කර ගත හැකි සූත්‍ර පොත් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න. නැතහොත් ඒ ඒ සූත්‍ර ත්‍රිපිටකයේ ඇතුළත් වන ආකාරය අන්තර්ජාල පහසුකම් භාවිතා කරමින් පෙන්වන්න | ප්‍රදර්ශන ක්‍රමය |
| පෙන්වන ලද සූත්‍ර ධර්ම කොටස් තෝරාගත් සමාජ ගැටලු දෙක විසඳීමට දයක වන ආකාරය වෙන වෙන ම පැහැදිලි කරන්න.<br>• සිගාලෝවාද සූත්‍රය<br>• ආරාමරෝපා වනරෝපා සූත්‍රය<br>• පරාභව සූත්‍රය<br>• චක්කවත්ති සීහනාද සූත්‍රය | සාකච්ඡා ක්‍රමය |
| සිසුන් කණ්ඩායම් කර ඇමුණුම් අංක 4 කාර්ය පත්‍රිකාව ලබා දෙන්න. | කාණ්ඩායම් ක්‍රමය |
| වාර්තා පංතියට ඉදිරිපත් කර ඇගයුම හා ප්‍රතිපෝෂණය ලබා දෙන්න. | ඉදිරිපත් කිරීමේ ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- තෝරාගත් සමාජ ගැටලු දෙක කළමනාකරණය සඳහා බුදු දහමෙන් ලැබෙන මග පෙන්වීම පැහැදිලි කිරීම.
- කැමති සමාජ ගැටලුවක් ගෙන එය නිවාරණයට බුදු දහමේ දායකත්වය කොතෙක් දැයි පෙන්වා දීම.
- කසළ කළමනාකරණ ගැටලුව සඳහා ස්ථිර විසඳුමක් ලබා දිය යුතු ය. ඒ සඳහා විසඳුම් 02ක් යෝජනා කිරීම

**ඇමුණුම් අංක 4**

**කාර්ය පත්‍රිකා 4**

පහත සඳහන් සමාජ ගැටලු විසඳීමට බුදුදහමේ ඉගැන්වෙන දහම් කරුණු කොතෙක් දුරට දායක කරගත හැකි දැයි පෙන්වා දෙන්න.

**A** කණ්ඩායම : මදිරාබාධය

B කණ්ඩායම : කැලිකසළ ගැටලුව

## සමාජය අධ්‍යයනය කිරීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක්

**නිපුණතාව -** 7.0 සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම සඳහා වන ක්‍රමවේදය හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම් -** 7.1 සමාජ විද්‍යාත්මක පර්යේෂණයක් සැලසුම් කරයි.

7.2 මූලාශ්‍ර භාවිතය පිළිබඳ කරුණු අධ්‍යයනය කරයි.

7.3 දත්ත එක්රැස් කිරීමේ විධික්‍රම අධ්‍යයනය කරයි.

7.4 අවට සමාජය පිළිබඳ සරල පර්යේෂණයක් කර වාර්තාවක් ඉදිරිපත් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 12**

හැඳින්වීම -

විද්‍යාවක් යනු තර්කානුකූලව ගොඩ නගන ලද දැනුම් සම්භාරයක එකතුවකි. සමාජ විද්‍යාව ද විද්‍යාත්මක විෂයයක් වන හෙයින් ඉහත අර්ථ නිරූපණය සමාජ විද්‍යාවට ද සාධාරණ වන්නේ ය. එහෙයින් සමාජ විද්‍යාත්මක දැනුම ද විද්‍යාත්මක ගුණයෙන් යුක්ත විය යුතු වේ. එයින් අදහස් වන්නේ නව දැනුම සොයා යාමේ දී සමාජ විද්‍යාඥයාට ද විද්‍යාත්මක විධික්‍රම භාවිතයට ගැනීම අත්‍යවශ්‍ය වන බව යි.

සමාජ විද්‍යාවට පදනම් වන විෂය ක්ෂේත්‍රය වන්නේ සමාජය යි. විද්‍යාත්මක පර්යේෂණයකට නිමිති වන්නේ ගැටලුවකි. ගැටලුවක් යනු හේතුඵල සම්බන්ධතාවට අනුව නිර්මාණය වන අර්බුධ හෙවත් ව්‍යසනකාරී තත්ත්වයකි. එවැනි ව්‍යසන නිරාකරණය කර නොගෙන සමාජයකට නිරවුල්ව ඉදිරියට ගමන් කළ නොහැක. එහෙයින් ගැටලුව නිර්මාණය කිරීමට පදනම් වන සැබෑ හේතු සාධක අනාවරණයට කර ගැනීම අනිවාර්ය කොන්දේසියක් වේ. විද්‍යාත්මක පර්යේෂණ මගින් ඉටු කරනු ලබන්නේ සමාජීය වශයෙන් අතිශයින් වැදගත් මෙම අවශ්‍යතාව යි. එහි දී පොදුවේ සම්මත කොට ගෙන ඇති විද්‍යාත්මක ක්‍රමය භාවිත කරමින් සමාජ විද්‍යාඥයා ද සිය පර්යේෂණ මෙහෙයවනු ලැබේ. (4 ශ්‍රේණිය උගත් විද්‍යාත්මක ක්‍රමය යළි පරිශීලනය කරන්න)

**නිපුණතාව -** සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම සඳහා වන ක්‍රමවේදය හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම-** 7.1 සමාජ විද්‍යාත්මක පර්යේෂණ සැලසුම් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 03**

**ඉගෙනුම් පල**

2. පර්යේෂණ සැලැස්මක් යනු කුමක් ද? යන්න පැහැදිලි කරයි.
3. සැලැස්මක් සැකසීමේ පියවර පැහැදිලි කරයි.
4. සමාජීය ජීවිතයේ දී මිනිසා නිශ්චිත රටාවකට අනුව ක්‍රියාකරන අයුරු උදාහරණ, සහිතව පෙන්වා දෙයි.
5. යම් පර්යේෂණයක් සාර්ථකව නිම කිරීමට සැලැස්මක් අනිවාර්ය වන බව පහද දෙයි.

**හැඳින්වීම -**

පර්යේෂණ සැලැස්මක් යනු යෝජිත පරයේෂණයක් අපේක්ෂිත කාල සීමාවක දී ලැබී ඇති සම්පත් උපරිමයෙන් යොද ගනිමින් සාර්ථක ලෙස අවසන් කර ගන්නා ආකාරය දක්වන දළ සටහනකි. ක්ෂේත්‍රයට ඇතුළු වන දිනය, තොරතුරු රැස් කිරීම ආරම්භ කිරීම, එක් දිනක දී ආවරණය කිරීමට අපේක්ෂිත වැඩ ප්‍රමාණය යන කරුණු එහි ඇතුළත් විය යුතු වේ. ඊට අමතරව නවාතැන්, ආහාර සම්පාදනය, ප්‍රවාහන පහසුකම් වැනි අවශ්‍යතාවන් ද කල් වේලා ඇතිව සැලසුම් කර ගත යුතු වේ. දෛනිකව උද්ගත වන අනපේක්ෂිත ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා ද දිනපතා අවස්ථාවක් වෙන්කර ගත යුතු ය. මේ අනුව සලකා බලන විට පර්යේෂණ සැලැස්මක් යනු නිශ්චිත කාල රාමුවකට යටත් වූ වැඩ සැලැස්මක් බව පැහැදිලි වේ.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය
- ඉදිරිපත් කිරීම්

**ආකල්ප හා ඇගයුම්**

1. සැලැස්මක් යනු පූර්ව සූදනම පිළිබිඹු කරන දළ සටහනක් බව වටහා ගනියි
2. පංති කාමරය තුළ සැලැසුමකට අනුව වැඩ කිරීමේ වැදගත්කම අගයයි
3. පර්යේෂණයක් සඳහා අවශ්‍ය සැලැස්මක් නිර්මාණය කිරීමට ක්‍රියාකරයි
4. නිවැරිදි සැලසුමකින් යුතුව කටයුතු කිරීමට හුරුවෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්, බිස්ටල් බෝඩ්

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සැලැස්මක් යනු කුමක් ද යන්න පැහැදිලි කරන්න.
- පර්යේෂණ සැලැස්මක් සකසා ගන්නා අයුරු පැහැදිලි කරන්න.
- සැලැස්මක් සැකසීමේ දී සැලකිල්ලට ගත යුතු විෂය කරුණු සාකච්ඡා කරන්න.
- පංතිකාමරය තුළ සැලැස්මක් ඇතිව කටයුතු කරන අයුරු විමසන්න.
- අරමුණු සාධනය කිරීමට ද සැලැස්මකට අනුව ක්‍රියා කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- පර්යේෂණ සැලැස්මක් සකසා ගැනීමේ ප්‍රයෝජන පිළිබඳව සිසුන්ව දැනුවත් කරන්න.
- සැලසුම් කිරීමේ දී සාමාජිකයා, ස්ථානය, ප්‍රදේශය ආදිය පිළිබඳ විමසිලිමත් විය යුතු බව පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| පර්යේෂණ සැලැස්මක් යනු කුමක්දැයි සිසුන් හා සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| සැලැස්මක අන්තර් ගත විය යුතු කරුණු සම්බන්ධයෙන් සිසුන්ගෙන් ප්‍රශ්න කරමින් පැහැදිලි කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| එදිනෙදා ජීවිතයේ දී සැලැස්මක් ඇතිව ක්‍රියා කිරීම සාර්ථක පුද්ගලයෙකු නිර්මාණය කිරීමට පිටුවහලකි. උදාහරණ සහිතව පැහැදිලි කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| තොරතුරු රැස්කිරීමේ දී පර්යේෂකයා උපක්‍රම ශිලි විය යුතුය. සිසු අදහස් විමසමින් පැහැදිලි කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| පර්යේෂණ ක්‍රමවල ඇති වාසි සහ අවාසි පිළිබඳව සාකච්ඡා කරන්න. | ඉදිරිපත් කිරීම් |
| පංති කාමරයේ දී පර්යේෂණ සැලසුම්කරණය පිළිබඳ ආකෘති පත්‍රයක් සැකසීමට උපදෙස් ලබා දෙන්න. | කණ්ඩායම් හෝ කේවල |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- පර්යේෂණ සැලසුම්කරණය යනු කුමක් දැයි පැහැදිලි කිරීම.
- සැලසුමක් සැකසීමේ දී සැලකිල්ලට ගත යුතු විෂය කරුණු මොනවා දැයි දැක්වීම.
- දෛනික අධ්‍යාපන කටයුතු ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට අදාළ සැලැස්මක් පිළියෙල කිරීම.

**නිපුණතාව -** සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම සඳහා වන ක්‍රමවේදය හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම-** 7.2 / 7.3

7.2 මූලාශ්‍ර භාවිතය පිළිබඳ කරුණු අධ්‍යයනය කරයි.

7.3 දත්ත එක් රැස් කිරීමේ විධික්‍රම අධ්‍යයනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව 05**

**ඉගෙනුම් පල**

1. සමාජ පර්යේෂණ සඳහා මූලාශ්‍ර යොදා ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි.
2. ලිඛිත අලිඛිත මූලාශ්‍ර භාවිත කරමින් පර්යේෂණ කරන අයුරු පැහැදිලි කරයි.
3. දත්ත රැස් කිරීමට යොදා ගන්නා ක්‍රමවල වැදගත්කම පිළිබඳ මනා අවබෝධයකින් යුතුව අදහස් දක්වයි.
4. දත්ත රැස් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු හඳුන්වයි.
5. දත්ත රැස් කිරීමේ ක්‍රියාවලියේ ඇති වාසි සහ අවාසි පැහැදිලි කරයි.
6. දත්ත රැස් කිරීමේ දී ඇති විය හැකි ගැටලු සහ අභියෝගවලට සාර්ථකව මුහුණ දෙන අයුරු පැහැදිලි කරයි.

**හැඳින්වීම -**

පර්යේෂණයක දී රැස් කර ගනු ලබන දත්ත ප්‍රාථමික හා ද්විතීයික යනුවෙන් කොටස් දෙකකට බෙදනු ලැබේ. මේ අතුරින් ද්විතීයික දත්ත රැස් කිරීම සඳහා පදනම් කරගනු ලබන්නේ විවිධ මූලාශ්‍ර ය. පොත් පත්, පර්යේෂණ වාර්තා, පරිපාලන වාර්තා, අන්තර් ජාලය වැනි දෑ මූලාශ්‍ර ගණයට අයත් වේ. තෝරාගනු ලැබ ඇති විෂය ක්ෂේත්‍රයට අදළ මූලාශ්‍ර තෝරා ගැනීම ඉතා වැදගත් මෙන්ම භාරදූර කාර්යයක් වේ. මන් ද ක්ෂේත්‍රයෙන් රැස් කර ගනු ලබන ප්‍රාථමික දත්තවලින් කියැවෙන විෂය කරුණු තව දුරටත් ශක්තිමත් කිරීමට තරම් ද්විතීයික දත්ත ප්‍රබල විය යුතු හෙයිනි.

මීට අමතරව පර්යේෂණයක් සඳහා මුල පුරන පර්යේෂකයෙකු හට අදළ විෂය පථය පිළිබඳ වඩාත් පුළුල් අවබෝධයක් ලබා ගැනීම ඉතාමත් වැදගත් වේ. ඒ සඳහා අවකාශය සලසා දෙනු ලබන්නේ ද පරිශීලනය කරනු ලබන මෙකී මූලාශ්‍ර මගින් ය. තව ද වඩාත් සාර්ථක ප්‍රශ්න මාලාවක් සකස් කර ගැනීම සඳහා ද අත්වැලක් වන්නේ ඒ හා සම්බන්ධ මූලාශ්‍ර ය. දත්ත රැස් කිරීම යනු මූලාශ්‍ර

භාවිතයෙන් හෝ දත්ත දයකයන්ගෙන් තොරතුරු ලබා ගැනීම යි. විශේෂයෙන් ම ක්ෂේත්‍රයට ගොස් දත්ත දයකයන්ගෙන් දත්ත රැස්කර ගැනීමේ දී අධ්‍යයනය කෙරෙන විෂය කරුණට සාපේක්ෂව භාවිත කරන ක්‍රම වෙනස් කිරීමට සිදුවේ. සහභාගී නිරීක්ෂණය ප්‍රශ්න මාලා, සම්මුඛ සාකච්ඡා ආදී වශයෙනි. ක්ෂේත්‍රය තෝරා ගැනීමේ දී හා නියැදිය තෝරා ගැනීමේ දී ද සැලකිල්ලට ගත යුතු විශේෂ නිර්ණායක ඇත. යෝග්‍ය ක්ෂේත්‍රයක් තෝරා ගත යුතු ය. සමාජයේ සියලු විෂමතා නියෝජනය වන ආකාරයට නියැදිය තෝරා ගත යුතු ය. තොරතුරු ලබා ගැනීම ආරම්භ කිරීමට පෙර දත්ත දයකයා තුළ තොරතුරු රැස් කරන්නා පිළිබඳ විශ්වාසයක් ගොඩ නගන්නට විනාඩි කිහිපයක් කැප කළ යුතු ය. මන්ද දත්ත දයකයාට ආගන්තුකයෙකු වන පර්යේෂකයා පිළිබඳ ඇති කරනු ලබන පැහැදීමට අනුව දත්ත දායකයා විසින් හෙළි කරනු ලබන තොරතුරුවල සත්‍ය හෝ අසත්‍යතාව තීරණය වන හෙයිනි.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- ප්‍රදර්ශන ක්‍රමය
- ඉදිරිපත් කිරීම්

**ආකල්ප හා ඇගයුම්**

1. නිවැරදි මූලාශ්‍ර තෝරා ගැනීමේ වැදගත්කම වටහා ගනි.
2. පර්යේෂණයක දී භාවිතා කළ යුතු මූලාශ්‍ර වල වැදගත්කම අගයයි.
3. දත්ත රැස් කිරීමේ දී යොදා ගත යුතු විධික්‍රම පිළිබඳ සැලකිලිමත් වෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්, ලිපි ද්‍රව්‍යය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- සමාජ පර්යේෂණ සඳහා මූලාශ්‍ර භාවිතය පිළිබඳ දැනුම අවදි කරන්න.
- මූලාශ්‍ර භාවිතයේ වැදගත්කම පෙන්වා දෙන්න
- දත්ත රැස් කිරීමේ දී විශේෂයෙන් සැලකිය යුතු කරුණු පිළිබඳ සිසුන් දැනුවත් කරන්න
- දත්ත රැස් කිරීමේ දී සහයෝගීතා වර්ධනයේ ඇති වැදගත්කම පහදන්න

- රැස් කර ගන්නා දත්තවල නිරවද්‍යතාව වැදගත්වන ආකාරය පහදන්න

- පර්යේෂණයක් සාර්ථක වීම සඳහා තොරතුරු ලබා ගැනීම සහ තොරතුරු විශ්ලේෂණය කර පිළිවෙළකට සකසා ගන්නා අයුරු අවබෝධ කරවන්න

- විවිධ විධි ක්‍රම මගින් දත්ත රැස්කර ගත හැකි අයුරු උදාහරණ සහිතව පැහැදිලි කරන්න

- ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා අවට සමාජය පිළිබඳ අවබෝධය වැදගත් වෙන අයුරු පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරී සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| මූලාශ්‍ර පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න. | සාකච්ඡා ක්‍රමය |
| ලිඛිත මූලාශ්‍ර භාවිත කරමින් පර්යේෂණයක් කරන අයුරු සිසුන් සමග සාකච්ඡා කරන්න. | ඉදිරිපත් කිරීම |
| තොරතුරු ගවේෂණයේ දී සැලකිය යුතු කරුණු පිළිබඳව ප්‍රායෝගික ක්‍රියාකාරමක යොද වන්න. | කණ්ඩායම් හෝ කේවල ක්‍රමය |
| තොරතුරු ගවේෂණයේ දී භාවිත කරන උපක්‍රම පිළිබඳව සිසුන්ගෙන් විමසන්න. | ප්‍රශ්නකරනය |
| සාර්ථක ජීවිතයක් සඳහා සමාජය පිළිබඳ නිවැරදි හැඳෑරීමක වැදගත්කම ප්‍රකාශ කරන්නට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. | ඉදිරිපත් කිරීම |


**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- පර්යේෂණයක දී මූලාශ්‍ර වැදගත් වන්නේ මන්දැයි පැහැදිලි කිරීම.

- දත්ත රැස් කිරීමේ දී වඩාත් සැලකිල්ලට ගත යුතු නිර්ණායක දෙකක් විස්තර කිරීම.

- දත්ත රැස් කිරීමෙ දී දෙපාර්ශවය අතර වර්ධනය කරගත යුතු සහයෝගීතාව පැහැදිලි කිරීම.

- "ඉගෙන ගැනීම යනු සැලසුම්කරණයයි" බිත්ති පුවත්පතකට ලිපියක් ලිවීම.


දත්ත රැස්කිරීමේ ශිල්පක්‍රම
ද්විතියික දත්ත
ප්‍රාථමික දත්ත
ලිපි ලේඛන හා ග්‍රන්ථ
මුද්‍රිත
මුද්‍රිත නොවන
ආයතනික
පර්යේෂණ වාර්තා
පෞද්ගලික දිනපොත්
ප්‍රශ්නාවලි
සම්මුඛ සාකච්ඡා
නිරීක්ෂණ
සාමූහික
තැපැල් මාර්ග
සහභාගී නිරීක්ෂණ
සහභාගී නොවන නිරීක්ෂණ
ව්‍යුහගත
අර්ධ ව්‍යුහගත
ව්‍යුහගත නොවන

**නිපුණතාව -** සමාජය විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම සඳහා වන ක්‍රම වේදය හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම-** 7.4

අවට සමාජය පිළිබඳ සරල පර්යේෂණයක් කර වාර්තාවක් ඉදිරිපත් කරයි

**කාලච්ඡේද සංඛ්‍යාව 04**

**ඉගෙනුම් පල**

1. තොරතුරු රැස් කරන අයුරු අවබෝධයෙන් ප්‍රකාශ කරයි.
2. රැස් කරගත් තොරතුරු පිළිවෙළකට පෙළ ගසා ගන්නා අයුරු පැහැදිලි කරයි.
3. සරල නිබන්ධනයක් සකස් කරණ අයුරු ප්‍රකාශ කරයි.
4. ගැටලු අධ්‍යයනය කිරීමෙහි වැදගත්කම පැහැදිලි කරයි.

**හැඳින්වීම -**

19 වන සියවස වන විට යුරෝපයේ සංකීර්ණ කාර්මික ජනපද ආශ්‍රිත නාගරීක සමාජවල විවිධාකාරයේ බැරෑරුම් ගැටලු රැසක් උද්ගතව තිබිණි. මෙම ගැටලුවලට තුඩු දෙන ලද හේතු සාධක තේරුම් නොගෙන ඒවා නිරාකරණය කළ නොහැකි විය. එකී වගකීම භාර ගන්නා ලද්දේ විද්‍යාවන් අතර ළාබාලම විෂය වූ සමාජ විද්‍යාවයි. එමිල් ඩුර්කම්ගේ සියදිවි නසා ගැනීම පිළිබඳ පර්යේෂණය මේ සඳහා කදිම නිදසුනකි.

පර්යේෂණයක් සඳහා ප්‍රවිශ්ට වීමට නම් ගැටලුවක් තිබිය යුතු වේ. අනතුරුව ඒ සඳහා වඩාත් යෝග්‍ය ක්ෂේත්‍රයක් තෝරා ගත යුතු ය. එයින් අනතුරුව දත්ත රැස් කර ගන්නා ආකාරය සැලසුම් කළ යුතු ය. ඒ අනුව තෝරා ගත් ක්ෂේත්‍රය සමබරව නියෝජනය වන ආකාරයට ප්‍රමාණවත් නියැදියක් තෝරා ගත යුතු ය. ඊළඟ පියවර යටතේ දත්ත රැස් කිරීම සඳහා වඩාත් සුදුසු විධික්‍රම එකක් හෝ කිහිපයක් තෝරා ගත යුතු ය.

ඉන් අනතුරුව තොරතුරු රැස් කිරීම ආරම්භ කරනු ලැබේ. මෙලෙස රැස්කර ගනු ලබන තොරතුරු හෙවත් දත්ත පොදු හැඩයකට යළි සකසා ගත යුතු ය. සියයට ගණන් සාමාන්‍ය ගණන් වැනි හැඩයකට ගෙන ඒම නිදසුන් ලෙස දැක්විය හැකි ය. පර්යේෂණයේ අවසන් අදියර වන්නේ එකී දත්ත පදනම් කොට ගෙන වාර්තාව ලිවීමයි. එය පහත දැක්වෙන ආකාරයට පෙළගැස්විය හැකි ය.

| | |
|---|---|
| 1 පරිච්ඡේදය | හැඳින්වීම (මාතෘකාව, ක්ෂේත්‍රය, ක්‍රමවේදය ගැන) |
| 2 පරිච්ඡේදය | න්‍යායාත්මක රාමුව (මූලාශ්‍ර භාවිතයෙන් අදාළ කර ගත්) |
| 3 පරිච්ඡේදය | දත්ත විශ්ලේෂණය (පර්යේෂණයේ දී රැස්කර ගත්) |
| 4 පරිච්ඡේදය | නිගමන හා යෝජනා |
| | (ආශ්‍රිත පොත් හා අනෙකුත් ලේඛන) |

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය**

- සාකච්ඡා ක්‍රමය
- කණ්ඩායම් ක්‍රමය
- ඉදිරිපත් කිරීම්

**ආකල්ප හා ඇගයුම්**

1. පර්යේෂණ වාර්තාවක් ලිවීම දක්වා පියවරෙන් පියවර අනුගමනය කළ යුතු කාර්යයන්හි වැදගත්කම පෙන්වා දීම.

**ගුණාත්මක යෙදවුම්**

- පෑන්, පැන්සල්, ලිපි ද්‍රව්‍යය

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්**

- නිබන්ධනයක් සැකසීමේ දී අනුගමනය කළ යුතු පියවර පැහැදිලි කර දෙන්න.
- තොරතුරු එක් රැස් කරගත යුතු පිළිවෙළ සාකච්ඡා කරන්න.
- නිබන්ධනය ලිවීමට සුදුසු පරිදි දත්ත සකස් කර ගන්නා ආකාරය පැහැදිලි කර දෙන්න.
- ආශ්‍රිත ග්‍රන්ථ ඇතුලත් කිරීමේ අකාරාදි පිළිවෙළ අනුගමනය කරන අයුරු පෙන්වා දෙන්න.
- නිබන්ධනයක් සකස් කිරීමේ ඇති වාසි පැහැදිලි කර දෙන්න.

**ක්‍රියාකාරකම් සැලැස්ම**

| ක්‍රියාකාරකම | ක්‍රමවේදය |
|---|---|
| නිබන්ධනයක පියවර පැහැදිලි කරමින් පාඩමට පිවිසෙන්න. | දේශන , සාකච්ඡා ක්‍රමය |
| පර්යේෂණ නිබන්ධනයක් යනු කුමක් ද? යන්න පැහැදිලි කරන්න. | දේශන ක්‍රමය |
| පර්යේෂණයක ප්‍රධාන පියවර දැනගැනීමට සිසුන්ට අවසථාව දෙන්න. | ඉදිරිපත් කිරීම |
| දත්ත රැස්කිරීමේ දී අයුගමනය කළ යුතු මූලික කරුණු විමසන්න. | ප්‍රශ්න කරන්න |
| කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇසුරින් සරල පර්යේෂණයක් කිරිමට මග පෙන්වන්න. | කණ්ඩායම් ක්‍රමය |

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා නිර්ණායක**

- පර්යේෂණයක ප්‍රධාන පියවර නම් කිරීම.
- දත්ත රැස් කිරීමේ දී සැලකිළිමත් විය යුතු මූලික කරුණු හැඳින්වීම.
- කැමති මාතෘකාවක් තෝරාගෙන සරල පර්යේෂණයක් කර වාර්තාවක් ලිවීම. (කණ්ඩායම් වශයෙන්)